දෙවනුව පරිසර දූෂනයෙහි වත්‍ර ආකාර මෙන්ම විෂම ජාතියද වේ. එහෙයින්, කාරක මූලික කුතුහල නිවැරදි චරිතාකථක් නැත.

තුන්වෙනුව පරිසර දූෂිත චරිතාකමට එරෙහිව සිදු කරන නාක්ෂන ව්‍යාපෘති ඔහිත්ද, නිරූපනය වන්නේ කාරක චරිතාකථිවය. මේ නාක්ෂණය යම්ස්ථායක් ලෙස පරිසරයට එකතුද නැද්ද යන්න තීරණය කරන්නේද වෙළඳපොලය.

සිව්වෙනුව පරිසර දූෂනය යම්ස්ථායක් ලෙස වුවත් මැනිය හැකි මෙන්ම ඵැනිය නොහැකි සංස්කෘතික චරිතාකමක්ද යුතුවේ. පරිසරය රැකගැනීමේ සංස්කෘතික හික්මීම සංස්කෘතිය තුලම පිස වෙළඳපොල තුල අර්ථ දිය ගැකි නො වේ.

පස් වෙනුව බාහිර බලපෑමක් මත භාණ්ඩයකට පරිසර දූෂන අගයක් එක්කලහොත් එය ඒ විල ගණුම්වලටම අතිරික්තයේ පිළිගැනීමක් සිදු වුවහොත්, සැබෑ ලෙසම වෙළඳපොල තුල පරිසර චරිතාකම නොපවතින හෙයින් එයින් සිදුවන පරිසර හානිය වැඩි දියුණු වනු ඇත.

හයවෙනුට වෙළඳපොල තුල නියමවන චරිතාකම් ආයෝජනය නොවුනහොත් සිඹුයෙන් පිරිහී යන හෙයින් පරිසර චරිතාකමද එලෙස පිරිහී යනු ඇත. පරිසරය එවැනි දෙයක්ද?

මෙයින් පෙනී යන්නේ පරිසර දූෂනයට ඵිල කෙරුම වෙළඳපොලට නොහැකි බවත්, එසේ බලයෙන සිදුකලහොත් එයින් වඩාත් අහිතකර ප්‍රතිඵල ලැබිය හැකි බවත්ය.

එහෙයින්, වෙළඳපොල බිඳලීම හැරෙන්නට වෙන මඟක් ඉහිරිව නැත.

නව නාක්ෂණයකට අපිව පරිවර්තන මේ තරම් ටේහයෙන් කියියේවී කල නොහැකිවනු ඇත. එවැනි නාක්ෂණයක් ඇත්තේ නිෂ්පාදන වත්‍රයේ යම්ස්ථාය තුල පමනි.

අනුපාලිත යංවර්ධනය යනුද කාරක චර්ධනය ඇත ගිටිනා සම්ස්ථා චර්ධනය පවතින යංවර්ධනයකි. ලාභ සම්‍යතා වය තුල අභිප්‍රාය නොවේ. එහෙයින්, අනුපාලිත යංවර්ධනයක් බිහිකර ගත හැක්කේ ධනවාදය බිඳලීමෙන් පමණකි.

-මාක්ස්වාදී ආර්ථික විද්‍යාව -

මාක්ස්වාදය ප්‍රධාන වශයෙන්ම දේශපාලන ආර්ථික විද්‍යාවකි. මාක්ස් සිය දයලෙක්තික භෞතික වාදය උපකරණයක් ලෙස යොදා ගනිමින් දේශපාලන ආර්ථික විද්‍යාවක් ගොඩ නැගුයේය. එහිම විවිධ වාන පුරනයන් මෙන්ම නවීනකරණයන්ද ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කලේය. එහෙයින්, මෙහිදී මාක්ස්වාදය ලෙස හඳුන්වන්නේ මාක්ස් හා ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මානය කරන ලද දේශපාලන ආර්ථික විද්‍යා ආකෘතියය. ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධනය කෘතිවෙළුම් තුනද, සම්භාවදහමේ ඒවිඩ්ධනය, සම්භව්‍ය ජර්මන් දර්ශනවාදීන්ට (පෙයර්බාග් හිංස යළිහ) පිළිතුරු, ශුද්ධවූ පවුල, ජුවින් විරෝධය, දර්ශනයෙ දුගි බව ඇතුළු මනෝරාපික යම්ස්ථාදීන්ට දුන් පිලිතුරුද, කොම්යුනිස්ට් ප්‍රකාශනයද මෙහිලා යොදා ගැනේ. එනම්, මේ කෘති වලින් දැක්වෙන දේශපාලන ආර්ථික විද්‍යා ආකෘතිය සංක්ෂිප්තව හදාරනු ඇත.

මාක්ස් ධනවාදයේ විවේචකයා ලෙස:

මාක්ස් හා එංගල්ස් යම් යම් සංකල්ප දුටු අයුරු සංක්ෂිප්තව මෙසේ දක්වමු.

-පරිසරය -

"පරිසරය හා මානවයා අතර ඇත්තේ දයලෙක්තික සම්බන්ධයකි. මානවයා විසින් පරිසරය අභිබවා කරන ජයග්‍රහන සීමිතයි. එක් ජයග්‍රහනයක වෙනත් පරිසර විනාශකාරී ප්‍රතිවිපාක දැනෙනු ඇති අතර එය ඊලඟ ජයග්‍රහණය යදහා මානවයාව උපස්ථම්භක වේ. මෙලෙස අසීමිතයි වුවද - මානවයා පරිසරය සමඟ ඒකාත්මතාවයට අවසානයේ එළැඹේ. එනම්; ඔහු එහි අධිපතියා, සහ දෙවියා වෙයි. එසේ වන්නේ ඔහු ආනුවංශිකයෙකු ලෙස නොව පරිසරයේ ස්වභාව නියමයන් ආනුභවික අත්දැකීම් මගින් පසක් කරගත් සවිඥානික බලවේගයක් ලෙසය. මේ ඵලිත අරගලය සෑම සටහන් ක්‍රමයකම ප්‍රධාන ක්‍රියාවලියය."

චිත්තෘකල්ප:

"මානව නිර්මාතෘන්ගේ චිත්තෘකල්ප සංකීර්ණ දෙයකි. එය එක් එක් සංස්කෘතියට සාපේක්ෂ දෙයකි. එමෙන්ම, මානව නිර්මාතෘවල පදනම වූ පරිසරයවදෑ, එයටම වූ චිත්තෘකල්ප පැවතිය හැක. එහෙත්, අප උනන්දු වන්නේ මානව යථාර්ථයෙහි චිත්තෘකල්පයෙහි නිරපේක්ෂ හෞතික පදනම් කුමක්ද යන්නයි. මානව යථාර්ථයේ සෑම නිර්මාතෘතයෙකුම චිත්තෘකල්ප ලබන්නේ ශ්‍රමය විසිනි. මානව ඉතිහාසයේදී ස්නායුගේ ආර්ථික ක්‍රියාවලිය මෙන්ම යම් ආකෘතික ක්‍රියාවලිය යථාර්ථ යථාවර්ධනය මෙන්ම පීව පරිණාමයට ඵලික වූ පොදුවූ මානව හෞතික පදනම වූ කල් ශ්‍රමයයි. මෙලෙසින් පරියරයේ වූ නිසා චිත්තෘකල්ප පවා මානව් යථාර්ථයට චිත්තෘකල්ප වන්නේ අධිංගු කලපුතු ශ්‍රමය විසිනි. "

නිර්මාදනය හා හුවමාරුව හා වෙළඳපොල:

"සෑම නිර්මාදනයක්ම හුවමාරුවක් නොවන විත්, සෑම හුවමාරුවක්ම නිර්මාදනයක් වේ. මානව යථාර්ථයේදී චිත්තෘකල්ප (ධනවාදයේදී) ලබන්නේ හුවමාරුව පමනකි.

වෙළඳපොල කෙසේ ඉල්ලුම හා සැපයුම එක සමතුලනය වූ හුවමාරු ජාලයක් නැත. ධනවාදය තුල ඉල්ලුම හා සැපයුම කෙයේවත් සමතුලනය නොවේ. එයට ප්‍රතිපක්ෂව එය එහි විපර්යාදය වේ. (සැපයුම් ඉල්ලුමට වඩා වැඩිවේ.) එමෙන්ම, අසන්තුලික වේ: (වෙළඳ අර්බුද)

මෙයට ප්‍රතිපක්ෂව ධනවාදය තුල සිදුවන්නේ නිර්මාදනය සමාජගරනය වීමය. ඒ සඳහා වූ හුවමාරුව සඳහා වූ සංයුක්තකරණයක් බිහිවීමය. ධනවාදය විසින් ඓතිහාසිකව සිදු කරන සමාජකරනය මෙයය. එනයින් චිත්තෘකල්පයේ පදනම වූ ශ්‍රමයද සමාජකරනය වේ....."

හාණ්ඩ හුවමාරුව පිළිබඳ නිගිය – චිත්තෘකල්ප කෘතය:

"හාණ්ඩයකට ඒවයංව චිත්තෘකල්ප දෙකක් ඇත. එකක් එහි ප්‍රයෝජ්‍ය චිත්තෘකල්පය. එනම්, හාණ්ඩය සෑදු මිල හා ද්‍රව්‍යමය සංයුතිය සතු චිත්තෘකල්පය. දෙවැන්න එහි හුවමාරු චිත්තෘකල්පය. එනම්, හාණ්ඩය තුල අන්තර්ගතවී ඇති සමාජශ්‍රම කාලයයි. එමෙන්ම, නිර්මාදන ක්‍රියාවලියේදී හාණ්ඩයකට හුවමාරු අගයක් දෙකක් පැවතිය හැක. එකක් එහි නිරපේක්ෂ අගයයි. දෙවැන්න එය වෙනත් හාණ්ඩයකට දක්වන සාපේක්ෂ අගයයි. හුවමාරුවේදී මේ අගයන් දෙකම පෙරළා නිරූපනය වන්නේ සමාජ ශ්‍රමය විසිනි.

ධනවාදය තුල හුවමාරුව සිදුවන්නේ ඉල්ලුම් සැපයුම් සමතුලිතභාවයකින් නොව සමාජශ්‍රම කාලයන්ගේ සමවිභිජනාව විසිනි. පුදළි යනු (ශ්‍රමය යොදා නිස්සාරනය කලයුතු රත්රන් මෙහිදී යොදා ගන්න) මේ හුවමාරු චිත්තෘකල්ප නිරූපනය කරන මාධ්‍යයක් පමණි.

මෙතිහාසිකව හාණ්ඩ වලට මානව චිත්තෘකල්ප ලබාදුන් සරල ශ්‍රම කාලයෙන් ධනවාදය තුල හාණ්ඩ විනිය නොහැක. යන්ත්‍ර දියුණුව විසින් නිර්මාදනය – හුවමාරුව සමාජකරණයවී ඇති නියය. ඒ නියා විත්තීරීනවූ යම්තාක් ශ්‍රම අධිංගුව හුවමාරු චිත්තෘකල්පයේ පදනම වේ. ඊ අනුව සියළු හුවමාරු ගැනියාවන් වූ හාණ්ඩ හා සේවාවල පදනම මානව සමාජ ශ්‍රමය වේ.

අතිරික්ත චිත්තෘකල්ප – සුරාගැනීම:

"කිසියම් හාණ්ඩයක්, කිසියම් මූල්‍යමය චිත්තෘකල්පයකට විකිණෙන හැකියැයි කිතුවිට එහි හාණ්ඩය අධිංගු කර ගන්නා සමාජශ්‍රමකාලයේ සාපේක්ෂ මූල්‍ය චිත්තෘකල්ප ලැබේ. එහෙත්, ධනපතියා එය අලෙවි කරන්නේ ලාභයක් තබාගෙනය. එහි පේරුම ශ්‍රමිකයාගේ ශ්‍රමයට් සමාජය තුල ලැබිය යුතු චිත්තෘකල්ප ලබාදී නැති බවය. එහෙයින්, ශ්‍රමිකයාගේ වැඩකාලය ආකාර දෙකකින් යුතුවේ. එහු එක් කාලයකදී යිය යැපිම් සඳහා වූ කොටස නිර්මාතෘ කරයි. දෙවන කොටසේදී ඔහු ධනපතියාගේ "ලාභය" නිර්මාතෘ කරයි. මෙය අතිරික්ත ශ්‍රමකාලය ටන අතර එය ශ්‍රමිකයා – කම්කරුවා – සුරාගනු ලබන ආකාරය වේ.

මේ කරුණු කිහිපය පිළිබඳ ගරිත ආර්ථික විද්‍යා දර්ශනයට අනුව සලකා බලමු.

පරිසරය පිළිබඳ මාක්ස් - ඒංගල්ස් ප්‍රධාදය පරිසරය හා මානවයා අතර සම්බන්ධය දක්නේ අතිශය වියුත්ත ලෙසය. එය දයලෙක්තික ගෞතිකවාදයේ විසංවාදයක්වූ දෙපක්ෂ පැවැත්ම පිළිගත්තද එකක් ප්‍රාථමික වේ. (එය ඒකාත්මය වේ.) යන්න මත පදනම්වී ඇත. එනයින් මානවයා-පරිසරය තුල අධිපතියා වීම ලෙස පිළිගැනීම තුලින් අර්බුද දෙකක් ජනිත කරවයි. පළමුව එය පරිසරයේ මානව නොවන සාධක සතු සුවිශේෂත්වය අවතක්සේරු කරයි. දෙවනුව එය භෞතිකවාදයට (මානව නොවන සාධක) පටහැ පටහැනිව මානවයාගේ දැනුම (මානසික ආකෘති) මත ප්‍රාථමික විශ්වාසය තබයි. පරිසරය හා මානවයා පිළිබඳ එවකට පැවතුණු දෘෂ්ටියක් මාක්ස්ට හා එංගල්ස්ට තිබුනුවුත් එයට පැවතුණු සංවර්ධන යාන්ත්‍රණයෙන් ඒකාබද්ධ ගැලවිය නොහැකි වූ බව පෙනේ.

මෙසේම, මානවයා හා මානව නොවන සාධක අතර පවතින්නේ ඒලික චලයෙන් ගැටුම්කාරී නොවන ප්‍රතිබද්ධතාය සම්බන්ධයකි. ධනවාදී සංවර්ධන යාන්ත්‍රණය එය ප්‍රතිවිරෝධී අරගලයක් බවට සෑම අවස්ථාවකදීම පත් කළේය. එසේනේ, මානව නොවන සාධක විසින් මානවයාට එරෙහිව බලවේග ප්‍රති ක්‍රියාවන් ජනිත කළේය. මාක්ස්වාදයද මේ ධ්‍රැවනය දුටුවුත් එය-මිනිසා විසඳාගනු ඇතැයි විශ්වාස කළේය. එහෙත්, එය විසඳා ගත හැක්කේ ගරිත ආර්ථික විද්‍යාවට අනුව ධනවාදය පෙරලා දැමීමෙන් පමණි.

එසේ කල හැකි වන්නේද මානවයාගේ ආධිපත්‍යය පිළිගැනීමෙන් නොව පරිසර ප්‍රතිබද්ධතාය සඟපීවන සුවිශේෂිත්වය දැකීමෙනි.

තව දුරටත් මාක්ස් මානවයාගේ පරිසරය සමඟ වූ අරගලය සමාජ්‍යතුව වල පදනම ලෙසද ගත්තේය. එනයින් ද්‍රව්‍යගුණික ලෙස අතුරු අරගලය (මානව සමාජය තුල පන්ති අරගලය) තිබුවද එන්නේද ඒලික අරගලය නියාය. වෙනත් වචන වලින් ධනවාදය බිඳ වැටෙන්නේ එයට පරිසරය සමඟ නිෂ්පාදනය යැදහා වන මානව අරගලය පෙරට ගෙනයා නොහැකි හෙයිනි. මාක්ස්ගේ සමාජවාදයේ පදනම එයයි.

මෙයට ප්‍රතිපක්ෂව පරිසරය සමඟ යිදු කරන විනාශකාරී අරගලය අවසන් කරලීම සඳහාය. ධනවාදය බිඳ වැටෙන්නේත් - නව සමාජවාදයේ ගරිත සමාජවාදයේ පදනම වන්නේත්.

දෙවනුව වටිනාකම පිළිබඳ ප්‍රශ්නය ගනිමු.

මාක්ස් - ඒංගල්ස් ධනවාදය තුල නිෂ්පාදනය ගුවමාරුව වන බව ප්‍රකාශ කලවුත් ගුවමාරුව වටිනාකම් ලබන බව ප්‍රකාශ කලවුත් ගුවමාරුව වටිනාකම් ලැබීමේ ප්‍රාථමික උත්තනතාව ප්‍රශ්න නොකලහ. ගරිත ආර්ථික විද්‍යාව ප්‍රශ්න කරන්නේ එයයි. පෙරලා මාක්ස්-ඒංගල්ස් උනන්දු වන්නේ ගුවමාරුවේ නියම (භෞතික පදනම) සොයා ගැනීම පිණිසය.

ගෙවන්නේ මානවයාට පමණක් හෙයින් ශ්‍රමය ගුවමාරුවේ පදනම ලෙස ඩේවිඩ් රිකාර්ඩෝ පල කළේය. මෙයින් ලාභය ඉපදෙන හැටි රොබට් ඔවේන් පෙන්වා දුන්හ. මාක්ස් මෙය අතිශයින් ගුරුළු පරාසයකට ගෙන ගියේය.

ගෙවීමට ඇත්තේ මානවයාට බව සත්‍යවුත් හැඟීමක වටිනාකම එය නොවන බවත්, එයට පිනිය හැකි පිනිය යුතු භාවිත අගයක් හා පරිවර්තන අගයක් තිබිය යුතු බවත් ගරිත ආර්ථික විද්‍යාවේ පදනමය.

'ශ්‍රමය' වටිනාකම නියමකරලීම සඳහා යෙදවුනු අතිශය වටිනා මානවීය පිහුවි දන්ඩකි. එහෙත්, ශ්‍රමය ධනවාදිය තුලදී තව දුරටත් සාමාන්‍ය ශ්‍රමය නොවීය. එය යුපු ශ්‍රමය, සක්‍රිය සහිත ශ්‍රමය, උගත් ශ්‍රමය, බුද්ධිමය ශ්‍රමය, ලෙස ආකාර ගණනාවකින් යුතුවේ. 'පරිසර ගහිකත්වයේ වාලකය ලෙස ශ්‍රමයට ධනවාදී නොවන සමාජ වලදී විශාල අගයක් පැවතුන නමුදු ධනවාදය එය වෙනස් කළේය. එනම්, පුනර්වමය කල නොහැකි බලශක්තිය වියින් ශ්‍රමය ආදේශ කරන ලදී. පෙරලා පරිසර ගහිකත්වයේ මානව වාලකය ලෙස ප්‍රධාන වුයේ බලශක්තියයි. - පොසිල ඉන්ධනය.

මාක්ස් මේ සංක්‍රීණ තත්ත්වය පියවන් කරලීමට යොදා ගත්තේ විසතිරින ශ්‍රමය හෙවත් සමාජමය වූ ශ්‍රම කාලය විසිනි.

එහෙත්, කරුණු දෙකක් වියින් සමාජශ්‍රම ආකෘතිය ධනවාදී සංස්කෘතිය තුලවත් වලංගු නොවේ.

පළවුට බලශක්තියත් ලෙස පුනර්වමය කල නොහැකි පොසිල ඉන්ධන හරහා ගොඩ නැගෙන අතිරික්තය - ග්‍රහයට උපතය කල හොඳකි විශේෂයකි.

දෙවනුව සමාජකරනය නොවූ ග්‍රහයට හුවමාරුව තුලම හිමිවන්නේ අව වටිනාකමකි. පිටත ලෝකයෙ ග්‍රහය යුරාකෘත වැඩි අංගයක් වී ඇතත්ද යෙයමය.

මේ අනුව වටිනාකම් සඳහා මාක්ස් පවත්ගත්තේ මෙතැනිනි. එනම්, ධනවාදී නිෂ්පාදනය විසින් ගොඨගයනා ශාඛාව හා යෙහා මතිවන් පරපුරට අයත්වය. එමගින් මාක්ස් ධනවාදී යාන්ත්‍රණය විසින් එයනිකරනා අනාගත පරපුර සුරාකෑම ඔලෙයින්ම එයත් කරයි. අසීමිත සම්පත් හා බලශක්තිය සහිත ලෝකයක නම් මාක්ස්ගේ සමාජවාදය අවශ්‍යතිය ධනවාදයට වලංගු විය හැකිව තිබුන. එසේ නොවනා ලොවකදී එය ධනවාදයේ භයංකර සුරාකෑමේ ස්වරූපයක් ලබත් කරයි.

හරිත ආර්ථික විද්‍යාව සම්පත් හිඟය - පරිසර දූෂනය - පිට විධිඵලය අගෝසි වීම, මානව පිට පැවැත්ම සුරාකෑම යන සමයට ධනවාදී අර්බුදයම වටිනාකම තුල දකි.

මාක්ස් සිටි යුගය එක අතකින් තම දේශයන් මෙන්ම පිටත දැඩුදිග ලෝකයද කොල්ලකමින් අසීමිත සම්පත් ගොඨනඟාගත් යුගයක් විය. මේ යුගයේදී සම්පත් හිඟය, පරිසර දූෂනය පිළිබඳ ප්‍රශ්නය කලවුන්ට ධනවාදී සංස්කෘතිය පිළිතුරු දුන්නේ සම්පත් පරිසරය මානව දැනුමට යාපේක්ෂ බවය. ඒ අනුව නව යොජා ගැනීම් විසින් මෙම තාවකාලික ප්‍රශ්නය විසඳන බවය. මේ සුවිශාල සම්පත් මත හිඳගෙන (එනිගලන්ත ආර්ථිකය) මාක්ස් විසිබි සමාජ ග්‍රහය වටිනාකම් ලෙස ප්‍රකාශ කලේද, ධනවාදී යාන්ත්‍රණයෙන් වෙනස් වුවද, එයින් ප්‍රුව්ටනින් ගැලවිය නොහැකි ගෙයිනි.

හාණ්ඩවල ද්‍රව්‍යමය අගයන් සිතා වීරගිතව ගක්තිය විසින් පුනර්වමය හා පුනර් හාවිතය සඳහා යෙදවිය හැකි බවත්, අපද්‍රව්‍ය ආදිය ප්‍රයෝජනවත් දෑ වන බවත්, නව සම්පත් සොයා ගැනීම අනිවාර්ය බවත්, මේවා සියල්ල මානව දැනුමට යාපේක්ෂ බවුයි, (විද්‍යානවාදී I) මාක්ස්ද නිගමනය කලේය.

හුවමාරු වටිනාකම් සඳහා සමාජ ග්‍රමය පදනම වන්නේ (භෞතික පදනම්) ධනවාදය තුල පමනක්ද, මාක්ස් විසින් ප්‍රකාශ කල සමාජවාදය හා කොමියුනිස්ට් වාදය තුල හුවමාරුවේ භෞතික පදනම් තුමක්ද යන්නද ටිටයා බැලිය යුතුවේ.

ග්‍රමය මානව සංවර්ධනයේදී කල වෙනිගයික භාර්යයත්, ධනවාදයේදී එය සමාජකරණය වන බවත්, එගෙයින්, අතීතයේ හුවමාරුව සඳහා පාදකවූ යරුළ ග්‍රමය ධනවාදය තුල සමාජ ග්‍රමය වීම මාක්ස් -වාදයේ යාමානය අදහසය. මෙය සමාජවාදය තුලද, භෞතික වටිනාකම විය යුතු බව පසුව පැහැදිලි කරන ලදී. සැමට තමාගේ ග්‍රමය අනුව ගෙවීම සමාජවාදයේ හුවමාරු පමන් පාඨය විය. සැමීම තමාගේ අවශ්‍යතා අනුව ගෙවීම කොමියුනිස්ට්වාදයේ යටත් පාඨ විය.

මානවයාගේ භෞතික අවශ්‍යතා උද්දීපනය කලගොත්, අපරිමිත හෙයින් කොමියුනිස්ට්වාදී සමාජය භෞතිකමය ලෙස හරිත ආර්ථික විද්‍යාවට ඇතිවිය හැකි සමාජයක් ලෙස පිලිගත නොහැක.

සමාජවාදය තුලද පිහිය හැකි වටිනාකම් ලෙස සමාජග්‍රමය හාවිතා කළගොත්, ධනවාදී වෙළඳ -පොල අවංගුකරගත් දුර්වලතා දෙකම එය අවංගු කර ගනිතුවා ඇත. එනම්, සමාජකරණය නොවූ සෙසු මානව පරිසර පද්ධති වලට අගය අගෝසිවන ආකාර, පෙරලා වටිනාකම් බෙදෙයින්ම එහිමතට පවත්නා සිතාවිලි ඇත. මෙය යෝවියට් සමාජවාදය තුලද යතාවූ අර්බුදයකි.

අවසානයේ මාක්ස්වාදයේ සුරාකෑම හා හරිත ආර්ථික විද්‍යාවේ සුරාකෑම අතර බලවත් වෙනසක් ද පවතී. (භෞතිකමය) මාක්ස්වාදී සුරාකෑම යනු එහිමතෙහි පවතින සෑම හාණ්ඩ හා සේවාවකම වටිනාකම් සමාජග්‍රමය අනුව පුර්තව නොගෙවීම පිළිබඳවය. හරිත ආර්ථික විද්‍යාව එය පිට පැවැත්ම අගෝසිකරලීමකින් මතිනු ලැබේ. එහෙයින්, හරිත සුරාකෑම මාක්ස්වාදී සුරාකෑම අගෝසි වුවද පවතිනු ඇත. අනාගත පරපුර සුරාකෑම නම් වැය.

ප්‍රාග්ධනය හා ප්‍රාග්ධන චක්‍රය :

ප්‍රාග්ධනය පිළිබඳ මාක්ස්වාදී විග්‍රහය මෙසේය.

"යම්කිසියක ධනවාදී ආර්ථික විද්‍යාව නිෂ්පාදනයක් සඳහා ගෙවීම් හතරක් යෝජනා කරයි. ඉඩම (සියළුම සම්පත්) ප්‍රාග්ධනය හා ව්‍යවසායකයාද යටතේ ශ්‍රමය. ඒගෙන්, ඉඩම පිළිබඳ කුලියද, යන්ත්‍ර උපකරණ හා ව්‍යවසායදායකයාගේ ධුරාවලිය හැසියට යන මේවා තවදුරටත් බෙදිය හැක. නොබෙදිය හැකි දෙය ශ්‍රමය පමණිය. ඉහතින් සියළුම ගෙවීම් යුරාගනු ලැබූ වටිනාකමිය. එනම්, ප්‍රාග්ධනය යනු ශ්‍රමිකයාට නොගෙවීම් නියා ධනපතියා අත සංකේන්ද්‍රණය වූ අතිරික්ත වටිනාකම්ය.

මේ ප්‍රාග්ධනය ධනවාදය මූල ආකෘතිය වේ. සමාජ ශ්‍රමය භාවිතා කරමින් එය නිෂ්පාදනය හා ප්‍රචලනයට සිදු කරයි. ප්‍රාග්ධන චක්‍රයේ පළමු භාගය සැදුම්ලන්නේ නිෂ්පාදන ප්‍රාග්ධනයෙනි. නිෂ්පාදන ප්‍රාග්ධනය ආකාර දෙකකින් යුක්තය. එය ස්ථිරාංග ප්‍රාග්ධනය, එනම් සමාජ ශ්‍රමයෙන් (VARIABLE CAPITAL හා අචල ප්‍රාග්ධනය (CONSTANT CAPITAL) නොගොන් නිෂ්පාදක බලවේග යම්කිසි ප්‍රමාණයකි. අචල ප්‍රාග්ධනය පෙරළා ස්ථාවර ප්‍රාග්ධනය (FIXED CAPITAL). එනම් නිෂ්පාදන බලවේග (යන්ත්‍ර උපාංග - අධෝ ව්‍යුහය) වලින්ද, චලිත ප්‍රාග්ධනය (CIRCULATION CAPITAL) එනම්, නිෂ්පාදන ඝාතක (අපද්‍රව්‍ය - බලශක්තිය) වලින්ද සම්පාදිත වේ.

" අචල ප්‍රාග්ධනය අර්ථ දෙවන්නේ හා නිෂ්පාදනයේ යෙදවෙන්නේ ස්ථිරාංග ප්‍රාග්ධනය විසිනි.

නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන ඝාතක යන්ත්‍රවල ගෙවීම් හා බලශක්තියේ වැයවීම් හා අපද්‍රව්‍ය වල පරිවර්තනය විසින් භාණ්ඩයට ආරූඪ අගයක් දෙනු ලබන අතර එය චක්‍රනය වේ."

පෙරළා ශ්‍රමිකයාරූ වටිනාකම් සැකසෙන්නේ හා සැබෑ වටිනාකම ගෙවිය යුතු වන්නේ ස්ථිරාංග ප්‍රාග්ධනයට පමණි.

ප්‍රාග්ධන චක්‍රයේ දෙවන භාගය සැදුම්ලන්නේ භාණ්ඩ හා සේවා ප්‍රාග්ධනයෙනි.(COMMODITY CAPITAL) එවා අලෙවිය හා පරිභෝජනයද, ශ්‍රමිකයාරූ වටිනාකම්ද ලබනු ඇත.

" ධනවාදී නිෂ්පාදනයේ පළමු භාගය - නිෂ්පාදන ප්‍රාග්ධනය සමාජීකරණයට් ඇත. සමාජ ශ්‍රමය - නිෂ්පාදන බලවේග හා අපද්‍රව්‍ය, උකහා ගැනීම මෙනයින් සමාජීකරනයට් ඇත."

පෙරළා ධනවාදී නිෂ්පාදනයේ දෙවැනි භාගය සැදුම්ලන්නේ භාණ්ඩ හා සේවා ප්‍රාග්ධනයෙහි එවා අලෙවිය හා පරිභෝජනය පුද්ගලීකරනයට් ඇත.

ධනවාදී ප්‍රාග්ධනයේ අර්බුදය නම් සමාජීකරනය වන නිෂ්පාදන ප්‍රාග්ධනය (නිෂ්පාදන බලවේග) හා පුද්ගලීකරනය වන දේපොල අයිතිය හා පරිභෝජනය පිළිබඳ අසමතුලිතතාවයයි.

" ධනවාදය තුල පුරාණයේ මිලට නම් අතිරික්ත ශ්‍රම වටිනාකම් ස්ථිරාංග ප්‍රාග්ධනයට දරනා අනුපාතය (S/V) . එහෙත්, එහි සීඝ්‍රතිය ලාභයෙහි අනුපාතය වනුයේ අතිරික්ත වටිනාකමට නිෂ්පාදන ප්‍රාග්ධනය දරනා අනුපාතයය (S/c+v) "

" ප්‍රාග්ධන චක්‍රය උත්තේජනය කරන්නේ මේ ලාභය (S/c+v) උපරිම කරන්නටය. එහිදී එය කාර්මිකරණයද, කාර්මික පද්ධතියද, සියළුම පරිසර පද්ධතියද මධ්‍යාහ්නකර සිය ලාභ සීමා අනුව පවත්වා ගනී."

" ධනවාදය තුල නිෂ්පාදන බලවේග සමාජීකරණයට් ඇති වෙයින් එවායේ දියුණුව අභිවාර්යයෙන් සිදුවේ. එනම්, "අචල ප්‍රාග්ධනය අනවරතයෙන් වර්ධනය වේ."

" ධනවාදය තුල සීඝ්‍රයෙන් භාණ්ඩ හා සේවාවන් විවිධත්වයට හා වර්ධනයට ලක්වේ. පැරණි දෙය අලුත් දෙය විසින් සීඝ්‍රයෙන් ආදේශ වෙමින් ඇත."

" බැංකු තැපය ආ වාණිජ ආයතනය විසින් සිදු කරන පොදු අනුපාතයක් ගෙවීමද, සමාජ ශ්‍රමයේ නොගෙවන ලද වන්දියක්ම වන්නේය."

ධනවාදයේ අර්බුදය:

ඉතිහාසය පුරා මානව සමාජය දයලෙක්තික සබඳතා දෙකක ප්‍රතිඵලයක් විය. පළවුවේ හා ඵලදායී එය පරිසරය හා මානවයා අතර යිදුවූ අරගලයක් විය. පරිසරය ආධිපත්‍යය දැරීමේ මානව ප්‍රයාරම්භය නිරූපණය වන්නේ අතවරයෙන් වැඩිවන නිෂ්පාදන බලවේගවල දියුණුවෙනි. ප්‍රාථමික කොමියුනිස්ට් සමාජය සිදුවෙමින් පන්ති සහිත එහෙත් සමාජය විසිවූයේ නිෂ්පාදන බලවේග වල වර්ධනය සඳහා අභිරිත්තයක් අවශ්‍යවූ ගෙයිනි. මේ විශේෂ අභිරේක ක්‍රියාවලිය වනාහි, මානව සමාජය තුල පන්ති අතර අරගලය බිහි විය. පන්ති අතර යිදුවූ මේ අරගලයෙන් පැවති විටම ප්‍රධාන අරගලය පෙරට ගියේය.

එනම්, සමාජයේ පදනම වූ නිෂ්පාදනය හා නිෂ්පාදන සබඳතා ද අවසාන වශයෙන් නිෂ්පාදන බලවේගද විය මානව විඥානයේ හෝ සංස්කෘතියේ විලයක් වනවේ. එහෙයින් ධනවාදී සමාජය වැටවහට සමාජයෙන් බිඳිවූයේද, පෙරලා ධනවාදය බිඳට වෙන්නේද, මේ ප්‍රවුඛ ප්‍රධාන හේතුන් පිහාවෙනි. එනම්, නිෂ්පාදන බලවේග දියුණු කෙරීමය.

ධනවාදී දෙපල සබඳතා එක්තරා යුගයක්දී නිෂ්පාදන බලවේග දියුණුකරලීමේ ප්‍රගතිශීලී කාර්යභාරයක් ඉටුකළද, නමුත් යුගයක්දී එය නිෂ්පාදන බලවේගවල දියුණුවට ප්‍රතිගාමී ලෙස හරස් වේ. එතැනින් ධනවාදය අර්බුදයට යයි.

එනම්, නිෂ්පාදන ප්‍රාග්ධනය විසින් ජනිත කරන වටිනාකම් සියල්ල පරිභෝජනය නොගෙවන හෙයින්, පරිභෝජන ප්‍රාග්ධනය විලද් ගැනීමට හරවා ගැනීමක් සිදුවන්නේ නැත. එහෙයින් නිෂ්පාදනය වුවද, විලද් ගැනීමට නොගැයි හෙයින්, අධි නිෂ්පාදනය ඇතිවී ධනපති වෙළඳපොල බිඳවැටී නිෂ්පාදන බලවේග පවා විනාශ කෙරෙමට ධනපතියා පොළඹවයි. ඉල්ලුම් හා සැපයුම් අතර සමතුලිතයක් ධනවාදය තුල නොවැන.

මෙය සූත්‍රගතකරනය තුල පෙන්වන්නේ නම්, s/v යුරාකෑමේ අනුපාතිකය වර්ධනය වන වේගයෙන් $s/c+v$ ලාභ අනුපාතිකය වර්ධනය නොවේ. නිෂ්පාදන බලවේග ඇතුලත් වැටීමේ වැලැක්වීය නොහැකි හෙයින් ලාභ සීමාව සමස්ථයක් ලෙස අඩුවේ. ධනවාදයේ ලාභය පිළිබඳ නියාමය වශය. (එහෙත්, මෙය මෙලෙසෙම සිදු නොවීමට වෙනත් අතුරු කරුණු හයක්ද මාක්ස් දක්වා ඇත.)

ආර්ථිකමය ලෙස ධනවාදයේ අර්බුදය අවසන් වන්නේ සමාජකරණය වන නිෂ්පාදන ප්‍රාග්ධනය වෙනිව නිෂ්පාදනය වූ පරිභෝජන ප්‍රාග්ධනයද සමාජකරණය වීමෙනි. එනම් සමාජවාදයෙනි.

එනම් නිෂ්පාදන ප්‍රාග්ධනය හා පරිභෝජන ප්‍රාග්ධනය අතර සැලසුම්කරනය හා ප්‍රාග්ධනයෙහි සමාජකරනයෙනි.

ප්‍රාග්ධනය, ප්‍රාග්ධන වත්‍රයේ හා ධනවාදයේ ප්‍රාග්ධන අර්බුදය පිළිබඳ අපේ විවේචනය දැන් සළකා බලමු.

එක්තරා ප්‍රාග්ධනය අශිෂ්ය කාරක වටිනාකමක් බවද, එය නිෂ්පාදන වත්‍රයේ ලා ඇති කරවන ඌනතාවයද, ඉරිහ ආර්ථික විද්‍යාවේලා සළකා බලනු ලැබීය. එය ප්‍රාග්ධනය ප්‍රශ්න කරනු ලැබුයේ එය පදනම්නිය. එහෙයින්, ඉරිහ ආර්ථික විද්‍යාව ප්‍රාග්ධනයට වෙරෙහිව කාරක වටිනාකම විපුරුවා සමස්ථ වටිනාකම වෙනුවෙන් පෙනී සිටී. පෙරලා එක්තරා ප්‍රාග්ධනයෙහි අර්බුදවල ප්‍රශ්න නොකරන් අතර, එය නිෂ්පාදන ක්‍රියාවලියට (ස්වාභාවික) දක්වන ආධිපත්‍යය පවා පිළිගනී. යහු උනන්දු වන්නේ අතලොස්සක් අත යදී ඇති ප්‍රාග්ධනය තවත් වර්ධනය වීමට අර්බුදයක් ගෙයින් සමාජ සන්නක කරලීමටය.

මෙහිදී – ටංගලයි යථාර්ථවාදියක පදනම ලෙස යලකන නිෂ්පාදන බලවේග දියුණුව පිළිබඳ ව්‍යාජය කිසි විටෙක ප්‍රශ්න නොකළහ. පවතින කාරක නිෂ්පාදාර්ථතාව සහ කාරණ කාර්යක්ෂමතාව සමස්ථ අගයක් බව ඔවුන් පිළිගැනීය. එවෙන්ම, මේ ව්‍යාජ වර්ධනය සඳහා ඔවුන් සමාජකරනය වී ඇතැයි සැලකූ නිෂ්පාදන බලවේග ධනපති වෙළඳපොල විසින් විනිවිද ගොස් ඇති අයුරු කිසි විටෙක පැහැදිලි කර නැත. ඉරිහ ආර්ථික විද්‍යාව ඒකාධිකාරී වෙළඳ පාලනේ කාරක වටිනාකම් හා නිෂ්පාදන බලවේග වල කාරක නිෂ්පාදාර්ථතාව අතර අවියෝජනීය සබඳතාව දැක්කා අතර එය සවිපිළි ගලවා හෙළිකර ඇත.

ධනවාදය අධි නිෂ්පාදනයෙන් බිඳ නොවැටුනේ ඇයි? යන්න සළකා බැලිය යුතුය.

පළවුට මාක්ස්ගේ යුගයේදී තට රටවලින් හා පිටිත රටවලින් කොල්ලකන ලද සම්පත් ඉදිරියේ ඒවා පරිභෝජනය කර ගැනීමට නොහැකිව අර්බුදයට ගිය බටහිර යුරෝපීය හා ඇමරිකන ධනවාදයේ ලදරු ඖක්ෂණිය සටන්ථයක් ලෙස යේරුම් ගැනීම නිසා සිදුවූ වැරැද්දය.

දෙවනුව ධනවාදී වෙළඳපොල තුල සිදුවූ වෙනස්කම්ය. එහිමත් ධනපතියා නිෂ්පාදනය කරන්නේ අයාලේ නොවේ. වෙළඳපොල තුල ඉල්ලුමද සළකා බලයි. වෙළඳපොලෙන් ලබාගන්නාවූ මේ ප්‍රතිඝෝෂනය ධනවාදයෙහි ශක්තිමත්ම අංගයකි. එමෙන්ම, ධනපතියා නිෂ්පාදනය කරන්නේ පරිභෝජනය කරනා පිටිතයින්ට පමණක් නොවේ. ධනපති පරිභෝජනය හා අනාගත ආයෝජනය සඳහාය. එමෙන්ම, නිෂ්පාදනය හා පරිභෝජනය එකම ක්ෂනයකදී සිදු නොවේ. එය සිදුවන්නේ වෙනස් අවස්ථාවලය. මෙය මෙලෙස සිදුවීම ධනවාදයේ පැවැත්මේම අවශ්‍යතාවයකි.

මෙයේ ගෙයින් අධිනිෂ්පාදනය ධනපති ක්‍රමයේ අර්බුදය නොවේ. පෙරලා කේන්ටියානු ප්‍රවාදය පදනම් වුයේද වියදම් වැඩිකරලීමේ මගක් මගින් අධි නිෂ්පාදනයට පෙළඹීම් කරලීමටය.

පසුකාලීන මාක්ස්වාදීන් දෙදෙනෙකු අතින් මාක්ස්ගේ මේ ආර්ථික න්‍යාය පැහැදිලි කෙරුමට සිදු විය. ධනවාදය අධිරාජ්‍යවාදය දක්වා පැතිරී වෙළඳපොල පුළුල් වූ ගෙයින්, අධිනිෂ්පාදනය ජාත්‍යන්තර කරනයෙහි ප්‍රථිඵලයක් ලෙස ලොවිස්කි ඉදිරිපත් කලේය.

අධිරාජ්‍යවාදය ධනවාදයේ උසස්තම අවධිය යන කෘතිය තුල ලෙනින් වෙනත් පාර්ශවයක් අවධාරනය කලේය. එනම්, ඒකාධිකාරී වීම විසින් ධනවාදයට නිෂ්පාදන බලවේග දියුණු කරලීමෙන් තොරව ඒකාධිකාරයේ බලයෙන් ලාභ ඉපයිය හැකි බවය. නිෂ්පාදන බලවේග වල දියුණුවට අධිරාජ්‍යවාදය හරස් වන්නේ එසේ යයි ඔහුගේ මතය විය. ඒ අනුව අධි නිෂ්පාදනයෙන් ධනවාදය බිඳවැටීම පැහැදිලි නොවේ. ලෙනින් මාක්ස් ගේ ආර්ථික ආකෘතිය පාර්ශවීය ලෙස ප්‍රතික්ෂේප කර ඇති බව පෙනේ.

එහෙත්, ධනවාදය ලෙනින්ගෙන් පසුවත්, කාරක නිෂ්පාදායිතාව ඉහළ තබා ඇත. එහෙත්, අධි නිෂ්පාදන අර්බුදය පැන නැගුනේ නැත. ඉන්පසු නිහිටු කියිදු මාක්ස් වාදියෙක් ධනවාදයෙහි වත්මන් හුවමාරු කරන නීතිය කවරක්ද? ධනවාදී අර්බුදය කෙයේද යන්න පැහැදිලි කර නැත.

ඇත්ත මෙහයෙන්ම ධනවාදයට මේ සියල්ල කරගත හැකි වුයේ වත්මන් හා අනාගත පරපුරු වලින් ඔවුන් ලබාගත් අතිවිශාල අතිරික්තය ඒකාධිකාරියට අවශ්‍ය ලෙස වටිනාකම් නියම කර ලීමෙනි. මේ පුරාකෑටි දෙකට බාධා ඒවහාව මානව - පරිසර සම්බන්ධයෙන් එල්ල වන තෙක් ධනවාදය පෙරටම ගියේය. අද එය අර්බුදයකය.

මාක්ස් සමාජවාදයේ නිදහස්පනය ලෙස

මාක්ස්ගේ යුගයේදීම ධනවාදය තුළම විවිධ ආකාරවලින් සමාජවාදය ඉල්ලා සිටින්නෝ වූහ. ඒ සියලුදෙනාගේ විශ්වාසයන්, මතේරාවන වෙමින් මාක්ස්ගේ සමාජවාදී මතය විද්‍යාත්මක වීම කොයි බැලිය යුතුය.

"මානව සමාජයේ පදනම මානවයාගේ විඥානය තුල නොව හෙතිනය තුල සෙවිය යුතුය. සංස්කෘතිය තුල නොව ආර්ථිකය තුල දැනිය යුතුය. මානවයා සමාජයක් ලෙස ප්‍රධාන අරගලය සිදු නලේ නිෂ්පාදනය සඳහා පරිසරය සමඟය. සංවර්ධන සද්පිලය හා එයට බැඳුනු නිෂ්පාදන බලවේග වල වර්ධනය නැවැති සද්පිලය වෙයය. සෑම සමාජ්‍රමයක්ම ඓතිහාසිකව නිෂේධනය වූයේ මේ අනවරත ගෙතිහ නියමය එනම් සංවර්ධන සද්පිලය පවත්වා ගැනීමට නොහැකි වූ නියා ය. මේ ප්‍රධාන අරගලය සමඟ සතුරු අරගලය එනම් මානව සමාජයේ ප්‍රතිවිරෝධතා අතර අරගලය හමගන්නා අතර ප්‍රධාන අරගලය හා අතුරු අරගලයද ප්‍රධාන අරගලයට යටත්ව දයලෙතික වේ. ඓතිහාසික ගෙතික වාදය වෙයය.

ප්‍රාග් තොමියුන යුගය ධිඳ වැටී වහල් යුගය බිහිවූයේ, වහල් යුගය ධිඳ වැටී-වැඩ වයම් යුගය බිහිවූයේත්, වැඩවසම් යුගය ධිඳ වැටී ධනවාදී යුගය බිහිවූයේත් මේ පොදු නියමය නියාය.

ඒ අනුව ධනවාදය තුලද ප්‍රධාන ප්‍රතිවිරෝධය එනම් පරිසරය සමඟ වූ අරගලය සහ ඒනත්වයද අතුරු ප්‍රතිවිරෝධය එනම් ධනපතිය හා නිර්ධනයා අතර අරගලය හා ඒනත්වයද ලෙස ප්‍රතිවිරෝධතා දෙකක් පවතී.

මෙයට අමතරව ධනවාදය ඓතිහාසිකව නිෂ්පාදනය සමාජගතකරනය කර ඇත. එමෙයින් ආර්ථික ලෙස සමාජගතකරනය වූ නිෂ්පාදනය – පුද්ගලික හුවමාරුව හා පරිභෝජනය සමඟ විසංවාදය වේ. නිෂ්පාදන ප්‍රාග්ධනය හා පරිභෝජනය හාණ්ඩ ප්‍රාග්ධනය අතර සැලසුම් විරහිත අරාජිකත්වයක් පවතී.

මේ ගැටුම නගරය හා ගම අතරද, උගත් ග්‍රමය හා සෘජු ග්‍රමය අතරද පුරුෂයා හා කාන්තාව අතරද පවතී.

මෙලෙස සංවර්ධනයේ අවශ්‍යතාවයන් ලෙස සමාජවාදය බිහිවේ. සාමූහික දේපල අධිතිය හා සැලසුම්කරණය ඇතිවේ. අතුරු (සමාජ) ප්‍රතිවිරෝධය අහෝසි වී ප්‍රධාන (පරිසර) ප්‍රතිවිරෝධය පමණක් ඉතුරු වේ.

හුවමාරුව-අධිතිය හා පරිභෝජනයද සමාජගතකරණය වීමෙන් ආර්ථික විසංවාදය විසඳේ. සැලසුම්කරණයට ඉඩ ලැබෙන සෙයින් නිෂ්පාදන ප්‍රාග්ධනය හා පරිභෝජන ප්‍රාග්ධනය අතර ආරාජිකත්වය අවසන් වී සැලසුම්ගත මධ්‍යභාග වේ. එය සාමාන්‍ය තර්කාන්විත ඥාලාවේ සිට ශාස්ත්‍රීය ආර්ථිකය දක්වා එසේ වේ.

ප්‍රාග්ධනයේ සිවිසාරුවන් බවට බලුකරය පත්වීමත් සමඟ සූරාකෑම අහෝසි වේ. සමාජ ග්‍රමයට නිසි වටිනාකම ලැබේ. නගරය හා ගම අතර සූරාකෑම, උගත් හා නූගත් ග්‍රමය අතර ගැටුම, පුරුෂ ආධිපත්‍ය හා කාන්තාව අතර ගැටුම් අහෝසි වේ.

සෑම ව්‍යක්තිකම ග්‍රමය – සෑම කියාවන් අනුව ලබාදෙන සමාජවාදය බිහිවේ.

තවදුරටත් රාජ්‍ය අතුරුදන් වේ. මානවයා අවසානයේ සිය සමාජ සබඳතා වල සැබෑ නිදහස්පනය හා මෙහෙයවන්නා වේ. මෙනයින්ම ප්‍රධාන ප්‍රතිවිරෝධයද මානවයා මූලිකව ජයග්‍රහණයට පත්වීමෙන් මානවයා ස්වභාවධර්මයේ දෙවියා බවට පත්වේ. සෑමට කම අවශ්‍යතා අනුව ලබාදෙන කොමියුනිස්ට් යුගය එළැඹේ"

මේ අනුව මාක්ස් සමාජවාදය පැතුවේ සංවර්ධනයේ අවශ්‍යතාව මූලික කරගෙනය, ධනවාදය සාමූහිකත්වය ඓතිහාසික ලෙස බිහිකර ඇති නිසා අනාගත සමාජය සමාජවාදී විය. එනම් මාක්ස්ගේ සමාජවාදයද සංවර්ධන සංස්කෘතියේම ප්‍රතිඵලයකි.

ඔබේ ආර්ථික විද්‍යාව අරඹන්නේ සංවර්ධනයේ වර්ධනයෙහි විනාශකාරීත්වය සමඟය. සංවර්ධනයේ සමිස්ථි අද්ධුදය එයට පරිසරය ජයගැනීමට නොහැකිවීමය.

ඔබේ සමාජවාදයේ එක් පදනමක් නම් ධනවාදය පරිසරය සමඟත් මානවයා අතරත් ඇතිකර ඇති ද්වීතය අරගලය අහෝසි කර මානවයා තුලත් පරිසරය තුලත් (එනම් අනාගත මානව පරපුර තුලත්) සමාකාත්මකභාවය පතුරුවා හැරීමය.

.../

එමෙන්ම හදිත සමාජවාදය වෙනත් පිටමය වූත්, සමාරම්භයවූත් සංස්කෘතික වූත් පදනම් ගණනාවක් සමාජවාදයට පවතින බව පිළිගනී. මෙලෙස මාක්ස්වාදයට ප්‍රතිපක්ෂව සමාජවාදයට විවිධ ආකෘතීන් වලින් එලැඹීම ඇතිහාසිකව පිළිගනී.

සැබැවින්ම ලොව පුරා සිදුවූ සමාජවාදී අරගල මාක්ස්වාදයේ නාමයෙන් සිදුකලත් ඒවාට වෙනත් පිටමය ජාතිකමය හා මානව හිතවාදී පදනම් විය.

පෙරලා බිහිවුනු සමාජවාදී රාජ්‍යවල වූලික වන්නේ නිෂ්පාදන බලවේග වල වර්ධනයද, දේශපාලනික සාමූහිකතාරනයද යන්න මත විවාද ඇති විය. ට්‍රොට්ස්කි හා ස්ටාලින් බුඛදින් - නමනෙවි අතර ගැටුමේ හරය එය විය. මාඕ සේතුං හෝ අන්වර්ද්, මේ ගුවේරා හා රහසෙල් රොඩ්‍රිගොස් අතරද ගැටුමේ හරය මෙයයි. එහෙයින් මැන්ස් ප්‍රකාශ තලේ තුමන්ද යන්න පිළිබඳ විවාදයක් පවතින බව පෙනේ. මධ්‍යගත සමාජවාදය බිඳවැටුනු අද වැනි දිනක තියුණුව නැගී ඇත.

පෙරලා නිෂ්පාදන බලවේග අක්පත් කරගෙන සා සමූහිකතාරනයකින් රාජ්‍යය අෂෝසි වී ගම සා නගරය අතර නූගත් හා උගත් ශ්‍රමය අතර කන්තාව හා ප්‍රරුෂයා අතර ගැටුම අෂෝසි වේ. මත්මින් සංවර්ධනය තුල පවතින නිෂ්පාදන බලවේග හා යන්ත්‍රවල පවතින්නේ හුදු අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එම යන්ත්‍රම තාරක නිෂ්පාදාසිතාව ඉයලවෙමින් දාර්ශනික ලෙස බිහිවී ඇත්තේම සුරාකෑම අනිවාර්යවීමේ නොන්දේසිය මතය. එහෙයින් මේ නිෂ්පාදන බලවේග - නිෂ්පාදන ප්‍රාග්ධනය අත්පත්කර ගැනීමෙන් ඉහත කී තිසිදු අරමුණක් ඉටු නොවේ. අඩු කරමින් ආදර්ශ පන්ති පිඩනය වත් අෂෝසි නොවේ. පරිසරය සුරාකෑමේ රාජ්‍යයේ, ගම සුරාකෑමේ නගරයේ, නූගත සුරාකෑමේ විශේෂඥයාගේ හාන්කාට සුරාකෑමේ පුරුෂයාගේ තාන්ත්‍රණයක් වූ එය නිලධාරී පිඩන තන්ත්‍රයක්, බලවත් රාජ්‍යයක් තවදුරටත් වැඩෙන නගරයක් බිහිකරලීම අසම්බවයක් නොවන්නේය.

හදිත සමාජවාදය නිෂ්පාදන බලවේග අල්ලාගෙන පාලනය කරලීම පිළිබඳ උනන්දු නොවේ. බලයේ වූලික අවස්ථාවේදී ඒවා අල්ලා ගත්තද විකල්ප තාන්ත්‍රණයක් - සුරාකෑම් විරහිත තාන්ත්‍රණයක් පිහිටුවීම වෙනුවෙන් එය පෙනී සිටී.

මධ්‍යගත සැලසුම්කරණය මගින් සමාජවාදය බලාපොරොත්තු වූයේ ධනවාදයේ ආරාජිකත්වය අවසන් කරන්නටය. එහෙත් විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු බිහිවුනු ධනවාදයේ අර්බුදයද මධ්‍යගත සැලසුම්කරනයමය විය. ඇමෙරිකානු ආර්ථික විද්වතකු වූ වෙස්ලි ලියොන්ටීන් ගේ ආධාන-ප්‍රධාන වගු සා ලියොන්ටීන් නාමය ඒකාධිපති ධනවාදයේ වෙළඳපොල සැලසුම්කරනයේ හා බැංකු ක්‍රමයේ මූලික තලමල්ලකරනයේ අත්‍යාවශ්‍ය අංග වී ඇත. ධනවාදය සිය සුරාකෑම් සිදුකරන්නේ ද අතිශය සැලසුම් ගත ලෙසය.

පෙරලා සෝවියට් දේශය ප්‍රමුඛ මධ්‍යගත සැලසුම්ගත රාජ්‍ය ප්‍රද්ධතියේ අර්බුදය උත්සන්න වූයේද ඒ නිසාමය. එයට හේතු කිහිපයක් ඇත.

1. සැලසුම්කරනයක අරමුණ සමස්ථය ගැන උනන්දු වීම වුවත් හදිත ආර්ථික විද්‍යාවට අනුව නිෂ්පාදන ක්‍රමයේ පැවැතිය යුතු 'පූර්ණ සමස්ථය' කිසිවිටෙක සැලසුම්කරනයට අදාල නොවිය. මෙයින් අනාගත පරපුර සුරාකෑමේ යන්ත්‍රණය මේ රටවල ද වේගවත් විය. එනම් එය පූර්ණ සැලසුම්කරණයක් නොව පාර්ශවීය සමස්ථය සැලසුම් සැලසුම්කරණයක් විය.
2. තර්කයට සිමා මෙන්ම සැලසුම්කරනයට ද සිමා පවතී. සියල්ල සැලසුම්කරනයට උනනය කරලීම වහස් ව්‍යාපෘතියක් විය.
3. සැලසුම්කරනය මධ්‍යගතවීම විසින් අර්බුදය තවත් තීව්‍ර විය. ජනතාවගෙන් විසුන්ත වූ රාජ්‍යයක් හා දේශපාලනයක් ඇතිවිය. මෙය හුළු ක්‍රමයම විසුන්ත කරනය තල දක්වා අතිශය අනාරක්ෂිතභාවයට තල්ලේය. සිදුනල යුතුව තිබුනේ සමස්ථය මෙන්ම විශේෂයෙද, විශේෂයෙන් මිනිස් අවශ්‍යතාද තීන්දු කරලීමය. විමධ්‍යගත පරිසර පද්ධතිවලට ව්‍යාපාරනයට ඉඩදීමය. මෙය මාක්ස්වාදයේ එන මධ්‍යගත වාදය නිසා උපන් අර්බුදයකි.

හදිත සමාජවාදය සැලසුම්කරනය පිළිගන්නා නමුත් එය සැලසුම්කරනයේ සීමා පිළිගත් පූර්ණ මිනිස්-පරිසර සමස්ථය ගැන අවධානය යොමුකල විමධ්‍යගත පාලනයක් සහිත සැලසුම්කරනයකි.

.../

සමාජවාදය තුළ වටිනාකම් නිසාමකරලීමද අර්බුදයක් විය. ශ්‍රේඩවල පූර්ණ වටිනා කම් සමාජ ශ්‍රමය නම් එක පුද්ගල ලෙස ගෙවීම සිදුවුවහොත් ආයෝජනය සඳහා කිසිවක් ඉතිරි නොවේ. එහෙයින් මධ්‍යගත සමාජවාදය තුල වටිනාකම් දෙකක් විය. ආයෝජන වටිනාකම් හා පරිභෝජන වටිනාකම් ලෙසය. (සාමාන්‍යයෙන් සෝවියට් සංගමය තුල ආයෝජන වටිනාකම් 25% ක් විය) මෙයින් පෙනෙන්නේ රාජ්‍යය විසින් අයිතිවාසිකම් ප්‍රාග්ධනය වෙනුවෙන් සුරාගන්නා බවද ?

නෙසේ වෙතත් ධනවාදයේ කළමණාකරණයක් ලැබුවහි සමාජවාදය තුල සිදුවන්නේ ධනපතීන්ගේ පරිභෝජනය සමාජ සන්තකවීම පමණි. ඒ අනුව සමාජවාදී ලෝකයට පරිභෝජන ලෙසම උරුම වන්නේ ධනපතියන් (පළමු ලෝකය) හා නිර්ධනයින් (3 වන ලෝකය) අතර අතරමැදි තත්වයකි. (2 වන ලෝකයකි.;) එය වස්තුන් පරපුර සුරා නොකෑම නිසා මධ්‍යගත සමාජවාදී ලෝකයට උරුම සැබෑ කැනය. (සෝවියට් සංගමයට පළමු ලෝකය වීමට නම් ඔවුනට සුරාගැනීමට සිව්වෙනි ලොවක් සිටිය යුතුය. පළමු ලෝකය වීමට මධ්‍යගත සමාජවාදයෙන් ධනවාදයට පැරුවූ සෝවියට් සංගමයට තුන්වෙනි ලෝකයට ඇද වැටීමට සිදුවිය. ඒ අනුව අනිවාර්යයෙන් වැඩ ඇත.)

එමෙන්ම ගෙනිහාවාදී දෘෂ්ටියද මධ්‍යගත සමාජවාදය අර්බුදයට යැවූයේය. මානවයාගේ ආර්ථික ප්‍රශ්නය පමණක් එකම ප්‍රශ්නය නොවේ. යුරෝපය තුල විසුරුනු ජන හොටස් එක්තරලීමේදී ආර්ථිකය හා ගෙනිහාව බලය වැදගත් වුව නොවෙයි ඉටු නලද සමස්ථ ලෝකයේ විශේෂයෙන් ආසියාවේ එය එසේ නොවිය. එහෙයින් එය සමස්ථ ලෝකයේ සමාජ පදනම ලෙස ගැනීම අතිශයින් වැරදි සහගතය.

මානවයා ට කුසට මෙන්ම මනසටද ආහාර අවශ්‍යය. සෝවියට් සංගමය තුල ඉහත හොඳ ගෙනිහාව තත්ත්ව යටයේ වුවද නිර්මාණාත්මකභාවය සාද් ප්‍රගයටත් පස්සට ගියේ ඇයිද යන්න (දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු), පැහැදිලි වන්නේ මේ අර්බුදය තුලය. මෙය සෝවියට් විද්‍යා කාර්මණ ක්ෂේත්‍රයේ දැඩිව බලපෑවේය. බැර කාර්මණ අර්බුදය ඇමෙරිකාවට ආවේද සෝවියට් දේශයට සමාන කාලයකය. එහෙත් ඇමෙරිකාට ස්වභාවද, ජපානය හරහා ගිහිල්ලා වෙළඳ කාර්මණයෙන්ද අර්බුදයෙන් තාවකාලිකව ගොඩ ඇවිත්. සෝවියට් සංගමයට චීනයෙහි සහයවත් ලැබුනේ නැත.

ආර්ථිකය මූලිකව යන මතය සංස්කෘතිය මූලද, සංස්කෘතික විවිධත්වය විනාශ වීම අහින්ද සෝවියට් සංගමය තුල බරපතල අර්බුදයක් ගෙන ආවේය.

පෙරලා බැන්ස්ගේ සමාජ සංවර්ධනය සමාජවාදී සමාජයෙන් කොමියුනිස්ට් සමාජයට පරිවර්තනය වීමෙන් නවතීද ? නිෂ්පාදන බලවේගවල– සංවර්ධනයේ සීමා නොපවතීද ? ප්‍රාග් කොමියුනිස්ට් සමාජයට වූවා වෙන් නිෂ්පාදන බලවේගවල දියුණුව මූලික කරගනිමින් නවීන කොමියුනිස්ට් සමාජයද පන්ති සහිත සමාජයක් බවට පෙරළියාද ? ද්‍රව්‍යමය භාණ්ඩ හා සේවා අප්‍රමාණික ලෙස සුලභ කරලීමෙන් මානවයාගේ අර්බුදය විසඳිය හැකිද ? මහු තෘප්තිමත් පිටියෙකු කල හැකිද ? එලෙස භාණ්ඩ හා සේවා අපිරිමිත ලෙස සුලභ කල හැකිද ? යන වේ ප්‍රශ්න කොමියුනිස්ට් යුගය පිළිබඳ මතුවන ගැටලුවය. සංවර්ධන සර්පිලය අනුව කොමියුනිස්ට් යුගය අන්තයේ එළැඹෙන සීමාවන් පමණක්ද යන්න පවා සවධානයට ලෙස ඉතුරු වී තිබේ.

සරිත ආර්ථික විද්‍යාව නිෂ්පාදන බලවේගවල සහ සංවර්ධනයේ නිරවුල් සීමා දනී. පරිසර ගණික සමතුලිතතාවය රකිමින් විරස්ථායී සංවර්ධනයක් එය යෝජනා කරන්නේ එයේය.

නෙසේ වෙතත් සෝවියට් –චීන අත්දැකීම් විසින් සමාජවාදයේ අභිශය වැදගත් අංග ලෂණ හෙළිදරව් විය. විශේෂයෙන් සමාජවාදී වෙළඳ පොල තුල පරිසර විනාශකාරී අධි පරිභෝජන භාණ්ඩ නිපදීම වලක්වන ස්වයං සංස්ථානයන් ඇති බවද, සම්පත් හිඟය සඳහා මානව සම්පත් අතිශය කාර්යක්ෂම ලෙස යොදවිය හැකි බවද, මානවීය අරමුණ් හා මානව ස්වභාවිකත්වය එය තුල උදාවන බවද පෙනී ගියේය.

සෝවියට් සංගමය මුහුණ දුන් ප්‍රායෝගික අර්බුද නිසිපයක් මෙයිදීද සලකා බැලිය යුතු. පළමුව ප්‍රාග්ධන අර්බුදයය. සූරාකෑමට යටත් විරිය නොවූ යෙදීන් මානවයාගේ පීවි පැවැත්ම සුරා ගත නොහැකි යෙදීන්ද ඉතුරු වූයේ අභාගත පරපුර සූරාකෑමට පමණකි. බැර කාර්මණයේ වූ අර්බුදය

.....(

හා එකඟන පල්වීම විසින් එයද ඇන හිටිනු ලැබුවේය. මෙලෙස සම්ප්‍රදායික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන ගිම්බම් සඳහා අතීතයේද ඇමැදිනාව-ජර්මනිය හා ජපානයට යටත්ව දුර්වල වීම නිසා බිඳවැටුනු සෝවියට් රාජ්‍යය නැවතත් තමන් ප්‍රාග්ධනය එක් ගැස්කරලීමේදී උතුරුදිග ලෝකයේ දුර්වලව බලය බව පෙන්නුම්නලේය. සංවර්ධනයේ ආධිපත්‍ය නියමය අනුව එහෙයින් සෝවියට් සංගමය බිඳවැටින.

දෙවනුව විෂම ආයෝජනයයි. යුධකරනය හා අභ්‍යවකාශ කරගය සඳහා යටවූ අතිවිශාල සම්පත් හා ශක්‍යභාවයන්ය. මෙය විසටිනාමය-චීනය හා තියුඩාවට ද බලපා ඇති අර්බුදයකි.

තුන්වෙනුව පදිසරය සමඟ කරගතෙරුවට බිහිතල වෙළඳපොල අර්බුදයය. සෝවියට් වෙළඳපොල මධ්‍යගත එකක්. වූ හෙයින් ධනවාදී වෙළඳපොල වෙන් තිබුදු ප්‍රතිශෝෂනයක් ලැබුයේ නැත. මෙම විසඳිය යුතුව තිබුනේ විමධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදයෙනි. නිලධාරී ආධිපත්‍යය එය දුර්වල නලේය. එය පදිසර සංරක්ෂණයේදී මෙන්ම සාමාන්‍ය ගාණ්ඩ නිෂ්පාදනයේ සාමාන්‍ය ජනතාවටද විනාශය හා ඒකාකාරීත්වය ගෙන ආවේය. මෙහ පරිමාන මධ්‍යගත නිෂ්පාදන වඩා දියුණුය යන මාක්ස්-ලෙනින්වාදී මතය මේ ඉදිරියේ විය.

පෙරලා ජාත්‍යන්තර ආයෝජනය තුල සෝවියට් ගැහි පරපුටු රුලක් වීය පිටයෙන් පුතු සමාජවාදය විවිධත්වයෙන් පෝෂණය කරන බලවේගයක් බිහිනොවීය. මෙය සෝවියට් අදහුදල් විනාශවීමක් මිස තාක්ෂණික හෝ වෙනත් ශේත්‍රවල තිබුදු ප්‍රතිලාභයක් අත්පත් කර නොදුන්නේය.

තළමණාකරන අර්බුදයද තීරනාත්මක විය. සම්පත් හා ශක්‍යතා හිඟය ඉදිරියේ තළමණාකරනය අවශ්‍යතාවයක් සෙව අනිවාර්යයකි. සෝවියට් තළමණාකරනයේ එකම දිහින් වූයේ ශ්‍රම විභජනය, මධ්‍යගතකරනය හා නිෂ්පාදන ඒකක අනුකලනය පමණි. ඒහාද මාක්ස් ගෙන් උපුටා ගත් ඒවාය, අවසානයේ පෙරෙස්ත්‍රොයිකා වුව සිදුකලේ මුලින්ම තාර්කික පද්ධතිවල පුද්ගල අසිතියය. ධනවාදයේ පදිසර පදනම් වන තාර්කික නිෂ්පාදනය මෙලෙස පුද්ගලීනරනය කරලීම ධනවාදයට පිවිසීම වේගවත් කලේය. (චීනය පටන්ගත්තේ කෘෂි ආර්ථිකයෙනි).

මේ අයුරින් පවතින සංවර්ධන අර්බුදයේ අපිව-පිව සිමා විසින් එය ඔබ ගිය මධ්‍යගත සමාජවාදය බිඳලනු ලැබිය.

මෙයින් වඩ වඩා සාධනය වනු ලැබුවේ ධනවාදී අධිරාජ්‍යයට එරෙහිව වඩා නිෂ්පාදාකී යන්ත්‍ර වඩා නිෂ්පාදාකී විනාශකාරීත්වයකින් යුතු යුධ අවි, වඩා වර්ධනය වන කාරක ප්‍රාග්ධනය ආදිය කරගතාරී ලෙස සෙදවීවට ද්‍රව්‍යමය බලය ප්‍රති ද්‍රව්‍යමය බලයකින් ගිලගත නොහැකි බවය.

ධනවාදී කාරක ශෙෂිය බලය-නිෂ්පාදන බලවේග හා යුධ අවි පරාජය කල හැක්කේ අපිව-පිව සමස්ථය සමඟ එක පෙලට සිටින අරගලයක් විසින් බවය.

<u>විකල්ප ආර්ථිකය</u>

වෙතෙක් ධනවාදී සංවර්ධන සංස්කෘතිය තුල ආර්ථිකය හා ආර්ථික විද්‍යාව නමින් වෙනම දැනුම් පද්ධතියක් පැවතින. අර්බුදය ඉදිරියේ පදිසරය හා පරිසර විද්‍යාව නමින්ද තවත් දැනුම් පද්ධතියක් ගොඩනැගින. අර්බුදය තවත් උත්සන්න වෙත්ම මේ වෙන වෙනම වූ දැනුම් පද්ධති දෙක යාන්ත්‍රිකව එක් කරන්නටද වෑයම් කෙරේ.

එහෙත් ධනවාදය තුල මේ ක්‍රියාවලිය ඉටුකරගෙන නොහෙති විසංවාදයන්ව පවතින බව අප විසින් පෙන්වා දී ඇත.

සරිත ආර්ථික විද්‍යාව යනු ධනවාදය තුල බිහිවූ පරිසර විද්‍යාවේ හා දේශපාලන ආර්ථික විද්‍යාවන්ගේ සරල එකතුවක් නොවේ. එය නව විකල්පයන දේශපාලන ආර්ථික විද්‍යාත්මක සිද්ධාන්ත පේලනි. මේ අනුව එය ධනවාදී ආර්ථිකය විවේචනය කරන අතර එහි අර්බුදයද පෙන්වා දෙයි. එකැනින් නොනවතින එය ගොඩනඟන සමාජයේ පැතිකඩක් බවට පත්වේ. සරිත ආර්ථික විද්‍යාවේ සිද්ධාන්තික පදනම් සංක්ෂිප්තව විස්තර කර ඇත.

.....

සහ ජේෂ්ඨ ද්‍රව්‍යවාදය, සාපේක්ෂ විඥානවාදය ආදී විසින් විවිධ වෙස් ගැන්වී ඇත.

වර්තමාන ධනවාදී සංස්කෘතිය ද්‍රව්‍යමය (භෞතිකමය) ලෝකය සූරාගැනීම සහ පරිභෝජනය මත සිය සමාජීය පදනම ගොඩනගා ඇත. එයින් එය මානව-චින්තනය සහ පැවැත්ම ද්‍රව්‍යධර්ම වලට උණුසුම දෙයි. එමෙන්ම ධනවාදය මේ සූරාගැනීම ඉහල නැංවීම පිළිබඳ විශ්වාසය තබා ඇත්තේ වාස්තවික ද්‍රව්‍යධර්ම වල රහස් සොයා දෙන මානව නිර්මාණාත්මක ක්‍රියාවලිය – මානසික ආකෘති මතය. එනම් ධනවාදී සංස්කෘතිය තුල සැඟවුනු විඥානවාදයන් ද පවතී. සාමාන්‍යයෙන් ධනවාදයේ විඥානවාදය විස්කර තරනු ලබ ඇත්තේ දෙවියන් සහ යක්ෂයින් වැනි නිරපේක්ෂ විඥානවාදයෙහි ප්‍රතිඵල ලෙසය. එහෙත් ධනවාදය තුල සැඟවුනු විඥානවාදය එයට වඩා පුලුල් 'විද්‍යාත්මක' විඥානවාදයකි! ධනවාදී සංවර්ධනයේ පීව-මානසික අර්බුදයෙහි පදනම එයය.

සම්භාව්‍ය මාක්ස්වාදයෙහිද සමාජය පිළිබඳ මේ තත්ත්වයම පවතී. එය එක් පසකින් සමාජයෙහි පදනම ලෙස භෞතික ක්‍රියාවලිය – නිෂ්පාදන බලවේග වල වර්ධනය – පිලිගන්නා අතරම සමාජ විඥානය ඒ අනුව යකස්වන බව පිලිගනී. එමෙන්ම එය තවත් අවස්ථාවලදී මානව සමාජය විවරනය කරලීමට වඩා එය වෙනස් කරලීම පිළිබඳ අවධාරණය කරයි. එනම් මානව මානසික නිර්මාන මූලික බව පිලිගනී. මෙය නැවතත් අනුරූපී වන්නේ ද්විත්වය පිලිගන්නා අතර ඒකත්වය මූලික කරගන්නා දයලෙක්තික භෞතිකවාදයේ විසංවාදයටය.

සම්භාව්‍ය මාක්ස්වාදයෙන් පසුවද මේ අර්බුදය මාක්ස්වාදී සංස්කෘතිය තුල දිගින් දිගටම මතුවී ඇත. ලෙනින් විසින් රචිත කලයුත්තේ කුමක් ද යන කෘතිය තුල කම්කරුවන් තුල සමාජය වෙනස් කරලීමේ විඥානය පහල නොවන බවත් එය නවීන යන්ත්‍ර මෙන්ම ධනවාදී බුද්ධිමය ශේෂ්ඨවලින් කම්කරු පන්තියට ලබාදිය යුතු බවත් අවධාරනය කරනලදී. නිෂ්පාදන බලවේග සමාජ කරනය වීමේ ස්වභාවික ප්‍රතිඵලයක් ලෙස කම්කරුවන් තුල ඒවා අත්පත්කරගෙන අනාගත සමාජයේ නායකයන් වීම පිළිබඳ විඥානයක් පහල නොවීම පිලිගැන්ම යනු භෞතිවාදය මුළුමනින් ප්‍රතික්ෂේප කෙරුමකි. පෙළලා නිර්ධන පන්ති විඥානය බාහිරින් කම්කරුවන්ට එන්නක් කලයුතු යැයි පිලිගැන්ම ද්‍රව්‍යමය පැවැත්මකින් කෙරව වෙනත් කෙනා විඥානයක පැවැත්ම පිලිගැන්මකි. එනම් නිරපේක්ෂ විඥානවාදයට යටත්වීමකි.

මෙය ප්‍රායෝගික ලෝවියට් සමාජයේද ගැටුමක් ජනිත කලේය. නිෂ්පාදන බලවේගවල වර්ධනය මූලිකද, සමාජවාදී දේශපාලන මතවාදය මූලික ද, යන්න මත ස්ටැලින් සහ ට්‍රොට්ස්කි අතරද, මාඕ සහ ඩෙන්ෂියාඕ පෙන් අතරද, චෙගුවේරා සහ ෆෙඩ්රිගුස් රොඩ්රිගුස් අතරද ආදී ලෙස මාක්ස්වාදී සංස්කෘතිය තුල සදහටම පැවතුනු අරගලයකි. අදද එය එලෙසම පවතී. පෙරලා සමස්ථයන් ලෙස භෞතික ක්‍රියාවලිය සැලසුම්කර, මධ්‍යගතකර සාමූහිකකල පමණින්ම සාමූහික-විඥානය පහල නොවන බව ලෝවියට් සංගමය මනාව පෙන්නුම් කලේය.

හරිත සමාජ විද්‍යාව මේ දාර්ශනික අර්බුදය පිරිහිද දනී. භෞතික ක්‍රියාවලිය වෙන්ව මානව නිර්මාණාත්මක ක්‍රියාවලිය සහ දේශපාලන මතවාදයද වෙන්කල නොහැකි සමස්ථයන් ලෙස එය දනී. පෙරලා මේ සමස්ථය තුල භෞතික ක්‍රියාවලියට සහ මානව මානසික ක්‍රියාවලියට සුවිශේෂතා ඇති බවද පිලිගනී. මානව සමාජය සැකසී ඇත්තේ භෞතික ක්‍රියාවලියෙන් සහ මානසික ක්‍රියාවලියෙහි චතුර්විධ සබඳතා අනුව බව පිලිගනී.

2. ආර්ථික සංස්කෘතික පද්ධතිය

මානව සමාජය වෙනත් දෘෂ්ටියකින් විග්‍රහ කරන විට ආර්ථිකමය වූ (නිෂ්පාදන සහ පරිභෝජන ගණ්ඩ සහ සේවා – දේපල අයිතිය සහ බෙදාහැරීම) කරුණු වලින්ද සංස්කෘතිකමය වූ (නිෂ්පාදන සහ පරිභෝජන විධික්‍රමවල ඇදහිලි සහ සන්නිවේදනය) කරුණු වලින්ද සමන්විත වන බව පෙනී යයි.

ධනවාදී සංස්කෘතිය ප්‍රවර්ධනය කරු ගණ්ඩ නිෂ්පාදනය – පුද්ගල පරිභෝජනය ඉහල නැංවීම යන ආර්ථිකමය පදනම මූලික කරගෙන පවතී. එය සංස්කෘතිකයන්ට ඉඩ දෙන්නේ මේ සීමාවන් ඉහල නැංවීම සඳහා පමණි. වෙලෙස ධනවාදය මූලික ලෙස සිය ධනවාදී සමාජය ආර්ථිකමය

කරුණු මූලික කර පවතියි යන් ධවට උණුහය කරයි. එමෙන්ම එය මේ ආර්ථික වර්ධනය සඳහා විශ්වාසය තබන්නේ ජයග්‍රාහී එන් අධිපති සංස්කෘතියන් මත සමඟය. (අද එය අෂ්ගලෝ සැක්සන් වී තිබේ.) විද්‍යාව තාක්ෂණය, වෛද්‍ය විද්‍යාව, ආර්ථික-සමාජ විද්‍යාවන්, කළමණාකරනය, ඇදගීම් හා විඥානය ආදී සියල්ලම මේ අධිපති සංස්කෘතිය මත තඩා ඇත.

මෙලෙස සමස්ථයන් ලෙස ධනවාදය සියල්ල ආර්ථිකයට උණුහය කර ඇති අතර පෙරලා සංස්කෘතික විවිධත්වය අහෝසි කරලමින් එන් තනි අධිපති සංස්කෘතියකට මානව සමාජය යටපත් කර තිබේ. ඒ සංස්කෘතියේද අවසාන අරමුණ ආර්ථික වර්ධනයයි.

මේ උණුවාදී දෘෂ්ටිය විසින් එන් අතකින් ආර්ථික වර්ධනය ඇතිවට ඇති අතර අධිපති සංස්කෘතිය – සංස්කෘතියන්ම ලෙසම අසාර්ථකවීම විසින් එය තුල විවිධ ප්‍රවනතා ජනනය කර තිබේ. එමෙන්ම අධිපති සංස්කෘතියේ ස්වයං අසාර්ථකත්වයද පෙරලා ආර්ථික වර්ධනය එය මගින් ඇන ගිටවීමද විසින් විකෘති වෙමින් සංස්කෘතික විවිධත්වයද මතුවෙමින් පවතී.

සවිභාවය මාක්ස්වාදය ආර්ථිකය හා සංස්කෘතිය දුටුවේද සිය සා පේෂ ද්‍රව්‍යවාදී දෘෂ්ටියෙනි. ආර්ථිකයේ පදනම මත සංස්කෘතික මතු මහල ගොඩනැගෙන බවද, ආර්ථිකය වෙනස් කරලීමෙන් සංස්කෘතිය ස්වයංව වෙනස් කල හැකි බවද (එහි පරස්පරය සිදුවිය නොහැක.) සමාජ ප්‍රගමනයේදී සිදුවූයේද, සිදුවන්නේද එය බව සවිභාවය මාක්ස්වාදය අවධාරණය කළේය. මෙලෙස ආර්ථිකය හා සංස්කෘතිය අතර සවිභාවය මාක්ස්වාදය දුටු දයලෙක්තික සම්බන්ධය නැවතද දයලෙක්තික තර්කය කැටිතරගත් සියලු සිතාද විශේෂයෙන් ද්විත්වය පිලිගන්නා ගමන් ඒක ත්වය පිලිගැනීම ලෝකවූ විසංවාදය පැන නංවයි. මානව නිර්මාණාත්මක ක්‍රියාවලිය ආර්ථික නිෂ්පාදනයෙහි දක්වන දායකත්වයද, ඇදගීම් මොවුන් ආර්ථික පරිභෝජනයෙහි දක්වන පෙළඹවීමද ජාතික – සංස්කෘතික ලෙස ගොඩනැගෙන සමාජ සා මුහිකත්වයද – අරගලයද ආදී ක්‍රියාවලීන් මෙයින් පැහැදිලි කරගත නොහැකි වෙයි. මෙය ප්‍රායෝගික සමාජවාදී රාජ්‍යවල හා පොදු මාක්ස්වාදී සංවාදයන් තුලද නිරන්තරයෙන් සංවාදයට ලක්වූ එහෙත් නොවිසඳුනු දයලෙක්තික විංවාදයේම ප්‍රතිඵලයකි.

පැසිස්ට් හා නාසි ව්‍යාපාර මූලිකව ප්‍රතිගාමී අර්ථයෙන්ද, පීඩිත රටවල නිදහස උදෙසා බිහිවූ ජාතික විමුක්ති අරගල මූලිකව ප්‍රගතිශීලී අර්ථයෙන්ද ජනිත වූ දේශප්‍රේමී සංස්කෘතික මූලධර්මවාදයන් හා සංස්කෘතික අරගල මේ අනුව සවිභාවය මාක්ස්වාදයට පැහැදිලි කරගත නොහැක.

සරිත සමාජ විද්‍යාව ආර්ථිකය හෝ සංස්කෘතිය මූලික යයි නොගනී. ඒ වෙනුවට එය ආර්ථික–සංස්කෘතික ප්‍රතිබද්ධතාව සබඳතාවය සමස්ථය ලෙස පිලිගනී. එමෙන්ම ආර්ථිකමය කරුණුවලට මෙන්ම සංස්කෘතික කරුණුවලටද සුවිශේෂත්වයක් ඇති බව පිලිගනී. එමෙන්ම ඒවා අන්තර් සම්බන්ධිතය, එකිනෙ සා පේක්ෂය. සමාජය තුල ආර්ථික– සංස්කෘතික ලෙස වකුටුවීම සබඳතා පවතින බව පිලිගනී.

<u>ජාතිය හා ජාතික විඥානය:</u>

පුද්ගල විඥානයකට අමතරව සමාජ විඥානයක් පැවතිය හැකිද යන්න මතද සමාජ විද්‍යාව තුල විවාදයක් පවතී. ආර්ථිකය ප්‍රාථමික ලෙස ගන්නා ධනවාදය මෙන්ම සවිභාවය මාක්ස්වාදය ආර්ථික සාධක අනුව සමාජ විඥානයන පැවැත්ම පිලිගනී.

ධනවාදය ප්‍රකාශ කරන්නේ වෙළඳ පොළෙහි පැවිදීම විසින් පොදු සමාජ විඥානයක් බිහි කරන බවයි. වෙළඳ පොළ තුල ඉල්ලුම–සැපයුම–නිර්මාණාත්මකභාවය, හා ප්‍රගමනය රැඳී ඇත්තේ මේ පොදු සමාජ විඥානය තුල බැයි සවිභාවය ධනවාදය ප්‍රකාශ කරයි. සංවර්ධනය සඳහා වන මානව කැමැත්ත හා ඔටුනාගේ ප්‍රතිචාරය මේ අනුව වෙළඳ පොළ ආරක්ෂා ධනවාදයට ලැබෙන බව ඔවුන් තර්ක කරයි. මේ වෙළඳ පොලට ලැබෙන සමාජ ප්‍රතිචාරය ධනවාදය තුල ප්‍රජාතන්ත්‍රවාදය ලෙස පෙනී සිටියි. ආර්ථික ලෙස ඇතිවන ගැති පීඩනය හිසා පැන නගින සමාජ අසහනය – සංස්කෘතිකමය ලෙස ඇතිවන පීඩනාදීත්වය හිසා පැන නගින ජාතික ආගමික අසහනයන් ආදී සියල්ල වෙළඳ පොල තුල සංශ්ලේෂණය වී නිදහස් තරගය වෙනවත් කරන බව සවිභාවය ධනවාදය විශ්වාස කරයි.

.....

සම්භාව්‍ය මාක්ස්වාදයද සමාජ විඥානයක පැවැතීම පිළිගනී. සම්භාව්‍ය මාක්ස්වාදය ධනවාදය විසින් සිදුනරන වෙනිඟසින කාර්යයන් දෙනත් දනී. ප්‍රධාන වශයෙන් එය මානව සංහතියේ නිෂ්පාදන බලවේග පෙර නොවූ විරූ ශක්තියකින් වර්ධනය කරයි. එමෙන්ම එය එකී නිෂ්පාදන බලවේග ලෝක පරිමාණයෙන්ම සමාජගතකරණය කරයි." මෙලෙස සමාජගතකරණය වූ නිෂ්පාදන බලවේග හා පුද්ගලික දේපොල අතර විෂම විරෝධයට අනුව සමාජයේ ප්‍රධාන විසංවාදයය. මේ අතුරු විසංවාදය - අතුරු ප්‍රතිවිරෝධය ප්‍රධාන ප්‍රතිවිරෝධය වන පරිසරය හා මානවයා අතර ප්‍රතිවිරෝධය - එනම් නිෂ්පාදන බලවේග වල වර්ධනයට බාධා පවුණුවන අතර එහිම ඵලයක් ලෙස දේපොල අයිතියද සමාජගතකරණය විය යුතු බවද, නිෂ්පාදනය සැලසුම්කරණය විය යුතු බවද සමාජගතකරණයවූ බලවේග පේරුම් ගනී. ධනවාදයෙන් සමාජවාදය බිහිවන්නේ එය අනිවාර්ය වන්නේ එහෙයින් බව සම්භාව්‍ය මාක්ස්වාදී ප්‍රවාදයයි. (මෙය පසුව දීර්ඝව සලකා බලමු.) මේ අනුව ධනවාදී සමාජය තුල සමාජ විඥානය ඇතිවන්නේ වෙළඳ පොළ හරහා නොව සමාජගතකරණය වූ නිෂ්පාදන බලවේග වල ක්‍රියාකරුවන් වූ නමුත් ඒහාගේ අයිතිය අභිමිවූ නිර්ධන - කම්කරු පන්තිය තුල බව සම්භාව්‍ය මාක්ස්වාදය ප්‍රකාශ කළේය. (මෙය ලෙනින් ප්‍රතික්ෂේප කළේය.)

මේ ආර්ථිකවාදී උණිත දෘෂ්ටීන් දෙකම තුල වැදගත් ලක්ෂණ මෙන්ම එයට පැහැදිලි කර ගත නොහැකි දේද ඇත.

මෙයේ හෙයින් සංස්කෘතිය මූලික ලෙස ගන්නේ විසින් සමාජයක සමාජ විඥානය වූ කලී ජාතික විඥානය යයි ප්‍රකාශ කරති. ආර්ථිකමය කරුණු විසින් ධනවාදයද, සම්භාව්‍ය මාක්ස්වාදයද පැහැදිලි කරන කරුණු ජාතික විඥානයට උපාංගය කර පැහැදිලි කරති.

ජාතික විඥානය කුමක්ද ?

ජාතිය හා ජාතික භාවය (විඥානය) මානව සමාජයේ පවතින යථාර්ථයක් බවත් එහි පැවැත්ම හා වර්ධනය පිළිගත යුතු බවත් හරිත සමාජ විද්‍යාවේ පදනමකි. මානව සංස්කෘතියක ප්‍රධාන වැඩ කොටසක් ස්වයං ජාතික විඥානය විසින් උසුලනු ලබයි. එය සංස්කෘතියේ කීරක සංරචකයක් ලෙස ක්‍රියා කරයි. හරිත සමාජ විද්‍යාවට අනුව ජාතික විඥානය හුදු මානසික ක්‍රියාවලියක්ට නොවේ. එය අවියෝජනීය ලෙස ද්‍රව්‍යමය හා පාරිසරික පදනම් සමඟ වෙලී ඇත. ජාතික විඥානය සමාජයක් මානව අභ්‍යන්තර සාධක හා බාහිර සාධකවල විවිධත්වයේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින මානසික භාවිතයක් ලෙස හරිත සමාජ විද්‍යාව හඳුන්වයි.

අභ්‍යන්තර සාධකය -

සමාජයක ජාතික විඥානයට තුඩුදෙන අභ්‍යන්තර සාධකය එක් අතකින් මානව පිවිතේ විවිධත්වයය. මානවයාගේ භාවිතික හා ජානමය අංග ලක්ෂණ විසින් මේ විවිධත්වය ලෝකය පුරාවට, පරම්පරාවෙන් පරම්පරාවටද රැගෙන යයි.

අනෙක් කරුණු වඩා වැදගත් වූවකි. එනම් මානසික සාධකයය. එක් අතකින් සන්නිවේදනය මානවයාගේ මූලික අවශ්‍යතාවයකි. එහෙයින් බිහිවූ හොදම භාෂාව මානව පැවැත්මේ මූලික සමාජ සබඳතාවයකි. එය මානසික ලෙස මානවයා සමාජමය ලෙස බැඳ තබන අනුලංසනීය සබඳතාවයකි. එමෙන්ම ආධ්‍යාත්මික පැවැත්මද මූලික මානව අවශ්‍යතාවයකි. එහෙයින් පුද්ගලික මෙන්ම සාමූහිකවූත් ඇදහිලි මොනවත් පැතිර ගොස් ඇත. ආගමික චකවාදය හා සාමූහික ඇදහිලි හා ඒ අනුසාරයෙන් ගොඩනැගෙන නිර්මාණ - පරිභෝජන ක්‍රියා - සිරිත් විරිත් පුලුල් සමාජ මානසිකත්වයක් ජනිත කරයි. මෙය හොදම සන්නිවේදන මාධ්‍යය වූ භාෂාව සමඟද බැඳී සංයෝජනය වේ.

මෙලෙස භාෂාමය හා අභාෂාමය ලෙස ගොඩනැගෙන සමාජ මානසිකත්වය ජාතික විඥානයේ අභ්‍යන්තර සාධක තුල කීරණාත්මක ව ක්‍රියාත්මක වේ.

බාහිර සාධකය:

බාහිර සාධක වූ තලී පරිසරයය. දේශගුණය-භූගෝලීය සීමාවන්, පිට වර්ග හා ස්වීපක් විසින් ස්වයංපෝෂිත පරිසර පද්ධති ගණනාවක් බිහිකර ඇත. සමස්ථ ලෝක පරිසර පද්ධතිය තුල විවිධ පරිසර පද්ධතිවල ස්වයං පැවැත්ම සමස්ථයේද අවශ්‍යතාවයකි. පිටමය වශයෙන් ඇතිවන

.....

ඔනව විවිධත්වය හඟව හා ආගමික මතවාද වුව ගොඩනැගෙන්නේ පරිසර ද
විඥානය සඳහා වන බාහිර සා ධනය ගොඩනැගෙන්නේ මෙලෙස පරිසර පද්ධතිවල වි

අභ්‍යන්තර හා බාහිර සා ධනවල සම්බන්ධය

පරිසර පද්ධති විවිධත්වය හා ඔනව සමාජ විවිධත්වය එකිනෙක සා බැඳී ඇත. බැඳීම සිදු කරන්නේ පරිසරයෙන් ස්වීපත් උකහා ගැනීම-පරිභෝජනය-අපහරනය ලෙස වූ නිෂ්පාදන හා පරිභෝජන විධික්‍රමය අනුවය. එනම් සංවර්ධන රටාව අනුවය. කවදුරටත් එකී සංවර්ධන රටාව තුල දේපොල හා සම්පත්වල අසමාන විසිරීගොස් ඇති ආකාරය අනුවය. මේ අනුව සංවර්ධන උපාය මාර්ග විසින්ද ජාතික විඥානය නිර්මාණය කරලීමේදී කීරන සා ධනයන් වේ. එය පෙරලා අභ්‍යන්තර හා බාහිර සා ධන දෙකේ සමබරතාව ලෙසද එමෙන්ම පෙරලා ඒවා වෙනට බලපාන්නේ ලෙසද ක්‍රියාකරයි.

අභ්‍යන්තර හා බාහිර නොවන උකහා ගැනීම්

වෙනත් විවිධ පිට ඔනව විමේචිත විසින්ද, භාෂාවන් හා ආගමික මතවාද විසින්ද, ආධිපත්‍යවාදී පරිසර පද්ධතිවල පැතිරීම විසින්ද, සංවර්ධන ක්‍රියාවලියේ පැතිරීම විසින්ද ආක්‍රමණික ලෙස හෝ එසේ නොවෙමින් ජාතික විඥානයන් අත්කරගනියි, මුසුවේ, වර්ධනය වේ.

මේලෙස ජාතික විඥානය යනු හුදු ඔනසිනස්වයන් නොව ඔනව පරිසර පද්ධතිවල විවිධත්වයේ සංවර්ධන උපායවලියේ හා අනුහලනයේ සමාජ ඔනසින ප්‍රතිඵලයකි. එය මතුවන්නේ භාෂාව හෝ ආගම මුල්කරගෙන වුවද සම්පූර්ණයෙන් ලෙස එයට පදනම් ගරණාවන් ඇත. එමෙන්ම එය සංස්කෘතියක ප්‍රධානම විටෙන සම්පූර්ණයෙන් ලෙසම වූ ක්‍රියාවලියකි.

ඓතිහාසික සම්පූර්ණයේදී පරිසර පද්ධතිවල විවිධත්වය පරිසරය පෙරට ගෙනයන ස්වභාවික උපායවලිය වුවාසේම, පිට සම්පූර්ණයේදී පිට විවිධත්වය පිටය පෙරට ගෙන යන ස්වභාවික උපායවලිය වූවාසේම, ඒ හා සමග බැඳී ඔනව සම්පූර්ණය අර්බුද වලින්, පෙරට ගෙන යන්නේ සංස්කෘතික-ජාතික-විවිධත්වයයි. මෙය හරිත සමාජ විද්‍යාවේ පදනමයි.

ධනවාදයේ ජාතික අර්බුදය

ධනවාදය තුල පැවැතිය හැකි එකම සමාජ විඥානය වෙළඳපොළ සමාජ විඥානය පමණි. එහෙයින් ධනවාදය ඔනව පරිසර පද්ධතිවල අභ්‍යන්තර වශයන් විවිධත්වයන් විනාශ කරමින් සංවර්ධන උපායවලිය තුළ එවට ධනවාදී සුපිරි පරිසර පද්ධතිය හා සංස්කෘතික-දේශපාලනික ආධිපත්‍යයට ලෝකය භූගතකරගෙන සිටි. ධනවාදී අධිරාජ්‍යවාදයේ එන් ප්‍රභාසදී එය අවි බලය මතම පමණක් සිදුනල ආධිපත්‍යයන් වූ අතර අදවන විට එය අභි හා ප්‍රාර්ථනය මූලික කරගත ආධිපත්‍යයන් වී ඇත. ධනවාදී වෙළඳපොලෙහි අධිපති සංස්කෘතිය වන ඇන්ග්ලෝ-සැක්සන් සංස්කෘතිය එසේ ආධිපත්‍යය දරාගෙන සිටින්නේ 'සංවර්ධනයේ' කැරටි අලය ඉදිරිපත් කරගෙනය. පිඩිත ලෝකයෙන් හා අනාගත පරපුරෙන් සූරාගන්න ලද අති විශාල සම්පත් වියදම් කරමින් මේ සංවර්ධන කැරට් අලයේ ඖෂධීය කටු ලෙහෙසියට පිඩිත ලෝකයට කෑ කිරීමට වුවද සංවර්ධන අර්බුදය පුපුරා සද්දි ධනවාදයේ ජාතික අර්බුදයද පුපුරා සම්පන්න. එන් කැන්තයින් අයරඒන වූ අධිපති සංස්කෘතිය හා ආර්ථික වර්ධනය ඇනහිටීම විසින් පීඩන රටවල් තුලට ජාතික විවිධත්වය මතුවීම අනිවාර්ය වී ඇත. ධනවාදය සංවර්ධන අර්බුදය ඇරඹුන විට අර්බුදය විසඳා ගැනීමට කැක්කලේ ජාතික අනුහලන ක්‍රියාවලියක් විසිනි. එක්සත් ඇමෙරිකාව-එක්සත් රාජ්‍යය-එක්සත් නැගෙනහිර ආසියාව ආදිය සටන් පාඨ විය. එහෙත් අර්බුදය උග්‍රවන්න ගෙම්ම ජාතික අවහලනය ප්‍රධාන ක්‍රියාවලිය වෙමින් පවතී. එය වඩාත් ප්‍රතිගාමී හා ආධිපත්‍යවාදී වෙනට යොමු වූ නව නාසිවාදයක් හා පැසිස්ට්වාදයක් බිහිකරනු ඇත.

මෙය මෙලෙස වෙන්දී පීඩිත ලෝකය තුලද ඉහත ක්‍රියාවලීන් දෙකම සිදුවේ. තෙල් සම්පත මූලික කරගෙන මතුවුවද ඉස්ලාම් මූලධර්මවාදය ප්‍රධාන ක්‍රියාවලියක් වී ඇති අතර ඉන්දියාව වැනි රටවල හින්දු මූලධර්මවාදයද පැතිර යයි. භාෂාව මුල්කරගත් ජාතික අවහලනයනට වඩා ආගම මුල්කරගත් ක්‍රියාවලියද වේගවත් වෙමින් පවතී. නමුත් වෙනත් සංවර්ධනයේ අර්බුදය වේගවත් වන විට පීඩිත රටවල ජාතික විවිධත්වය අයිතිකම් මතුවෙමින් ඇත. ජාතික විඥානයන් අයිතිකම් වර්ධනය වීම හා ඒවා ආඩිවාදයන් බවට පරිවර්තනය වීම පීඩිත ලෝකයේ දේශපාලන අභියෝගය. ලෙස

පැන නගී. මෙලෙස සංවර්ධනයේ අර්බුදය ලෙස පැන නැගෙන ජාතික විඥානයන් ධවල ධනපති ආධිපත්‍යයට එරෙහිව මෙහෙයවමින් විකල්ප සංවර්ධනයන් බිහිකර ගැනීමට පදනමක් ලෙස ජාතික තල හැකිවීම මත පීඩිත ලෝකයේ විමුක්තියන් ලෝකයේ ගැලවීමත් කිරණය වේ.

<u>මාක්ස්වාදය ජාතිය දුටු අයුරු:</u>

සම්භාව්‍ය මාක්ස්වාදය ජාතික විඥානය හා ජාතිය පිළිබඳ සංකල්පය දකින්නේ සංවර්ධනයට එනයි නිෂ්පාදන බලවේගවල වර්ධනයට සාපේක්ෂවයි. එනයින් එය ජාතික විඥානය සඳහා වන මානව පරිසර පදනම් ඉවත් කරයි. එසේ අනුව ප්‍රාථමික කොමියුනිස්ට් (ශ්‍රීත) හා වහල් සමාජ (රෝම) කැල පැවති, ගණ ගෝත්‍ර, නිෂ්පාදන බලවේගවල වර්ධනය විසින් වැඩවසම් යුගයේදී අනුකලනය වී ජාතිකත්වය බිහි විය. ධනවාදී වෙළඳ පොළ විසින් නිෂ්පාදන බලවේග හා සුවපහරුව කවදුරටත් වර්ධනය කලේ ජාතිකත්ව කිහිපයක් එක් වීමෙන් ජාතිය බිහි කළේය. මේ අනුව පොදු භාෂාවක් - සංස්කෘතියක් - ආර්ථිකයක් සහිත ජාතිය නවැති සංකල්පය බිහිවූයේ ධනවාදී ක්‍රමය තුලය. ධනවාදය විසින් කවදුරටත් වර්ධනය වෙමින් ජාතික සීමා පවා අධිරාජ්‍යවාදී යුගය තුල අභෝසි කරයි. අවසාන නයේ සියළු ජාතීන් එක්වී 'මානව ජාතිය' සමාජවාදී ජාත්‍යන්තරවාදය තුල බිහිවේ." සම්භාව්‍ය මාක්ස්වාදයේ වන සමාජ සංවර්ධන න්‍යාය තුල ජාතිය හා ජාතික විඥානය පැහැදිලි තලේ ඒ ආකාරයටය.

මෙකී සමාජ සංවර්ධන න්‍යාය යුරෝපය තුල ජාතිය බිහිවීම සම්බන්ධයෙන් නම් සමස්ථයක් ලෙස වලංගුය. පීඩනකාරී පරිසර තත්ව විසින් සාමූහිකත්වය ගොඩනැගුනේ පොදු භාෂාව - ඇදහිම් සහිත ජාතික සංස්කෘතිය ගොඩනැගුනේ නිෂ්පාදන බලවේගවල රහිය දියුණුව නිසා පීඩිත රටවල් වලින් සිය දේශ සහ තුලින්ද සිදුනල බරපතල මානව පරිසර සූරාකෑම නියාය. යුරෝපය තුල අන් සියල්ල මෙන්ම ජාතිය බිහිවූයේද මේ මානව පරිසර පද්ධතිවල සූරාකෑම විසිනි. එය හුදු නිෂ්පාදන බලවේග වල වර්ධනයක් තුල සිදුනල ක්‍රියාවලියක් නොවීය. යුරෝපීය සමාජ සංවර්ධනයේදී සිදුවූ මේ සූරා-කෑමේ ක්‍රියාවලිය පිරිසිදු දැන ගැනීමට නොහැකිවීම සම්භාව්‍ය මාක්ස්වාදයේ මූලික දුර්වලතාවයක් වෙයි.

එමෙන්ම විශේෂයෙන් ආසියාව තුල ජාතිය හා ජාතික විඥානය බිහිවූයේ නිෂ්පාදන බලවේගවල වර්ධනය මතම නොවේ. මානව පරිසර පද්ධතියේ විවිධත්වයද විසිනි. සැබැවින්ම යුරෝපය තුල ජාතිය බිහිවීමට පීඩිත ලෝකයේ ජාතිය විනාශ කරනු ලැබීය. සමාජ සංවර්ධන න්‍යාය එහෙයින් සමස්ථයක් ලෙස පීඩිත ලෝකයට වලංගු නැත.

එහෙත් මාක්ස්වාදී සංස්කෘතිය තුල බිහිවූ ලෙනින්, ලෙඩ්, කැස්ත්‍රෝ වැනි බලවේග වේ ක්‍රියාවලිය අරබයා වඩාත් ගේ දුටුය. එහෙත් සම්භාව්‍ය මාක්ස්වාදය පීඩිත ජාතීන්ගේ ස්වයං නිර්ණ අයිතිය පවා දුටුවේ අතිශය චිනෘත න්‍යායාත්මක පදනමක සිටය. 'ධනවාදය පැතිරයාම විසින් අධිරාජ්‍යවාදී යුගයේදී පීඩිත රටවල වැඩවසම් වංශ බිඳවැටෙමින් ජාතියක් බිහිවීමේ පූර්ව ආර්ථික කොන්දේසි ඉටුවර ඇත. පීඩිත රටවල අධිරාජ්‍ය විරෝධී අරගලය නම් බිහිවන්නට යන නව ජාතිය පිළිබඳ අරගලයය. එහෙයින් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ බුල් යුගයේ අවස්ථාවක් ලෙස මෙසි ජාතීන්ගේ බිහිවීමට එරෙහිව ධනපතීන් විසින් ගෙන යන පීඩනයට එරෙහිව එකී ජාතියේ ස්වයං නිර්ණය පිළිබඳ අයිතියට පක්ෂ විය යුතුය. සමාජවාදය පිළිබඳ අරගලය න්‍යායාත්මකව එළැඹෙන්නේ ඉන්පසුවය. එහෙත් සාපේක්ෂ ලෙස පසුගාමී රටවල සමාජවාදී අරගලයද ජාතිය විමුක්ති අරගලය සමඟ පෙරට යා යුතුය." සම්භාව්‍ය මාක්ස්වාදී මතය එයය.

පීඩිත ලෝකයේ ජාතිය බිහිවූයේ ධනවාදයටනලින්ය. යුරෝපයේ මෙන් ආසියාවේ-අප්‍රිකාවේ ඇමෙරිකාවේ පැරණි ශිෂ්ඨාචාර ග්‍රාමීණ ක්‍රියාන-වහල් වැඩ වසම් යුග ලෙසම පසුතර සිදුවීම් නැත. පීඩිත රටවල සිදුවූයේ උපත ලබන ජාතික අරගලයන් නොව අභිවිකරණ ලද ජාතිය නැවත ලබා ගැනීමේ අරගලයකි. ධනවාදය පීඩිත රටවල ජාතිය පිළිබඳ සංකල්ප පරිවර්තනය කලා මිස කිසි තලෙක නිෂ්පාදනය නොවීය. එහෙයින් ධනපතිත්‍රමය කිසිවෙකු නැත සිය ස්වයං නිර්ණය සඳහා අයිතියක් සෑම ඓතිහාසික අනන්‍ය මානව පරිසර පද්ධතියක්ම සතුය.

අනෙක් අතට ගොඩනැගෙන ධනවාදී වර්ධනය-නිෂ්පාදන බලවේගවල වර්ධනය - විසින් සමස්ථ

.....

ලෝකයට එහෙ ශාසියන් බවට පත්කරලීමට නොහැකි සංවර්ධනයේ අවිව-ජීව මානසික සීමා විසින් එවැනි ප්‍රියාවලියක් සිදු නොවිය හැක්කක් බවට පත්කර ඇත. අසීමිත භෞතික සංවර්ධනයක් නොවැතිනම් ධනවාදයට සමස්ථ ලෝකයම දිගින් දිගටම එක් ජාතික විඤ්ඤාණයක ආධිපත්‍යයකට යටත් කල නොහැක. ඒ අනුව 'මානව ජාතිය' බිහිවීමට පෙරම ධනවාදය බිඳවැටීම සඳහා ද්‍රව්‍යමය පදනම් ගොඩනැඟී ඇත.

එහෙයින් ධනවාදයෙන් පසු භෞතිකයේ අවශ්‍යතා නොන්දේසියක් වනුයේ ජාතික විඤ්ඤාණවල ආත්‍රමණිකත්වය මැඩලීම හා මානව සංවර්ධනය පිළිබඳ සමස්ථ ආකල්ප වර්ධනයයි. එමෙන්ම ජාතික විඤ්ඤාණවල විවිධත්වය එකවිට පිලිගැනීමයි. පෝෂණය කෙරුමයි. එය මැනව සමාජයේ විවිධත්වය වර්ධනය විරස්ථායිභාව සහතික කරයි.

මාක්ස්වාදී සංස්කෘතිය විසින් අවිඤ්ඤාණව පෙරට ගෙනගිය පීඩිත ජාතීන්ගේ විමුක්ති අරගලය සවිඤ්ඤාණිකව පෙරට ගෙනයාම අද අවශ්‍යතාවයි.

<u>ජාතිය හා ජාත්‍යන්තරවාදය</u>

ධනවාදය මූල ප්‍රත්‍යාගමනය ජාත්‍යන්තරවාදයක් නැත. ඇත්තේ ඇන්ග්ලෝ සැක්සන් ජාතිවාදයේ ආධිපත්‍යයයි. මේ ජාතිවාදය පරාජය කරලීම අද පීඩිත ලෝකයේ අවශ්‍යතා අරගලයයි.

හරිත සමාජවිද්‍යාව ජාතිය හා ජාත්‍යන්තරවාදය දකින්නේ එකිනෙක් අනෙකාට පෝෂණය වන ප්‍රතිබද්ධ යුවලක් ලෙසයි. ඒවා අතර වකුටුවිට සබඳතා පවතී. ධනවාදය මේ ස්වභාවිකව පැවතිය යුතු සබඳතාවය බිඳ දැමූ අතර එය එක් ජාතියක ආධිපත්‍යයට ලක් කළේය. ධනවාදයේ ජාත්‍යන්තර අර්බුදය එයයි.

ජාතියක සීමා පිළිබඳවද විවිධ මත පවතී. වෙනම රාජ්‍යයක් ලෙස පැවතිය හැක්කේ, වෙනම් රාජ්‍යයක් තුල ස්වයංපෝෂිතව පැවැතිය හැක්කේ තවර සබඳතා මතද යන්න සලකා බැලිය යුතුය. ජීනුම් දන්ඩ ගණවද, ශ්‍රීයද ආදර්ශයද ලෙස විවිධ අදිටන් තරහ සැපයී ඇත.

ඓතිහාසිකව අනන්‍ය මානව පරිසර පද්ධතියක් පවත්වාගෙන ගිය සෑම ජාතික විඤ්ඤාණයකටම වෙනම රාජ්‍යයක් ලැබීමේ ස්වයංනිර්ණය පිළිබඳ අසීමිත හරිත සමාජ විද්‍යාව පිලිගනී. එමෙන්ම මේ මානව පරිසර පද්ධතිය තුලද විවිධ ජාතික විඤ්ඤාණය විශේෂත්‍ව පවතින බවද ඒ සෑමටම සමස්ථ පරිසර පද්ධතිය ගැන සලකා බලමින් පාරගවීම වූ පරිසර සබඳතා ගැන සැලකිලිමත් වූ ස්වයං පාලනයක් තිබිය යුතුවේ.

එමෙන්ම අන්‍යය රාජ්‍යයන්ද කම් සීමා සහස් කරගත යුත්තේ සමස්ථ මානව පරිසර පද්ධතිය ගැන සැලකිලිමත් වෙමින් සහ ගරු කෙරුමෙනි. ජාත්‍යන්තරවාදය විය යුත්තේ එයයි.

ධනවාදී ආධිපත්‍යය සංස්කෘතිය තුල හා පවතින අසීමිත සංවර්ධනය තුල මේ ස්වභාවික ජාතික සබඳතා ලබාගත නොහැක. ධනවාදී ආධිපත්‍යය විසින් විනාශකර ඇති මේ සබඳතා ස්වභාවික හා විරස්ථායි තල හැක්කේ විකල්ප සංවර්ධනයකට පමණි. එසේ නම් පමණි.

සමස්ථ ලෝකය පුරාම සිදුවිය යුතු එවැනි විකල්ප සංවර්ධනයක ආරම්භය පදනම් පීඩිත ලෝකයේ ජාතික විමුක්ති අරගලයයි.

<u>රාජ්‍ය හා සමාජ බලය</u>

ඓතිහාසිකව මානව සමාජය තුල බිහිවූ රාජ්‍යය නැමැති සංස්ථාව කුමක්ද යන්න මූලිකව හැදෑරිය යුතුය.

හරිත සමාජ විද්‍යාවට අනුව රාජ්‍යය යනු මූලික වශයෙන් නිෂ්පාදන - පරිභෝජන චක්‍රය සඳහා පරිසර පද්ධතිවලින් සම්පත් සූරාගන්න යන්ත්‍රනයයි. බලය උපදින්නේ සූරාකෑම විසිනි.

වර්තමන් හා අනාගත මානවයා වෙනුවෙන් සම්පත් සූරාගැනීමක් හරහා අතිරික්තයක් ගොඩනැඟුම විට එම අතිරික්තයේ බලය පරිහරණය කරමින් ආර්ථික හෝ සංස්කෘතික පීඩාකාරී හෝ මෙහෙයවීම ආධිපත්‍යයක් පවත්වා ගැනීමට ඉඩ ඇත. එමෙන්ම සමාජ බලයෙහි ප්‍රත්‍යාගමනයක් ලෙසද විටෙක පුද්ගලික බ්ලැක්මේල් ලෙසද මෙම අතිරික්තය ක්‍රියා කල හැක. පරිසර පද්ධතිවලින් සූරාකෑමක් නැත්නම් රාජ්‍යයක්ද නැත. එය කළමණාකරන හා සංස්කෘතිකමය පාලනයක් පමණක් වනු ඇත.

ධනවාදය රාජ්‍යය ලෙස ප්‍රත්‍යාගත කරන්නේ සිය වෙළඳ පොළ ආධිපත්‍යයටයි. එයිනිදු

එහම වටිනාකම ලබන වෙළඳ ප්‍රාග්ධනයෙහි ක්‍රියාකාරිත්වයටය. මෙය වුවද ඒනාධිකාරී වෙළඳපොළ තුල සූරාකෑමේ ප්‍රාග්ධනය ආකාර දෙකකින් යුතුය. එනම් වෙළඳ ප්‍රාග්ධනය හා යුධබලය ලෙසය. මේ ප්‍රාග්ධනයටම යටත්ව ධනවාදී රාජ්‍යයේ තෙවැනි ආධිපත්‍යය ගොඩනැඟේ. එනම් මහවාදී ආධිපත්‍යයය. ධනවාදී රාජ්‍යය සැදුවිලන්නේ මේ ආකාර තුනෙනි.

වෙළඳ ප්‍රාග්ධනය සංවර්ධනයෙහි විරස්ථායිකාව පිළිබඳ ධනවාදී සමාජයට සාහසික කරදෙයි. යුධබලය තෙලින්ම විනාශකාරී ශක්තිය ලෙස සමාජ අර්බුදවලින් ගැලවීමේ මඟ ලෙස පෙනී සිටියි. සන්නිවේදන ශක්තිය හරහා ධනවාදී සංස්කෘතිය ලාභය හා විටෙන බිය මුල්කරගත් මහවාදී ආධිපත්‍යය දරනු ලබයි. ධනවාදී රාජ්‍යය සතු මේ තවර සාධකයන් වුව තීරණාත්මකව බිඳ වැටුන විට ධනවාදී රාජ්‍යය බිඳ වැටේ.

සංවර්ධනයෙහි සීමා විසින් වෙළඳ ප්‍රාග්ධනය බිඳලන විට රාජ්‍යයෙහි එක් අවයවයක් අභියෝග නෙරේ. එයින් මහවාදී ආධිපත්‍යයද ගිලිහී යමින් සමාජ අරගලයන්ද ජනිත වේ. මෙවිට ධනවාදය සිය යුධ ශක්තිය තීරණාත්මකව යොදවයි. මේ ක්‍රියාවලිය ධනවාදයෙහි ඉහි සහය පුරාම සිදුවුනු ක්‍රියාවලියයි. එහෙත් චක්මනෙහි මහත පරිසර පද්ධතියෙහි සමස්ථාය ධනවාදයෙහි උපරිම ප්‍රාග්ධනයට – මහවාදී ආධිපත්‍යයට හා යුධ බලයට එරෙහිව නැඟී සිටිනු ඇත. ධනවාදී රාජ්‍යය බිඳ වැටෙන්නේ එයට ප්‍රතිවිරුද්ධ වූ භෞතික බලයන් ගොඩනැඟී කාරක නිෂ්පාදිකාව ටැඩිවිමෙන් නොව සවස්ථා විසින් ගිල ගැනීමෙනි. සෙසු සෑම රාජ්‍යයන් පෙරලා දැමීමකින් ධනවාදී රාජ්‍යය පෙරලා දැමීම වෙනස් වන්නේ එතැ නිති.

යම්හාවය මාක්ස්වාදය රාජ්‍යය දකින්නේ දේපල සබඳතා රැකගැනීම සඳහා ඒකීයාසිකව බිහිවූ මර්දන යන්ත්‍රනයක් ලෙසය. "මේ මර්ධන යන්ත්‍රයේ පදනම පන්ති පීඩනයයි. ධනපති රාජ්‍යය ප්‍රනාගවන්නේ නිත්‍ය යුධහමුදාව හා ඒ හා බැඳුනු නීති පද්ධතිය විනිසි. ප්‍රාග්ධනයෙහි සිමිතම ධනපති පන්තිය සතුවුවද ප්‍රාග්ධනයෙහි ක්‍රියාකරුවා සමාජකරණය වූ නිර්ධනිත්වීම විසින් ධනපති රාජ්‍යය නිර්ධනයාගට අත්පත් කරගත හැක. සන්නද්ධ භෞතික බලයක් විසින් එය වලක්වයි නම් එය නිෂේධ කරලීම සඳහා ප්‍රතිභෞතික බලයක් නිර්මාණය කර යෙදිය යුතුය. පන්ති පීඩනය අහෝසිවූ විට රාජ්‍ය අහෝසි වේ.

ප්‍රායෝගික සෝවියට් හා සියඵ මධ්‍යගත සමාජවාදී රාජ්‍යවල බලය අල්ලා ගැනීම පැහැදිලි කලේත් එය පවත්වා ගැනීමේ උපායවලිය ලෙස යොදා ගන්නේත් ධනපති භෞතිකබලයට කාරක නිෂ්පාදා සිතා වයට එරෙහිව වඩා දියුණු යුධ අවි හා කාරක නිෂ්පාදිකාවයන් පිළිබඳ උපාවලියයි. ධනපති ක්‍රමය සමඟ ඒ අර්ථයෙන් කරගෙන ගල නොහැකි බව ඔප්පු වූ අතර පන්ති පීඩනය අහෝසි වුවද එය නිලධාරී පීඩනය බවට පත්වී රාජ්‍යය වඩාත් ශක්තිමත් වූවා මිස දියවී ගියේ නැත.

සම්භාවය මාක්ස්වාදයට මෙය ප්‍රශ්නයක් වුවද හරිත සමාජ විද්‍යාවට එය ප්‍රශ්නයක් නොවේ. රාජ්‍යය පවතින්නේ මහත පරිසර පද්ධතිය සුරාකෑම නිසාය. ධනවාදයට වඩා හොඳින් එය සිදු කරලීමට සැලසුම්ගත බාවයක් – මධ්‍යගතභාවයක් – සමාජවාදයක් ඉඩ නොදේ. සීමිත පරිසර පද්ධතියක කාරක නිෂ්පාදා සීමාව වර්ධනය කල හැක්කේ සීමා සහිතවය. රාජ්‍යය නම් නෙසේවත් දියැවී වන්නේ නැත.

අතීතය තුල සෝවියට්–චීන–ඉන්දු චීන– නිදහස වැනි අත්දැකීම් වල සමඟර අංග පමණක් අද දිනයේ වැදගත් වේ. ප්‍රධාන වශයෙන් ධනවාදී රාජ්‍යයේ මහවාදී ආධිපත්‍යය බිඳලීමේ තලාව අරභයා, ධනවාදයට එරෙහිව සමස්ථාය මෙහෙයවනවා විනා එයට ප්‍රතිපක්ෂව වඩා දියුණු භෞතික බලයක් ගොඩනැංවීම සිදුකල නොහැක්කකි. ධනවාදයට එරෙහි අරගලයේ චක්මන් ස්වරූපයක් ගැන පසුව කවක් තරා කරමු.

<u>සමාජ බලය හා පුද්ගලිකත්වය</u>

සම්භාවය ලිබරල්වාදය තුල පුද්ගලිකත්වය හා පුද්ගල නිදහස මහත සමාජයෙහි ප්‍රාථමික ක්‍රියාවලියි ලෙස පිලිගෙන ඇත. ඒ සඳහා පුද්ගලික නිර්මාණාත්මකතා ව නායකත්වය ආදී ක්‍රියාවලීන් උදාහරණ ලෙස පෙන්වනු ලබයි. එහෙත් ධනවාදය මේ ලිබරල් මතවාදයන්ට පිවිසුනේ යුරෝපීයන් විසින් සිදුකල මහා සම්පත් කොල්ලය විසින් ගොඩගසාගත් භෞතික බලය විසිනි. අද දන්වා උතුරු දිග ලෝකයේ නියා ප්‍රජාතන්ත්‍රවාදයට හා ලිබරල් නිදහසට ඉඩකඩ ලැබී ඇත්තේ සූරාගත්ත

.....

ලද සවිපත් සෙග හියාය. ප්‍රායෝගික ලෙස ධනවාදය තුල ක්‍රියාවට නැගෙනුයේ පුද්ගලික වර්ධනය මුල්තරගත් අධිකාරීවාදී තරඟයකි. මේ අනුව අතිබහුතරයක පුද්ගල නිදහස අහෝසි වී ගොස් ඇත. ඌරුදිග ධනපති රටවල් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දකුණු දිග පිඩින රටවල ඒකාධිපතිවාදය හා ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය අතිවාර්ය වී ඇත. ධනවාදය තුල ප්‍රාග්ධන වයඹතාව විසින් පුද්ගල නිර්මාණශීලීත්වය හා මෙන්ම පුද්ගල නායකත්වයද මොටසර වීනාශ කරමින් ඇත. අල්පයනගේ පුද්ගලික වර්ධනය සමාර්ථයේ විනාශය බවට පත්වෙමින් ඇත. ධනවාදයේ පුද්ගල නිදහසේ යථාර්ථය එබඳුය.

සමාජවාද මාක්ස්වාදය සමාජ ප්‍රගමනයේ ලා විශ්වාසය තබනුයේ සාමූහික සමාජබලය මතය. ඉතිහාසය යනු සමාජ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයන් ලෙස විස්තර කෙරී ඇත. පුද්ගල නිර්මාණශීලීත්වයහා හා නායකත්වය ආදී ගුණාංගවලට සමාජවාද මාක්ස්වාදයේ ලැබී ඇත්තේ ද්විතීයක ස්ථානයකි. එහෙත් ප්‍රායෝගික මාක්ස්වාදී සංස්කෘතිය තුල මේ තරුණ අවධාරණය වී ඇත. එනම් මෙය පෙරලා දයලෙක්තික කර්ක ක්‍රමයේම වියංවාදයකි. සමාජබලය හා පුද්ගල බලය අතර පවතින දයලෙක්තික සබඳියාව විසින් පුද්ගල බලය සතු නිර්මාණශීලී නායකත්වය ආදිය පවා ද්විතීයක වී ඇත. එහෙත් සමහර අවස්ථා වන් පැහැදිලි කරගැනීම සඳහා පුද්ගල බලය ප්‍රාථමික කරගැනීමට ද සිදුවී ඇත්තේ දයලෙක්තික වියංවාදය නිසාය.

එමෙන්ම සමාජවාද මාක්ස්වාදය විශ්වාසය තබනුයේ සරල වූ සමාජබලය පිළිබඳ නොවේ. සමාජයේ ප්‍රධාන ක්‍රියාවලිය වන නිෂ්පාදන බලවේග වල වර්ධනයට අනුරූපී වූ සමාජබලය පිළිබඳවය. සමාජවාද මාක්ස්වාදය විද්‍යාත්මක වුයේද, මෙන්ඩලීඵ සමාජවාදයෙන් වියෝ වූයේද මේ තරුණ විසිනි.

තරුණ සමාජ විද්‍යාව සමාජයෙහි ඇති සමාජ සාමූහිකත්වය සමාජයෙහි අවශ්‍යතාවයන් ලෙස පිලිගනී. එය දැඩිව අවශ්‍ය වනුයේ නිෂ්පාදන බලවේග විසින් යටපත් කර පිටත්තරකරනය කරන සමාජ සාමූහිකත්වය පිලිබඳ අර්බුදයේදීය. එමෙන්ම දේපල අයිතිය හා පුද්ගලික වර්ධනය නොවන නිර්මාණශීලීභාව හා නායකත්වය යන පුද්ගල ගුණාංග සමාජ බල්යෙහි අත්‍යවශ්‍ය අංගයන් ලෙස පිලිගනී. මේ පුද්ගල බලය හා සමාජ සාමූහික බලය අතර ප්‍රතිබද්ධතාව සබඳතාවයන් දනිමු ලබයි. ඒවාට යුවිශේෂ කාවයන් සහිත චතුර්විධ ආහාර පවතී.

පරිසරය සමඟ එක්ව ගොඩනැගෙන පීව මානව සාමූහිකත්වය ධනවාදය නිෂ්පාදන බලවේග වලට යටත් තලේය. පෙරලා එය සමාජ සාමූහිකත්වය පුද්ගලික වර්ධනයෙන් විස්ථාපනය තලේය. තරුණ සමාජවිද්‍යාව පදනම් වන්නේ පරිසර සහජීවන පීව සාමූහිකත්වය මතය. එහෙයින් එය ධනවාදී නිෂ්පාදන බලවේග වලට මෙන්ට සමාජවාද මාක්ස්වාදයේ නිෂ්පාදන බලවේග තේරුම් කරගත් සාමූහිකත්ව යෙන්ද වෙනස් වේ. අහිමී කරන ලද ස්වභාවික සමාජ සාමූහිකත්වය නැවත ලබාගන්ම වෙනුවෙන් තරුණ සමාජ විද්‍යාව පෙනී සිටී.

<u>සමාජ ශ්‍රේණි:</u>

ධනවාදය තුල ආකෘර දෙකක සමාජශ්‍රේණීන් පවතී. පලමුව ආර්ථික පරිශෝජනය හා දේපොල අයිතිය විසින් ගොඩනැගෙන ශෝෂණ බලය විසින් එය සමාජය බෙදයි. දෙවැනිව එය සංස්කෘතික ආධිපත්‍යය විසින් ගොඩනඟන විඥානික ආධිපත්‍යය විසින් ද සමාජය බෙදයි. මෙලෙස ආර්ථික වූද සංස්කෘතික වූද පීඩනයන් දෙකක් එකවිට ධනපති ක්‍රමය තුල පවතී. ආර්ථික පන්ති පීඩනය මෙන්ම සංස්කෘතික පන්ති පීඩනයන් ද එය එකවිට කැටිකරගනී.

ධනවාදය විසින් මානව සමාජය අරභයා සිදුකරන ලද මේ බෙදීම් නොගොස් ධ්‍රැවීකරණය ධනවාදයේ මූලික සමාජ වියංවාදයයි. මානව සමාජයේ ප්‍රතිබද්ධතාව සබඳතා වෙනුවට එය ප්‍රතිවිරෝධතාව සබඳතා ආදේශ කර ඇත. ධ්‍රැවීකරණය කරලීම් නියාවෙන් විඥානය කරායන මානව සමාජය නැවත එසි ප්‍රකෘති ස්වරූපය කරාගෙන ඒවේ මානව අරගලය වෙනට හරින තරුණ සමාජ විද්‍යාව කැපවී ඇත. එය මානවයා විසින් පරිසරයටද, මානවයා විසින් මානවයාට ද එරෙහිව සිදුකර ඇති ධනවාදී බෙදීම් හා ධ්‍රැවීකරණයට එරෙහිව බිහි වූ සමාජ විද්‍යාවකි.

..../

සමිඝාවය මාක්ස්වාදය තුලද සමාජ ශ්‍රේණීන්ගේ පැවැත්ම පිලිගනී. එය සමාජය තුල සිදුවන සමාජ ශ්‍රේණීන්ගේ බෙදීම තීරණය කරන්නේ සමාජය ගි ප්‍රධාන අරගලය වන මානව පරිසර අරගලයට සාපේක්ෂවය. එනම් නිෂ්පාදන බලවේග වල වර්ධනයට සාපේක්ෂවය. ඒ අනුව සමාජය තුල වෙනත් සමාජ ශ්‍රේණීන් පැවතුන ද මූලික වන්නේ නිෂ්පාදන බලවේග වලට අදාල වන සමාජශ්‍රේණීන් පමණකි. එනම් ධනපති හා නිර්ධන සමාජ පන්තීන්ය. මෙයිනුත් යමාජ සංවර්ධනයේ ඓතිහාසික මෙකෙස් ඉටුකරන්නේ නිර්ධන නොහොත් කම්කරු පන්තීන්ය.

කම්කරු පංතිය ප්‍රධාන පංතිය වීමට මාක්ස් හේතු ගණනක් ඉදිරිපත් කරයි. – සමාජයේ පදනම හා ප්‍රධාන අරගලය වන නිෂ්පාදන බලවේග වල වර්ධනයට අනුව ධනපති ක්‍රමය බිඳලිය හැක්කේ ද, අනාගත සමාජය ගොඩනැගිය හැක්කේ ද සමාජකුරණය වූ නිෂ්පාදන බලවේග වල ක්‍රියාකරුවා වන කම්කරුවාය. එනම් කම්කරුවාගේ ගුණාත්මක අගයය. – වහල් යුගයෙන් පසු අහිමි වූ නිෂ්පාදනයේ සාමූහික ක්‍රමය ධනපති ක්‍රමය විසින් පැන්වරිකූල නැවත ජනිත කරනු ලබයි. ග්‍රමය පමණක් විකිණීමට ඇති කම්කරු පංතිය මෙලෙස ප්‍රමාණාත්මකව සාමූහිකව ධනපති ක්‍රමය තුල ජනිත වේ. එය ධනපති ක්‍රමය තුල ප්‍රමාණාත්මකට ද බහුතර සමාජ පංතිය වේ.
– තවත් නිපදවන දේ තමන්ට නොලැබීම විසින් කම්කරුවා තුල සමාජ මානසිකත්වයක් හටගනී. මෙය – ධනපති ක්‍රමයට එරෙහිව නැගී සිටින්නට ඔහු විප්ලවකාරී ලෙස මෙහෙයවන මානසික සාධකයය.
– මේ සියළු කරුණු විසින් ධනපති ක්‍රමය එනම් පුද්ගලික දේපල සබඳතා බිඳලීමේදී ද නිෂ්පාදන බලවේග සාමූහිකකරණය කර අනාගත ලෝකය ගොඩනැංවීමේදී ද වඩාත්ම ප්‍රගතිශීලී, අරගලකාරී හා විප්ලවකාරී වන්නේ කම්කරු පන්තියය.

මාක්ස්වාදී සංස්කෘතිය තුල බිහිවූ ලෙනින් කම්කරුවන් තුල ගෙතිකමය සාමූහිකත්වයක් ගොඩනැගුවද මානසික සාමූහිකත්වයක් ජනිතනොවන බව ප්‍රකාශ කලේය. නවීන නිෂ්පාදන බලවේග හා විද්‍යාව මෙන්ම මෙහි නිර්ධන පන්තියේ විඥානයද කම්කරුවාට පිටතින් රැගෙන එන බව ප්‍රකාශ කලේය. විප්ලවවාදී පන්ෂය මෙහි ක්‍රියාවලියේ හිසමුවාය. පොදුවේ මාක්ස්වාදී සංස්කෘතිය තුල සිදුවූ සෑම විප්ලවයක්ම කම්කරු පන්තියේ මූලිකත්වයෙන් සිදුවූ එවා නොවීය.

මේ අනුව සමිඝාවය මාක්ස්වාදී මතය මාක්ස්වාදී සංස්කෘතිය තුලම නිශේධනය වී ගියේය.

භෞතික සමාජවාදය ආර්ථික පීඩනය විසින් පමණක් සමාජපරිනාමී බෙදෙන බවද ඒ අනුව පමණක් සමාජ විඥානය බිහිවන බවද පිලිනොගනී. එය ආර්ථික උනිතවාදයකි. එමෙන්ම ආර්ථිකය තුලද නිෂ්පාදන බලවේග වල වඩාත්ම දියුණු කොටස ලෙස ගොවීන් – අත්යන්ත්‍ර ශිල්පීන් ආදීන් සිටියදී පැන්ටරි කම්කරුවා නවීකෙරුම පිලිගන්නේ ආර්ථික උනිතවාදය තවත් උනනය කරලීමක් ලෙසය.

භෞතික සමාජ විද්‍යාවට මුලිකවම මේ නිෂ්පාදන බලවේග පිලිනොගනී. පවතින නිෂ්පාදන බලවේග කාර්මිකරණ සමාජමය ලෙස පහත සඳහන් විකෘතීන් කැටිතරගනී.

– පළමුව එය ගීව නිෂ්පාදනය වෙනුවට අගීව පදිවර්තන මූලික කරගැනීම විසින් මානව අවශ්‍යතාවයන් විකෘති කරයි.
– දෙවනුව එය මානවයාගේ ග්‍රමය සතු වටිනාකම වෙනුවට බලහත්කාර ආදේශ කරයි. එයින් මානව ගීව ක්‍රියාවලිය නිෂ්ඵාදනයෙන් විසුන්න කර මානව නිර්මාන ක්‍රියාවලිය අඩපන කර මානව ගීව අර්බුදයක් ජනිත කරයි. එමෙන්ම අතිවිශාල මානව ප්‍රතිභාසයක් නිෂ්පාදනයෙන් පලවා හැර විරැකියා බලවේගයක් කනයි. ප්‍රමාණාත්මකව ධනවාදය තුල වැඩිව මෙහි ජනනොවය වන අතර අසිමියාව වැඩිම ඔවුන් අතරය.
– තෙවනුව පවතින කාර්මාන්ත ගීවමය සාමූහිකත්වය අවසන් කරයි. පැන්ටරි කම්කරුවා තුල ජනිතවන්නේ සුදු මානව එකතුවක් මිස ග්‍රමය විසින් බැඳුනු ගීව මානසික සාමූහිකත්වයක් නොවේ. මෙය ඔහු තුල ජනිත කරන්නේ පවතින සංවර්ධනය තුලම වැඩි වැඩියෙන් ඉල්ලීම් සිය සමාජය වෙනස් කරලීමේ මානසිකත්වයක් නොවේ.

..../

ධනවාදී සමාජ විප්ලවය:

යුරෝපය තුල ඓතිහාසිකව සිදුවූ ධනවාදී සමාජ විප්ලවය පූර්ව සමස්ථ සමාජ විප්ලවයකි, පාදිසරීය අර්ථයෙන් ධනවාදය විසින් එතෙක් ආරක්ෂණ ප්‍රභාරයේ සිටි මානවයා පරිසරයට වරෙකිව ආක්‍රමණික ප්‍රභාරයකට එලැබුනේය. ආර්ථික අර්ථයෙන් එතෙක් පිට නිෂ්පාදන කුඨාගැන්වීමේ නියැලුව සිටි මානවයා අපිට පදිවර්තන මූලික කරගත් අතර එය පෙරලා පිට නිෂ්පාදන කුඨාගැන්වීමට ද බල පෑවේය. සංස්කෘතික අර්ථයෙන් එය පුද්ගලික ජාතිය බිහිකළේය. සමාජමය අර්ථයෙන් එය පුද්ගලිකත්වය ආර්ථික බලය හරහා අධිකාරියක් ඔවට පෙරලූයේය. පුද්ගලික දේපල වර්ධනය මූලික කරගත් සමාජයක් හා සංස්කෘතියක් බිහිකළේය. දේශපාලනික ලෙස පුද්ගල අධිකාරිය මුල්කරගත් 'ප්‍රජාතන්ත්‍රවාදයක්' බිහිකළේය. මෙලෙස ඓතිහාසික සමාජ විද්‍යානුකූල අර්ථයෙන් පාදිසරීය – ආර්ථික– සංස්කෘතික – දේශපාලනික සෑම පරිමාණයකම සමස්ථ වෙනසක් සිදුවිය.

මානවයා සමස්ථ පරිසරයෙන්ද, ධනපතියා සමස්ථ මානවයාගෙන් ද වියෝවූ ශ්‍රමණය වූ මානව පරිසර පද්ධතියක් හා අධිකාරීවාදී ඒකීය පරිසර පද්ධතියක් බිහිකළේය.

බලශක්තියෙහි ඒකාග්‍රතාවය හැකියාව මත පදනම් වූ සංවර්ධන සංස්කෘතිය බිහිවිය.

මුල් පරිවර්තේදයන සටහන් තල පරිදිම ධනවාදය ඓතිහාසිකව බිහිවූයේ සමාජීය කරුණු ඥණන ක්‍රියාකාරීත්වයෙනි. යුරෝපීය වැඩවසම් ක්‍රමය තුල ඉඩම මුල්යරගෙන් පැවැති ගොවියා හා රදලයා අතර අභ්‍යන්තර ආර්ථික අරගලය එක් පයෙහින් විය. තාක්ෂණික ආගමික මතවාදී ආධිපත්‍යයට එරෙහිව ද්‍රව්‍යවාදය වෙනට යොමුවූ විද්‍යාත්මක චින්තනය අනෙක් පයවිය. මේ අනුව බිහිවන ක්ෂණික විප්ලවය මානව සමාජයේ පදනම ඉඩමෙන් පැන්වරිය වෙත ගෙන ගියේය. පෙරලා සිදුවූ නිෂ්පාදන බලවේගවල කාරක වර්ධනය හා සංස්කෘතික පෙලඹවීම් විසින් 'ආක්‍රමනය' අනිවාර්ය වී තිබිණ. මෙයින් ගොඩගැසුනු සමිපත් ඉදිරියේ පුද්ගලික නිදහස ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය හා අවයානයේ පුද්ගලික ජාතිය බිහිවිය. ඒවායේ බිහිවීම පෙරලා නිෂ්පාදන බලවේග හා ආක්‍රමනය වේගවත් කළේය.

මේ ක්‍රියාවලිය යුරෝපය තුලදී සිදුවීමට (මෙසා පරිමානයෙන්) මානව පරිසර පද්ධතියේ වූ ස්වභාවික හා ඓතිහාසික වූ සංස්කෘතික පදනමක් ද විය. සංක්ෂිප්තව එය දුෂනර පරිසර ක්‍රම හා එයින් බිහිවූ ආක්‍රමණික සංස්කෘතියය. වඩාත් ආක්‍රමණික සංක්‍රමනීය ජනකොටස්ගෙන් සැදුම්ලත් යුරෝපය තුල මෙලෙස ධනවාදී සමාජ විප්ලවය පරිපූර්ණ විය.

මෙලෙස වූ සංවර්ධනය බිහිවීම හා ධනවාදය එහි අනිවාර්ය සමාජක්‍රමය වීම අහඹුවක් නොව අනිවාර්යක් වෙයි. ඒ අනුව පවතින සංවර්ධනය දැනට එය වර්ධනය වන් දිගහන්කිය ඔස්සේම වඩාත් ඝෝරීන් වර්ධනය කරලන්නට වෙන කිසිදු සමාජක්‍රමයක් යමක් වන්නේ නැත. මානව ඉතිහාසයේ ප්‍රථම වරට ධනවාදය සමස්ථ මානව ගිල්ඨාකාරයේම අධිපති සමාජක්‍රමය වී ඇත. මේ අනුව ධනවාදය වෙනුවට වෙනත් සමාජක්‍රමයක් බිහිවන්නේ ද මානව පරිසර පද්ධතිය තුල ධනවාදය සිදුකල විප්ලවය වෙන්ම වූ සමස්ථ සමාජ විප්ලවයක් වගිනි. එනම් පාදිසරීය – ආර්ථික සංස්කෘතික හා දේශපාලනික ලෙස පූර්ණ අයුරින් වෙනස්වන සංවර්ධනයක් හා සමාජක්‍රමයක් විසිනි.

මාක්ස්වාදී සමාජ විප්ලවය:

සමිඥාවය මාක්ස්වාදය සිය දයලෙක්තික භෞතිකවාදී දාර්ශනයට අනුව ඓතිහාසික භෞතිකවාදය බිහිකළේය. එවගින් සමිඥාවය මාක්ස්වාදය මානවයාගේ අතීතය තුල වූ සමාජයන් පැහැදිලි කර ඇත.

".... ඓතිහාසික භෞතිකවාදයට අනුව සෑම මානව සමාජයකම පදනම රදාපවතින්නේ මානව මොලයෙනි. ඔහුගේ ඇදහිලි හා සංකල්ප වල නොව භෞතිකයෙහිය. එනම් නිෂ්පාදන ක්‍රියාවලිය තුලය. දයලෙක්තික අර්ථයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය යනු පරිසරය සමඟ මානවයා ඇතිකරගන්නා අරගලයය. ප්‍රතිවිරෝධයය. මෙයින් මානවයාට යහපත් සරල දේඛිය ජයග්‍රහන නොව විශ්ව සදිපිලාකාර ජයග්‍රහනයන් ලැබේ. නිෂ්පාදන බලවේගවල– කාර්මනයේ– අනවරත වර්ධනය නිසා එයය. ඛිනැම සමාජයක පදනම හා ප්‍රධාන අරගලය වනුයේ නිෂ්පාදන බලවේග වල වර්ධනයය. මේ ප්‍රධාන අරගලය විසින් පාහි විරහිත ප්‍රාග් කොමියුනිස්ට් සමාජය බිඳවැටී අනිවාර්යය යයි පැහි සහිත වගල් සමාජ ගොඩනැගිය. ඉන්පසු ප්‍රධාන අරගලයට අමතරව අනුරු අරගලයන් ද

..../

හටගත්තේය. එනවි පන්සි අරගලයය. පන්සි අරගලයට ඇත්තේ සාපේක්ෂ ස්වාධීනත්වයක් පමණය. එය සැමවිටම ප්‍රධාන අරගලයට යටත්ව ක්‍රියාත්මක වේ. ඒ අනුව එහල් යුගයේත් වැඩවසම් යුගයටද එහෙයින් ධනවාදී යුගයටද පන්සි සබඳතා වෙනස්වූයේ නිෂ්පාදන බලවේග වල වෙනසත් ද සමගය. එහෙයින් ධනවාදය බිඳවැටී සමාජවාදය උදාවන්නේ ද නිෂ්පාදන බලවේග වල වර්ධනයට ධනවාදී සමාජ සබඳතා-පන්සි සබඳතා-විලංගුවන් ලෙස ක්‍රියාකරන විටය. එසේ නවී පමණැත්ය..."

සම්භාව්‍ය මාක්ස්වාදී මේ මතය සමාජ ක්‍රමයන් පිළිබඳ වඩාත් ඌඩි චිත්‍රයක් ගෙන ඒමට සමත්විය. එහෙත් එහි දුර්වලතා රාශියකි.

පළමුව මානව සමාජයන සැම කල්හිම පදනම් ලෙස නිෂ්පාදන බලවේග වල වර්ධනය ක්‍රියාත්මක වී ඇතිද යන ගැටළුවය. අඩුම තරමින් එහලුන් හා එහල් ගිමියන් අතරද, ගොවියන් හා රදලයින් අතරද ඇතිවූ ආර්ථිකමය අරගල සඳහා ප්‍රාථමිකව ක්‍රියාත්මක වූයේ මෙයද යන ගැටළුවය. ගොවි අරගලය හරහා බිහිවූ ධනවාදයට නවී මෙය බොහෝදුරට සත්‍යය. එහෙත් එය අතීතය සඳහා එලෙසම වලංගු නැත.

දෙවනුව සමාජ විප්ලවවල පදනම ශුද්ධ ආර්ථිකමය නොවේ. එය සැමවිටම සංස්කෘතිය සමඟ වෙලී පවතී. මෙය කිසිසේත් දේවිකියන කරුණක් නොවේ.

තුන්වෙනුව මේ ආකාරයට සමාජ විප්ලවවල සිදුවීම යුරෝපයට පමණක් (යුරෝපය තුල පවා මේවා වෙලෙසම පූර්ණව සිදුවූ එකදු යුවිශේෂ දේශයක් සෝ නැත) සීමා වූවකි. එය සමස්ථ ලෝකයේම ඓතිහාසික ගෞනිකවාදය නොවේ.

සිව්වෙනුව සමාජවාදී සමාජ විප්ලවයෙන් පසු නිෂ්පාදන බලවේග වල ස්වරූපය අඩුවට නොදැන්වීමය. එය සරල ලෙස ධනවාදය තුල වර්ධනය වූ නිෂ්පාදන බලවේග අත්පත් කරගෙන සැලසුම්කරණයක් සිදුකර ධනවාදී දිගහකිය මග්සේම සාමූහිකව වර්ධනය කරලීමට අපේක්ෂා කරනු ලැබීය. මේ අනුව ධනවාදී සමාජ විප්ලවය මෙන් සමාජවාදී සමාජ විප්ලවය පූර්ණ විප්ලවයක් නොවේ. සමාජය තුල සිදුවන දේපල සබඳතා මාරුවීමක් පමණි.

පස්වෙනුව එහලුන් හා එහල්හිමියන් අතර අරගලයෙන් රදලයන් බලයට පත්වීමද රදලයන් හා ගොවියන් අතර අරගලයෙන් ධනපතියා බලයට පත්වීමද ලෙස වූ තුන්වෙනි බලවේගයක ජයග්‍රහණය දයලෙක්තිකය තුල පැහැදිලි කෙරීමය. ධනවාදීන් හා නිර්ධනයින් (කම්කරුවන්) ගැටෙද්දී තුන්වෙනි සමාජ බලවේගයක් (සමාජවාදී පක්ෂය - බුද්ධිමය පක්ෂය - නිලධාරී පක්ෂය?) බලය අල්ලා ගැනීමට ඇති හැකියාව මේතුන් පැහැදිලි වී නැත. ධනපති නිෂ්පාදන බලවේග අත්පත් කරගැනීමේ සමාජවාදයකදී ස්ථිර ලෙසම නවීකරුවන්ට බලය නොලැබෙන බවත් එය කාර්යාරූඩ විද්වතුන් වෙත රැඳෙන බවත් පැහැදිලි වී ඇත.

සයවෙනුව සමාජවාදී විප්ලවයෙන් පසු සාමූහික තොවියුනිස්ට් සමාජය දක්වා පරිවර්තනයේ පසුවද ඉතිහාසයේ සිදුවූවාක් මෙන් නැවත පන්සි සහිත සමාජය බොහෝවිට හෙතිනවාදී සහසිනය තුමක්ද? සංක්ෂිප්තව නිෂ්පාදන බලවේග වල වර්ධනයේ සිතා ඇතිද යන ගැටළුවය.

අවසන් කරුණු තුනම සම්භාව්‍ය මාක්ස්වාදය දුටු සමාජවාදී සමාජ විප්ලවයට අදාල බැවින් ඒවා කවදුරටත් හැදෑරීම අත්‍යවශ්‍යය.

<u>සමාජවාදී සමාජ විප්ලවය:</u>

සමාජවාදය යනුවෙන් සාමාන්‍යයෙන් අර්ථදක්වන්නේ සමූහයක් ලෙස නිෂ්පාදනයේ යෙදීම හා සමූහයක් ලෙස පරිභෝජනයේ යෙදීමය. ඒ අර්ථයෙන් ගත්කල සමාජවාදය මානව ඉතිහාසයේ විවිධ අවස්ථාවල පැවතුණු සංකල්පයක් මෙන්ම සමාජක්‍රමයකි.

එහෙත් සමාජවාදය සඳහා භූතන පිලිගැනීම වර්ධනය වූයේ ධනවාදයේ නැගීමත් සමඟය. මේ අනුව සමාජවාදය සඳහා එහි අවශ්‍යතාවය සඳහා විවිධ සිද්ධාන්ත ඉදිරිපත් විනි. ඒ සෑම බලවේගයක්ම එසේ සිදුකලේ ධනවාදයේ නැගීමට සාපේක්ෂවය. මේවා පහත දැක්වෙන ලෙස වෙන් වෙන් ප්‍රවාහ ලෙස හඳුනාගත හැක.

..../

ජීවවාදී සමාජවාදියෝ:

මේ මතය දැකෙවින් වෙසේය.

".....යෙසු සෑම ජීවීන් අතුරින්ම මානවයා තීරණාත්මක ලෙස වෙනස් වන්නේ ඔහුගේ ජීව පදනම සාමූහික වීම නිසාය. යෙසු බොහෝ ජීවීන්ට සිය ජීව අවශ්‍යතා නඩත්තු කරලීම (ප්‍රාථමික ආහාර-ආරක්ෂාව- වර්ගයා බෝ කිරීම ආදි) තනි තනිව හෝ කුඩා රංචු වශයෙන් කළහැක. එහෙත් මානවයා සඳහා එය එසේ නොවේ. ඔහුගේ අවම ජීව පැවැත්ම පවා රදා පවතින්නේ සාමූහිකත්වය තුළය. එහෙයින් මානවයාට වඩාත්ම ගැලපෙන සමාජ්‍රමය ජීව විද්‍යාත්මකව සමාජවාදයයි. ධනවාදී පුද්ගලික දේපල ක්‍රමය විසින් මෙය බිඳදමා ඇත. එහෙයින් මිනව ජීව පැවැත්ම අභියෝග ම ඇත. එහෙයින් ජීවමය වශයෙන් විනාශවීමට ප්‍රථම එයි අවශ්‍යතාව පිලිගනිමින් සමාජවාදයට පිවිසිය යුතුය.

මානවවාදී සමාජවාදියෝ:

මේ මතය දැකෙවින් වෙසේය.

".... මානවයා ගේ මානසික පැවැත්ම පවතින්නේ ඔහුගේ සංඥාවේදනය මතය. උපතින්ම සියළු මිනිසුන්ගේ මොළ වල අතර පරාර්ථතාවේද වෙයි. මානව සමාජයේ පැවැත්ම රදා පවතින්නේ පරාර්ථකාමී ලෙසත් සමානාත්මතා ලෙසත් මානව සමාජය දැකීමෙනි. (මෙහිදී යුරෝපීය ව්‍යවහාරය ලෙස සමාජවාදය යනු සමාජ සාමූහිකත්වය විසින් පුද්ගලවාදය ඝටපත්කර අගෝඩිකෙරුවය. ආයියානු සාමානාත්මතාවය වූයේ පුද්ගලයා තුලින් එනම් මම මෙන්ම සෙසු අයද සම වෙනිය යන දෘෂ්ටියෙන් සමාජය දැකීමයි. එහෙයින්, මේ අතර සියුම් නමුත් අතිශය වැදගත් වෙනසක් පවතී.) ධනවාදී දේපල සබඳතා හා පුද්ගලික ආත්මාර්ථය වර්ධනය විසින් සමාජයේ පැවැත්ම සඳහා එය පරාර්ථකාමී වූත් සමානාත්මවූත් මානව මානසිකත්වය බිඳදමයි. එහෙයින් මානව සමාජයේ ස්ථාපිත පැවැත්ම උදෙසා හා එය උසස් සදාචාරවත් සමාජයක් සඳහා ධනවාදයේ සූරාකෑම විරහිත සමසමාජයක් පරාර්ථයේ පදනම මත බිහිකරගතයුතුය.

ජාතිකවාදී සමාජවාදය:

මේ මතය ඝාතිවාදී – පැයිස්ථිවාදී ආකාරවලින් ද ප්‍රයෝජනයට ගැනුනද මෙහිදී අදහස් කරනුයේ අධිරාජ්‍යවාදය සමඟ ආසියානු – අප්‍රිකානු – දකුණු ඇමෙරිකානු ගිජ්ඣාචාර නඩා බිඳදමමින් ජාතීන් ඝටක්කර විනාශකරමින් පැහිර සිය ධනවාදයට එරෙහිව නැගුණු පීඩිත ජාතිකවාදය පිළිබඳවය. මතය දැකෙවින් මෙසේය.

"මානව සංඥාවේදනයේ හා සාමූහික ක්‍රියාකාරීත්වයේ අවසාන ඵලය ජාතියය. යටපී ප්‍රදේශවල – ඉපැරැණි ජාතික ආකල්ප හා සමාජය මුළුමනින් ගොඩනැඟී තිබුනේ සාමූහිකත්වය හා සමාජ සාධාරණත්වය මතය. ජාතිය පිළිබඳ ආකල්පයම් සමාජ සාමූහිකත්වයේ පිළිබිඹුවකි. ධනවාදී ආක්‍රමණය විසින් ආර්ථික ලෙසද සංස්කෘතික ලෙසද ජාතිය සාමූහිකත්වය බිඳදමමින් මානව සමාජය පුද්ගලික වර්ධනයට තෙන්ද්‍ර කරගත් අතර බිඳුණු සමාජය තුල ආධිපත්‍යවාදී සංස්කෘතිය තැබූහ. එහෙයින් පීඩිත ජාතීන් විමුක්ති අරගලය තලයුත්තේ පීඩක සංස්කෘතියට පමණක් නොවේ. එහි ගෙනින බලය වන ධනවාදයටද එරෙහිවය. එමගින් පැරැණි සාමූහික ජාතික සමාජය සතුව සංකල්ප මත නව සමාජයක් ගොඩනැංවීමටය.

මෙලෙස පීඩිත රටවල මෙන්ම යෝචියට් සංගමයේ පවා (ශ්‍රේෂ්ඨ දේශප්‍රේමී අරගලය) සමාජවාදය පිහිටුවීමට දේශප්‍රේමී ජාතික විමුක්ති අරගලය බරපතල ලෙස දා යනු වූයේය.

විද්‍යාත්මක සමාජවාදය :

සවිභාවය මාක්ස්වාදය සෙසු සෑම සමාජවාදයන්ම දුටුවේ මනෝදාර්ශනවාදයන් ලෙසය. රොබට් ඕවන්, ෂෙන් සයිමන්, ප්‍රූදොන්, පුරියේ, බකුනින්, පෙයර්බස්, ඩුරින්ග් ආදී සෑම ආකාරයකම සමාජ-වාදීන්ට එරෙහිව සවිභාවය මාක්ස්වාදය අනවරත වාදය දී අරගලයක් ගෙන ගියේය. එය එහෙයින් අනන්‍යතාවය සඳහා විද්‍යාත්මක සමාජවාදය විය.

විද්‍යාත්මක ක්‍රමය කුටන්ද සන්නට අද වනතුරුදු විසඳුවක් ලැබී නැත. එනම් නූතන විද්‍යාව දැනුම

.....

සොයන්නේ කවර නිශ්චිත ක්‍රමයකටද යන්නය. එක් තලෙක විශ්ලේෂය වූයේ විද්‍යාත්මක ක්‍රමය වූ කලී නිගමනීකරණය. (Deductionism) කවුත් තලෙක මතය වූයේ එය උද්ගාමී ක්‍රමය. (Inductionism) පසුව එය තාර්කික සධනවාදය (Logical Positivism) සහ තාර්කික ආනුභවිකවාදය ලෙස (Logical Empiricism) ලෙස පැහැදිලි විය. මේ සියල්ල සාමාන්‍ය විද්‍යාව පැහැදිලි කෙරුම් සඳහා යෙදවිය. ඒ අනුව අන්දැනීම් මෙන්ම නිර්මාණාත්මක සිතුවිලි විසින් විද්‍යාත්මක ආකෘතීන්, සිද්ධාන්තයන් නැනීමද එහි ක්‍රියාවලීන් පැහැදිලි කෙරුම් සහ අනාවැකි ඵල කෙරුම්ද සිදුවිය. අනාවැකි සහ ප්‍රායෝගික ප්‍රතිඵල සිද්ධාන්තික ප්‍රතිඵල සමග සමගාමී නම් සිද්ධාන්තය සත්‍ය ලෙස පිළිගත්හ.

මේ සාමාන්‍ය විද්‍යාව අනුව පූර්ව අන්දැනීම් වලින්ද (හෙගල් සිට අතීතයට) කල නිර්මාණාත්මකතා වයද පරිහරණය කර මාක්ස් තර්කයන් (දඟලෙක්තික හෙතිකවාදය) බිහි කළේය. දෙවනුව ඒ මගින් දේශපාලන ආර්ථික විද්‍යාවේ, සමාජ විද්‍යාවේ විවිධ ආකෘතීන් හා සිද්ධාන්ත බිහි කළේය. ඒ අනුව පැවතුන හා පවතින ලෝකය විග්‍රහ කළේය. (ඓතිහාසික හෙතිකවාදය, සමාජ සංවර්ධන න්‍යාය, වටිනාකම් න්‍යාය) අනාවැකි ඵල කළේය. (සමාජවාදය උදාවන බවට-දියුණු ධනපති ලෝකයේ එය සිදුවන බවට) සාමාන්‍ය විද්‍යාවට අනුව නම් මාක්ස්ගේ ප්‍රකාශිත කෙරුම් සහ අනාවැකි නිරීක්ෂණවලට එකඟ නම් ඔහුගේ සිද්ධාන්තය සත්‍ය වේ.

මාක්ස්ගේ අනාවැකි අභියෝග කළේ (විද්‍යාත්මක අර්ථයෙන්) කාල් පොපර්ය. විද්‍යාත්මක ක්‍රමය සහ සාමාන්‍ය විද්‍යාවෙන් බැබෙහි වූ විද්‍යාත්මක සිද්ධාන්ත (නිව්ටන්ගේ සම්භවය හෙතිකවිද්‍යාව, අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදය ක්වන්ටම් යන්ත්‍රනය ආදී) වෙතට පලමු පුලුල් කෙරුම් කළේ ඔහුය. 'අසත්‍යකරණය' (falsification.) ඔහුට අනුව විද්‍යාත්මක ක්‍රමය විය. ඒ අනුව මාක්ස්ගේ අනාවැකි සත්‍ය නොවූ නිසා සාමාන්‍ය විද්‍යාව අනුවද මාක්ස්ගේ මතය විද්‍යාත්මක නොවිය. තව දුරටත් මාක්ස්වාදය අසත්‍යකරණයට නිසි ලෙසින ලක්කල හෙතිකි නිසා එය නිසියේන් සම්භාව්‍ය විද්‍යාත්මක ආකෘතියන් හෝ නොවන බව පොපර් තර්ක කළේය. පොපර්ගේ ප්‍රහාරය යුරෝපය තුල අධිපති මතවාදයන් ලෙස පැවැතීමට මාක්ස්වාදයට තිබූ ශක්තිය හීන කළේය. එය හිට්ලර්ගෙන් එල්ල වූ ශාරීරික ප්‍රහාරය තරමටම බලවත් විය.

මෙයට එරෙහිව මාක්ස්වාදීන් තර්ක කළේ මාක්ස්වාදී කර්තෘ හෝ ආකෘතීන් හුදු හෙතික විද්‍යාත්මක ආකෘති නොවෙයි බවය. ඒවා සමාජ විද්‍යාත්මක වන හෙයින් මානව නිර්මාණාත්මකතාව අනුව ඒවා සදිවකාලීන නොවන බවය. ඒ අනුව වෙනත් ආකෘතීන් ඉදිරිපත් වී මාක්ස්වාදය සංවර්ධනය වනවා මිසක (නිව්ටන් වෙනුවට අයින්ස්ටයින් මෙන්) මාක්ස්වාදය අගෝසි නොවන බවය. මාක්ස්වාදය විද්‍යාව මෙන්ම ආකෘතියෙන් ආකෘතියට රෙඛීය ලෙස වර්ධනයක් නොවන බවය. (මාක්ස් - එංගල්ස්-ලෙනින්.....)

මේ අනුව සම්භාව්‍ය මාක්ස්වාදය පිළිබඳ ප්‍රශ්න ගණනාවක් පැන නගී.

පලවුව මනෝරාජික සමාජවාදය පිළිබඳ මාක්ස්ගේ විවේචනය වූයේද ඒවා මනසෙහි ආකෘති වූලික කරගත්තා බවය. එයට පටහැනිව වාස්තවික හෙතික පදනම් මත පදනම් වන ලෙසය. එහෙත් හොපර්ට පිලිතුරු දුන් සැම මාක්ස්වාදියෙක්ම වාස්තවික හෙතිකයට වියහැකි ඇති සබඳතාව පෙන්වා දුන්හ. එනමින් ඔවුන් කලේ හොපර්ට පිලිතුරු දීම නොවේ. සාපේක්ෂ ද්‍රව්‍යවාදයෙන් පැහැදිලි කරගත නොහැකි ලෝකය පැහැදිලි කෙරුමට සාපේක්ෂ වියහැකිවාදයේ පිහිට පැතීමය! මෙය දඟලෙක්තික තර්කයේම විසංවාදයකි.

දෙවනුව සම්භාව්‍ය මාක්ස්වාදය අවිද්‍ය යන්නය. එය දඟලෙක්තික හෙතිකවාදී දෘෂ්ටිය පමණක්ද? දඟලෙක්තික හෙතිකවාදී දෘෂ්ටිය මත පදනම්ව මාක්ස් විසින් ගොඩනැගූ විද්‍යාත්මක ආකෘති වන ආර්ථික වටිනාකම් නියමය, සමාජ සංවර්ධන නියමය හා සමාජවාදයට මග පෙන්වූ ආකෘතීන් ප්‍රායෝගික මාක්ස්වාදීන් සමස්ථයක් ලෙස අභියෝග කර නැත. එහෙත් මාක්ස්ගේ නිරීක්ෂණ හා නිගමන පදනම් වූයේ වේ ආකෘති මත හෙයින් එහි නිරීක්ෂණ හා නිගමන වල අසත්‍යයන් ආකෘතීන්වල අසත්‍යයන් වීම නොවැලැක්විය හැකිය. ඒ අනුව මාක්ස්වාදී දෘෂ්ටිය යනු හෙගල් හා පෙයර්බාහ්ගේ එකතුවක් ලෙසද මාක්ස්ගේම වෙනස්කම්ද සහිත දඟලෙක්තික හෙතිකවාදී දෘෂ්ටියය. එය එසේ නම් එය තර්කයන් මිස තවදුරටත් සාමාන්‍ය විද්‍යා ආකෘතියන් හෝ නොවන්නේය.

එහෙත් අධිභෞතික විද්‍යා නියමයන් හා සිතුවිලියන් යුල සාමාන්‍ය විද්‍යාත්මක ක්‍රමය ප්‍රාථමික

.....

නොවේ. විශේෂයෙන් නිදහසට පසු ස්වායත්ත නොවන බවත් ඒවා තුළපිත – සිද්ධාන්ත හා සමානව ආනෘතිමක රූපා පවතින බවත් පෙනී ගොස් ඇත. ඒ අනුව බිහිවූයේ 'සාපේක්ෂතාවාදය' විද්‍යාත්මක ක්‍රමය බවය. එනම් එකනට වැඩි විද්‍යාත්මක ක්‍රමය පවතින හා පැවැතිය යුතු අතර එහි විද්‍යාත්මක ක්‍රමයය තුල සාමාන්‍ය විද්‍යාව ත්‍රියාත්මක වන බවය. විද්‍යාත්මක ක්‍රමය ප්‍රතික්ෂේප වීමේදී හෝ පිලිගැනීමේදී එය සිදුවන්නේ සාපේක්ෂතාවයට අනුවය. තෝමස් කුන්ගේ මේ මතය පොල් පෙරළුබන්ධ විසින් වඩාත් අරාජිකවාදී දෘෂ්ඨියකට පවා ගෙනයන ලදි.

මේ අනුව සමාජවාදය සඳහාද ආනෘතීන් ගණනාවක් පැවැතිය හැකි අතර ධනවාදී සංස්කෘතිය තුලද පොදු සමාජවාදී ආකෘතියක් පැවැතිය හැක.

සමීක්ෂය මාක්ස්වාදය යනු ධනවාදී සමාජ විප්ලවය විසින් ජනිත කල විද්‍යාත්මක ක්‍රමයෝ –සංස්කෘතිය තුලම ඉදිරිපත් කල සාමාන්‍ය විද්‍යා ආකෘතියකි. එහි මිනුම් දඬු පදනම් වී ඇත්තේ ධනවාදී සංස්කෘතියට අනුවය.

අද සමාජවාදයේ පොදු අවශ්‍යතාවය වනුයේ ධනවාදී සංස්කෘතිය තුල විකල්පය ගොඩනැගීම නොවේ. ධනවාදී සංස්කෘතියට – විද්‍යාත්මක ක්‍රමයයට එරෙහිව විකල්ප විද්‍යාත්මක ක්‍රමයක් බිහිකර ගැනීමය. ධනවාදී අර්බුදය වන්නේ ද එය එවැනි බහුවිධ ආකෘතීන් යටපත් කරලීමය.

භෞතික ආර්ථික විද්‍යාව, භෞතික සමාජ විද්‍යාව වේ අර්ථයෙන් නව ක්‍රමයකි. වේ පොදු ක්‍රමයය තුල එකනට වැඩි සමාජවාදය වෙනුවෙන් වූ සිද්ධාන්තවල පැවැත්ම (යුක්ති සහගත, ප්‍රායෝගික ඒවා) පිලිගැනීමය.

වේ අනුව මනෝරාජික නමින් ඉදිරිපත් වූ මතවාද පවා විද්‍යාත්මකය. ඒවා සම්භවක් ධනවාදී සංස්කෘතියෙන් (විද්‍යාත්මක ක්‍රමයයෙන්) පිටත්තර වටිනාකම් කැපීකරගත් හෙයින් ඒවා ධනවාදී සංස්කෘතිය තුල අවිද්‍යාව හා මනෝරාජික ලෙස සැලකීම සඟවුලින්ම අවිද්‍යාත්මකය.

එහෙයින් ධනවාදයට එරෙහිව අනාගතයේ බිහිකරගත යුතු සංවර්ධනය ධනවාදී නිෂ්පාදන බලවේග ඒ දිගානතිය ඔස්සේම වර්ධනය නොකරනු ඇත. පෙරලා එය විකල්ප තාක්ෂණයක් හා විකල්ප මිනුම් දඬු ගෙන එනු ඇත.

එමෙන්ම සමීක්ෂය මාක්ස්වාදය මගහැර ගියද, තවත් විටෙක අවධාරණය කලද නිෂ්පාදන බලවේගවල දියුණුව අසීමිත නොවන්නේය. සීමිත මානව පරිසර පද්ධතියක් එය එසේ සිදුවිය නොහැක. ඒ අනුව අපරිමිත භෞතික පුලඟාව විසින් අවශ්‍යතාව අනුව ලබාදෙන නොමිලයේ සමාජය සැබෑ මනෝරාජිකයකි. සමීක්ෂය මාක්ස්වාදයට අනුවද වේ සමාජය තවදා බිහිවන්නක් දැයි සැක සහිතය. ආරම්භය හා අවසානය සහිත දයලෙක්තික තර්කය අනුව හා නිෂේධයේ නිෂේධය නියමය අනුව කොමියුනිස්ට් සමාජයෙන් ඇරැඹි පන්ති සහිත සමාජ හරහා නොමියුනිස්ට් සමාජයකටම පරිවර්තනය වේ. මෙය අවසානය නම් කොමියුනිස්ට් සමාජය සංවර්ධන සරිපිලයේ අනන්තයේ එලඹෙන සීමාවක් විය යුතුය. නොවලේ නම් නැවතත් පන්ති සහිත සමාජ බිහිවෙමින් පැවතිය යුතුය.

අරගලය:

මාක්ස්වාදය ලෝකය පුරා බුද්ධිමතුනගේ අවධානයට යොමුවූයේ එහි තර්කයෙහි වූ සරල ආකර්ශනීය භාව නියාය. එහෙත් එය බහුතර පීඩිත ජනයාගේ ආකර්ශනයට ගොදුරු වූයේ එය අරගලයට දැක්වූ විද්‍යාත්මක පක්ෂපාතිත්වය නියාය. මාඕ සේතුං, හෝ චිමින්ගේ, වේ ගුවේරා ආදී බොහෝ අරගලකාරී පීඩිත ජනයාගේ මාක්ස්වාදය වෙනට ඇදී ගියේ බයිබලය හා කුරානය ලඟට අරගලය නියාගේ නොවසන් වීම නියාය.

ධනවාදය විසින් ප්‍රතිවිරෝධය ලෙසට ධ්‍රැවනය කල ආර්ථික හා සංස්කෘතික ලෙස පීඩාවට පත්කල සමාජයන අරගලය අත්‍යාවශ්‍යයක් විය. සමීක්ෂය මාක්ස්වාදයේ දුර්වලතාවය වූයේ අරගලය සමස්ථය ලෙස දැකීමය. එමෙන්ම අරගලය කරා මානවයා යොමුකරවන පුද්ගලික හා සමාජ සාධකය ආර්ථික පීඩනය ලෙස සැලකීමය.

සමීක්ෂය මාක්ස්වාදය එහි අකමැති ධනවාදී සාරය නිෂ්පාදාධිනාවයන් අත්පත් කරගැනීමටත් පෙරලා වඩාත් ප්‍රබල ශෝභන බලයක් (උදා සන්නද්ධ බලයක්) ගොඩනැංවීමටත් පක්ෂපාතිවෙයි.

.../

වඩාත් දියුණු එක ජයගනු ඇත. මාක්ස්වාදී සාහිත්‍යය තුල ධනවාදය බිඳදැමීමත් ගැන සඳහන් වුවද සමිතාවය මාක්ස්වාදය තරතර ඇත්තේ ධනවාදය අස්පත් කරගැනීමත් (ප්‍රාග්ධනය හා නිෂ්පාදන බලවේග) හා ප්‍රති පීඩන ශෙණිය බලයත් යෙදවීම ගැනය.

එහෙත් අද ධනවාදය තුල ධනවාදයට එරෙහි_වය දියුණු (කාරක අගය) ශෙණිය බලයක් ගොඩනැගිය නොහැක. එසේ සිදුවිය යුතුද නැත. ඒ වෙනුවට ධනවාදය තුල සිදුවන්නේ කමන් ගේම කාරක දියුණුවට එරෙහිව සමාජීය පෙල්ගස්වා ගැනීමයි.

හරිත සමාජවිද්‍යාවේ අරගලය ප්‍රභාරක අරගලයක් නොවේ. එය ආරක්ෂණ අරගලයක් වන අතර, අස්පත්කරගැන්වේ අරගලයකට වඩා ගොඩනැගීමේ අරගලයක්ද වේ. එය ආර්ථික පීඩනය පවත්නා නොව ලිංගික පීඩනය, බලකෘෂ්ණව වැනි වූ පුද්ගල පීඩනයන් ද (ප්‍රොයිඩ් හා නියමිතෙ මේරියන් පටන්ගෙන මාස්ස් මෙන් ලෝකයම විග්‍රහ කළේය) සංස්කෘතික සමාජ පීඩනයන්ද යන සියල්ල සැලකිල්ලට ගත් අරගලයක් දියත් කරයි. නැත්නම් ආර්ථික පීඩනය අඟෝසි වුවද වෙනත් පීඩනයන් විසින් මානව පීඩනය දිගටම පවත්වා ගනී. එමෙන්ම ධනවාදයට එරෙහිව අරගලයේදී බලයට සිදුවන පරාරෝපනයද අනිත සමාජයේදී විප්ලවවල සැලකිල්ලට ගත යුත්තකි. ප්‍රභාරක අරගලයක් තුල සිදුවන 'බලය' භේන්ද්‍රගත වීම ජයග්‍රහනයෙන් පසුද දිගින් දිගටම සිදුවේ. ප්‍රතිවිරෝධයන්ගේ අරගලය හා ඒකස්වරූ යන නියාමයට අනුව මේ බලය භේන්ද්‍රගත වීම යුක්ති යුක්ත තලද එය සැබෑ මානව පීඩනයක් ගෙන එන බව පෙනී යයි. නිදර්ශන පන්ති ආඥාදායකත්වය තුල පන්තිය-පක්ෂයක් පක්ෂය දේශපාලන මධ්‍යලයටත්- අවසානයේ තනි පුද්ගලයෙකුට ත් පරාරෝපනය වූ බව ප්‍රායෝගික අත්දැකීමයි.

එහෙයින් අරගලය ආරක්ෂණ අරගලයක් විය යුතුය.

එමෙන්ම ධනවාදය අස්පත් කරගැන්මත් නොව සමස්ථ විකල්ප සංවර්ධනයක් නිසා ධනවාදය විසුරුවා හරිමින් ඒ ප්‍රමාණයට ගොඩනැගීමේ අරගලයක් ද ජනිකවේ. මෙය දෙවැනි පාර්ශවයයි.

එහෙයින් අරගලය ගොඩනැගීමේ අරගලයක්ද විය යුතුය. හොදුවේ එය ධනවාදයේ කාරක වර්ධනයට එරෙහිව සමස්ථයේ නැගී සිටීමක් විය යුතුය.

මේ කරුණ සඳහා වූ පැහැදීම් සහ ජනතා පෙලගැස්වීම් අවශ්‍ය වේ.

විකල්පයේ මග: **සිමිකරන ස්ත්‍රීවාදය**

ධනවාදී සංවර්ධනයේ සහ එහි සංවර්ධන සංස්කෘතියේ බාහිර මෙන්ම අභ්‍යන්තර දාර්ශනික අර්බුදය සැනෙවින් සලකා බලා ඇත. ඒ අනුව ලෝකයේ මානව ඉතිහාසය තුල පැවැති සෑම අධිරාජ්‍යවාදයක්ම සමාජ ප්‍රවිඤානයට වඩා ධනවාදය සමස්ථයක් ලෙස වෙනස් බවත් සමස්ථයක් ලෙස පිබාකාරී බවත් පෙනී යයි. එමෙන්ම වැඩිවැඩියෙන් වර්ධනය ඉල්ලා සිටින සංවර්ධන සංස්කෘතිය තුල ධනවාදය සමාජවාදය නියා දෙයක් නොවැයි බවත් ඇත්තේ වත්මන් හා අනාගත පරපුර සූරාකෑම ධනවාදයම පමණක් බවත් පැහැදිලිය. සීමිත සම්පත් සහිත මානව පරිසර පද්ධතියක සුළුතරයකගේ වර්ධනය සඳහා බහුතරය පැවැත්ම විනාශ කරගත යුතුය. එහෙත් මේලෙසට කවකටුත් අසිමාන්තිකව ධනවාදී සංවර්ධනයට වර්ධනය විය නොහැක. එයට නිශ්චිතවම මානව පරිසර පද්ධතියේ සීමා විධින් බිලිංගු ලනු ඇත. එහෙයින් දැන් දැන් ධනවාදය අනුපාලික සංවර්ධනය – චිරස්ථායි සංවර්ධනය– පරිසරය රැකගැන්ම වැනි වදන් පරිභරනය කරමින් කිඹේ. මේ වදන් දුගීබව වියඳන බවට වූ ධනවාදීන්ගේ පොරොන්දුවලටද වඩා වංචා සහගතය. එවැනි විකල්ප සංවර්ධනයකට සමාජ ප්‍රවිඤාන් ලෙස ධනවාදයට සා නොහැක. ආර්ථිකික ලෙසම සංවර්ධනයෝ සිදුවූ මානව පරිසර පද්ධතියේ විනාශයට ධනවාදය සෑම පරිවර්ධලයකම අවියෝජනීය ලෙස බැඳී ඇති බව අප විසින් ඉහත පරිච්ඡේද වල සාධනය කර ඇත. එහෙයින් විකල්ප සංවර්ධනයක් නියා ධනවාදය හඳුන්වාදෙන්නේ පිඩිත ලෝකය එසි පස්ල දක්වාට විනාශ කරන කෲර වූස් නග්න වූස් සූරාකෑවකි. දැන් සූරාකෑම සිදුනරනවා ඇත්තේ පරිසරය රැකීමේ මුවාවෙනි. එහෙත් සංවර්ධනය ප්‍රසුත දෙන අර්බුදයේ යහපිය වර්ධනය සලකා බලන විට ධනවාදයට සිය සූරාකෑමේ යාන්ත්‍රනය වුව වර්ධනය තල ඇත්තේ වඩාත් කාර්යක්ෂම ලෙස. නොව අර්බුදය තවත් වේගවත් කරන ලෙස බව පෙනී යයි.

..../

අවුල්වනු ලැබූ ප්‍රයෝජ තරනු ලැබූ ශ්‍රැවනය හරනු ලැබූ ඔනට ආවේගයන් හා ජීවය අතරද සීමිත පරිසර පද්ධතිය අතරද විසංවාදය පුපුරායමින් පවතී.

ඉදින් තවත් සියවස් ගරාජකට වර්ධනය සඳහා ගණන් බැලීමට ධනවාදයට ඉතුරුව නැත. එය නිසැකවම දඟන ගරාජක ප්‍රශ්නයකි. උදාව් ඇත්තේ ධවල ධනපති සංවර්ධනයේ කුණෙනි සාමයය.

එහෙයින් වහාම ඔනවය විශේෂයෙන් පීඩිත ලෝකයේ ගිම්හාන්තරයම වැනසී යෑමට තදම් නියමිතව සිටින ඔනවයා වහාම නැගී සිටිය යුතුය. ධනවාදී විප්ලවය මෙන්ම වූ එයටත් වඩා බරපතල සමාජ විප්ලවයක් සඳහා සැරසිය යුතුය. මෙවර අරගලය පුළුතරයේවත් බහුතරයේවත් නොව සමස්ථයේ අරගලයකි. එහෙයින් කෝරාගත් පිරිසක් නොව සැබෑම එක්වී විකල්ප විරස්ථායී සංවර්ධනය උදාකරගත යුතුය. ධනවාදී සංවර්ධනය ඝාදිසරික – ආර්ථික – සංස්කෘතික දේශපාලනික සෑම පරිමාණයකම පෙරලා දමමින් විකල්පය හදුන්වා දිය යුතුය.

එනම් සැලසුම්ගත විවිධාගත සමාජවාදී – විරස්ථායී සංවර්ධන විකල්පයයි.

දර්ශනයේ නව ඇරඹුමක්:

මෙතෙක් ලෝකයේ පැවැති සියළු දර්ශනවාදයන් ගේ සාරය හා අත්දැකීම් පදනම් කරගත් නව දර්ශනීය ඇරඹුමක් හා සැදිය ප්‍රවේශයක් අවශ්‍යව ඇත.

එය ලෝකයේ ක්‍රියාවලින් පද්ධති ලෙස පවතින බව පිළිගනී. චලනය එහි නියම ලක්ෂණයයි. චලනයේ ස්වභාවයන් තුනකි.

සමස්ථය

යුධිගේෂනාව

ඝාපේක්ෂනාවයයි

සෑම ක්‍රියාවලියක් තුලම මේ ස්වභාවයන් දැකගත හැක.

සෑම ක්‍රියාවලියක් තුලම පවතින ද්විත්ව සබඳතා ආකාර සතරකින් පවතී. ඒ ආකාර සතරද ඉහත ස්වභාවයන්ට සරිස්ය. මෙය චතුර්විධ තර්කය නමිවේ.

ධනවාදී සංස්කෘතිය විසින් ප්‍රතිවිරෝධතා බවට පත්කරනු ලැබූ එහෙත් ප්‍රතිබද්ධමය සාපේක්ෂතා සහිත පහත පද්ධති ගැටිය සමාජවාදී ආකෘතියක අතිශය වැදගත්කමක් උසුලයි.

මානව පරිසර පද්ධතිය, ද්‍රව්‍යය – විඥාන පද්ධතිය, වස්තු–අවකාශ පද්ධතිය, යවස්ථා අවකාශ–කාල පද්ධතිය ආදී ස්වභාව පද්ධතීන්ය.

කවදුරටත් සමාජමය වන,

ආර්ථික – සංස්කෘතික පද්ධතිය, පුද්ගලිකත්වය–සමාජබලය- පද්ධතිය, ආගමිකවාදය ආකෘත්මකවාදය ආදී පද්ධතීන්ය.

ප්‍රතිවිරෝධය හා ප්‍රතිබද්ධය නිවරදිව වටහාගැනීම විකෘතිය ප්‍රකෘතිය තේරුම්. චක්‍රීයතාව හා දේශීයතාවද ස්ථිතිය සමතුලිතතාව හා ගතික සමතුලිතතාව හදුනාගැනීමද ගැටික සමාජවාදයේ දාර්ශනිය පරිනතාවයෝ අවශ්‍යතාවයන්ය.

ගැටික සමාජවාදය:

මානව පරිසර පද්ධතිය චිරාත්කාලයක් රැකගැනීම සඳහා මානව අවශ්‍යතා හා ආශාවන්ය රැකදෙන සමාජ්‍රමයක් සංවර්ධන විකල්පයක් අවශ්‍යව ඇත. එය ගැටික සමාජවාදයයි. ධනවාදී ඒෂණිත සංවර්ධනයෙන් විනාශනොවී ගැලවී ගැනීම සඳහා මානව වර්ගයා සඳහාම වෙසවස්ථ සංවර්ධනය යෝජනා වේ. එය එක් අතකින් සමස්ථ සැලසුම්කරනයයි. තවත් අතකින් උපරි විමධ්‍යගතකරනයයි. මානව සමාජාර්ථිකවාදී – පරිසර සමාජාත්මකවාදී සමාජවාදයයි. විරස්ථායී සමස්ථ සංවර්ධනයක් සඳහා වෙනැති ගුරුංග වලින් යුතු සමාජ්‍රමයක් අවශ්‍ය ඇයි සන්න යලහා බැලිය යුතුය.

මෙහිදී සලකා බලනුයේ සමස්ථ අවශ්‍යතාව පමනි. මේ යෝජිත සංවර්ධන වූහය පාරිසරික හා ජාතික දේශසීමාවලදී ඒකාබද්ධ වූ අනන්‍යතා සිදුකර ගනු ඇත. එය විශේෂයෙන් ධනවාදී සංවර්ධන යේ පිඩනයන් වහ දැඟුල් දිග පීඩිත ආසියා, අප්‍රිකා, ඇමෙරිකා ජනතාවට පිදේ.

..../

සැලසුම්ගතභාව අවශ්‍ය ඇයි?

මානව පරිසර පද්ධතියේ සමස්ථය එහි වස්තු නිෂ්පාදන සබඳතා හා ගතික ස්වභාවය රැකගැනීම සඳහා සැලසුම්කරණය අවශ්‍ය වෙයි. එය මධ්‍යගත සමාජවාදයේ හා සම්ප්‍රාග්ධන වාස්ථාවාදයේ එන සැලසුම්කරණය නොවේ. එය උණිත සැලසුම්කරණයයි. මෙය මානව-පරිසර පද්ධතියේ සමස්ථයය.

පාරිසරික අර්ථයෙන් විශේෂයෙන් ධනවාදයෙන් විශේෂවේදී සැලසුම්කරණය විශේෂ කාර්ය භාරයක් ඉටුකරයි. සීමිත සම්පත් හා පරිසර කව්වයන් ද පරිසරයේ වලනයේ නියාමය හා ගතික සමතුලිතව ආරක්ෂා කරගනිමින් සමස්ථ සංවර්ධනයක් සිදුවනවාද යන්න මැනීම සඳහා විනුම් දඩු යනස් කෙරුම හා අවශ්‍ය ප්‍රතිශෝධනයන් ලබාගැන්ම මෙයිදී බලාපොරොත්තුවේ. සමස්ථ නිෂ්පාදිතාව සමස්ථ කාර්යක්ෂමතාව, සමස්ථ වර්ධනය ආදිය සඳහා සම්මත යනස්වනු ඇත.

ආර්ථිකමය අර්ථයෙන් නිෂ්පාදන වාසය අනුව ඝාර්ඩ හා සේවාවන් වලද හානව ප්‍රියතාවීන්වය වද වටිනාකම් නියම කරලීමට අවශ්‍ය එන් මිනුම් දර්ඩන් (මැනිය හැකි දේ) ලබාදීමය. ඝාර්ඩයන ඝාවික අගය-පරිවර්තන අගය නියම කරලීම හා ශ්‍රමයෙහි සමස්ථ වටිනාකම ගෙවීම පිලිබඳ සම්මත යනස් කරලීම සැලසුම්කරණයා බලාපොරොත්තු වේ. ඒ අනුව ආර්ථික ඉලක්ක යනස් කෙරුම හා පවතින සම්පත් හා ශ්‍රමය එහි උපරිම කාර්යක්ෂමතාවයෙන් යෙදවීම ආදිය, සඳහාද වූ හාද්ගවීය අවශ්‍යතාවයන් සඳහාද සැලසුම්කරණය යෙදවේ. සැලසුම්කරණය අවසාන වශයෙන් නව ආර්ථික සිද්ධාන්ත හා සම්මත ඝඳුන්වා දෙනු ඇත.

සංස්ථානික අවශ්‍යතාවයන්ද සැලසුම්කරණයක ඇත. සමස්ථය මැනිය හැකි මෙන්ම මැනිය නොහැකි සංස්ථානික ආකාරයන්ද ගනී. දියුණු සංස්ථානියන් කුලට ප්‍රමයෙන් මැනිය හැකි වටිනාකම් පවා අවශෝෂනය කරගත හැක. සංස්ථානික විවිධත්වයට ඉඩදෙන අතර ඒවා අතර සමස්ථ වර්ධනය හා වටිනාකම පිලිබඳ සංස්ථානික සම්මත බිහිවන දිශානතිය ඔස්සේ සංස්ථානිය මෙහෙයවනු ඇත. ආත්‍රමනිය සංස්ථානිය අන්තවාදයන් අවශ්‍ය පරිදි පාලනය කරමින් සමස්ථය සඳහා සංස්ථානික පෙලඹවීමක් ලබාදෙනු ඇත.

දේශපාලනයේදීද සැලසුම්කරණය ප්‍රියාත්මක වේ. සමස්ථ ලෝකය හා සමස්ථ පරිසර - පද්ධති ලෙසත් සංවර්ධනයේ සිරා හා තලමණාකාරීත්වයේ සබඳතාවයන් පවත්වාගැනීම මෙහි දේශපාලන සැලසුම්කරණයේ අරමුණය. එය මධ්‍යගත රාජ්‍යවාදයන් හා ජාත්‍යන්තර අධිකාරියන් නොව නිරන්තර යෙන් නිරෝගී මානව සබඳතා පවත්වා ගන්නා දේශපාලන සැලසුම්කරණයක් විය යුතුය.

විමධ්‍යගතභාව අවශ්‍ය ඇයි?

ධනවාදය හා ධනවාදී සංස්ථානිය පදනම් වන්නේ වැඩි වැඩියෙන් මධ්‍යගතභාව වෙනුවෙනි. ධනවාදී සංවර්ධන සංස්ථානියෙන් උපන් සමාජවාදය ද මධ්‍යගත සමාජවාදය විය. ධනවාදී සංවර්ධන සංස්ථානියට පටහැනිව නවීන සමාජවාදය පදනම් කරගන්නේ විමධ්‍යගතවාදයයි. වැඩි වැඩියෙන් විමධ්‍යගතවාදයයි. එබැවින් මානව පරිසර පද්ධතියේ සුවිශේෂතාවයන් පෝෂණය බලාපොරොත්තුවේ.

පාරිසරික අර්ථයෙන් විමධ්‍යගතභාව අවශ්‍යතාවයකි. සමස්ථ ලෝක පරිසර පද්ධතිය තැනී ඇත්තේ අනන්‍ය මානව පරිසර පද්ධතිවල විවිධත්වයකිනි. මේ සුවිශේෂතාවයන් ආරක්ෂා කෙරුමට නම් සංවර්ධනය එසී පදනම් පදනම කරගෙන පැවැතිය යුතුය. එමෙසින් දැවැන්ත ඒකීය කරනය වූ පරිසර පද්ධතියන් වෙනුවට ස්වභාවය විසින් නැසීම් සහස් කරන පරිසර පද්ධති විවිධත්වයන් විමධ්‍යගතවාදය සටහේ ලැබේ.

කවදුරටත් පිට විවිධත්වය හා මානව පිට පදනම්වල විවිධත්වයද මේ මඟින් පෝෂණය වේ.

ආර්ථික අර්ථයෙන් ද විමධ්‍යගතවාදය විශාල පදනමකි. එන් අතින් සීමිත සම්පත් කාර්යක්ෂමවට හා පරිසර විනාශකාරී නොවන ලෙසත්, ශ්‍රමයෙන් අනන්‍ය නිර්මාන ඵලය ලැබෙන ලෙසත් යෙදවීමට නව නිෂ්පාදන ඒකක ඇඩා විය යුතුය. විමධ්‍යගත විය යුතුය. දෙවනුව වෙළඳපොල් සඳහාය. ඝාර්ඩ කිසියේන් සමස්ථයක් ලෙස සැලසුම්ගත තලනොවේ. සහස්කල

හැත්තේ යම්මත සා ප්‍රවීති පමණි. ඉන්ඩියේ භාවිත අගය තුල පවතින 'මානව රුචිතත්වය සහ අවශ්‍යතාව වෙළඳපොල තුල නිරූපනය විය යුතුය. මේ සඳහා වෙළඳපොල තුඩාවීම සහ විවධ්‍යගත වීම් තුල මානව අවශ්‍යතාවයන් සහ රුචිතත්වය වර්ධනයවේ. කෙවනුව අපහරන ප්‍රතිඵලය ඒවා පාලනය කලහැත්තේ සහ පරිවර්තනය කලහැත්තේ ආර්ථික පද්ධති විවධ්‍යගත වීම තුල පමණි. අවයන වශයෙන් ආර්ථික කළමණාකරනය සඳහාද විවධ්‍යගතභාවය අවශ්‍යතාවයකි.

මෙලෙස ආර්ථික නිෂ්පාදනය-වෙළඳපොල සහ පරිභෝජන අතුරුඵල ගලනය සහ ආර්ථික කළමනාකරනය යන සෑම අංශයකම විවධ්‍යගතකරනය අවශ්‍යතාවයක් වේ.

සංස්කෘතික අර්ථයෙන්ද විවධ්‍යගතකරනය අවශ්‍යය. මානව සමාජය නිර්මාන කරනයේ සහ විවිධත්වයේ අද්ඛුදවලින් පෙරට ගමන් කරන්නේ සංස්කෘතික විවිධත්වය විසින්ය. මේ සංස්කෘතික විවිධත්වය පෝෂණයවීමට නම් විවධ්‍යගත කරනයක් අවශ්‍යය. එය නිර්මාන කරනය, තෘප්තිය, මානව අධ්‍යාත්මික අවශ්‍යතා සහ විවිධත්වය පෝෂණය කරනු ඇත. විවධ්‍යගතභාවය දේශපාලන අවශ්‍යතාවයකි. ධනවාදය තුල විනාශව ගියද ප්‍රජාතන්ත්‍රවාදය තුල ඇතුරු අර්ථයක් ඇත. එනම් එක් අතකින් වැදිමි වලින් ලිහී ගිය පුද්ගලිකත්වය නිදහසේ ක්‍රියාවට නැගීමක් පෙරලා බහුමතය මත සමාජ බලය නිරූපනය කරලීමත්ය. ධනවාදය වෙස ප්‍රාග්ධනය චක්‍රයට සහ වෙළඳපොලට සාපේක්ෂව මිනිසු ලබන නිදහ මේ එක ගුණයක් වත් එයින් නිරූපනය නොවේ. පෙරලා මධ්‍යගත සමාජවාදීන් වෙන්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ද මධ්‍යගත නිෂ්පාදන බලවේග මත පදනම් වන හෙයින් එහි ඵල ලැබිය නොහැකි විය. සෑම සංවර්ධනයකම ජනතා මතය අත්‍යවශ්‍ය වේ. සැලසුම්කරණය වුව ජනතා මතය අනුව සිදුවිය යුතු අතර දියුණු සංස්කෘතික - දේශපාලනික තත්ත්වයන්ද සැලසුම්කරණයේ අවශ්‍යතාවයද ගිලිසි යනු ඇත. මානව ස්වයං පාලනය සහ තම ඉරණම තමාට නිදහසේ සමස්ථයට බාධා නොකර, ඉටුකර ගැනීම් සඳහා දේශපාලන බල ව්‍යුහයන්ද පදනම් විය යුත්තේද විවධ්‍යගත ජනතා පාලන ඒකක මතය. ප්‍රාග්ධනයෙන් මුදාගනු ලබන ප්‍රජාතන්ත්‍රවාදය මතා සම්මතය දක්වා පෙරට ගෙනයා හැත්තේ එවිටය.

<u>සමාජවාදය අවශ්‍ය ඇයි?</u>

සමාජවාදය එනම් සමූහයක් ලෙස නිෂ්පාදනය සහ පරිභෝජනය අවශ්‍ය ඇයි යන්න සලකා බැලිය යුතුය. විරස්ථායි සංවර්ධනයක් සඳහා සමාජවාදය වඩාත්ම යුදුසු සමාජක්‍රමය වන්නේ ඇයිද යන්න සලකා බැලේ. මෙහිදී සමාජවාදය ඉහතින් විස්තර කල සැලසුම්කරණයෙන් සහ විවධ්‍යගතකරණයෙන් වියේ නොවේ. හරිත සමාජවාදය අර්ථදෙනුයේම සැලසුම්ගත විවධ්‍යගතවාදය තුලය. එනම් මානව පරිසර පද්ධතියේ සමස්ථ සම්මත යන්න විවධ්‍යගත තුඩා සා ඵුහිත නිෂ්පාදන ඒකක සහ පරිභෝජන ඒකක සඳහාමය. සමාජවාදය සමස්ථය සහ සුවිශේෂතා අතර <u>සාපේක්ෂතා වය</u> උදාහරනු ඇත.

පරිසර අර්ථයෙන් ධනවාදයේ විසංවාදය නම් සමස්ථයේ පොටයක් වත මාත්වයා එය ජය ගැනීමට සැරසීමය. එහෙයින් විනාශය දක්වා අද්ඛුදයට යාමය. සීමිත මානව පරිසර පද්ධතියක වර්ධනය අත්‍යන්ත තරගත හැත්තේද ගහිත සීමිතභාවයකිනි. මානවයාගේ පැවැත්මේ නියාමයට් අනුවය. සංවර්ධනයේ සමස්ථ සීමා විසින් වර්ධනය සඳහා නොව වඩා හොඳ පැවැත්මක් සඳහා සංවර්ධනය අවශ්‍ය වේ. සම්භාව්‍ය මාක්ස්වාදය අනිවාර්යයක් ලෙස වූ හෙයින නොන්දේසි දුටුවේ ධනවාදී සංවර්ධනයේ අනවරත වර්ධනය තුලමය. එයට ඵටහැනිව හරිත සමාජවාදය ධනවාදයෙන් විනාශකාරී වර්ධනය විසින්ම පැවැත්ම සඳහා වූ සංවර්ධනයක් සඳහා වූ පීව-අපීව නොන්දේසි සිය හෙයින පදනම් ලෙස සලකයි. සීමිත මානව පරිසර පද්ධතියක විනාශයෙන් කොර පැවැත්ම සඳහා මෙයින් සමාජවාදය අනිවාර්ය වේ. එහෙයින් විනාශයෙන් කොර විරස්ථායි සංවර්ධනයක් තුල පැවැතිය හැකි එකම සමාජක්‍රමය වනුයේ සමාජවාදයය.

විශේෂයෙන් බලශක්තිය මූලික වූ නිෂ්පාදන බලවේගවල බිඳවැටීම විසින් සා මූලික ක්‍රමය නැවකක් නව වටිනා ශක්ති ලබනු ඇති අතර වෙනත් බලශක්තිමය පරිවර්තන සඳහාද එය අනිවාර්ය වනු ඇත. මෙහෙත් පැවති නිෂ්පාදන බලවේගවල භාරත වර්ධනය වෙනුවට සමස්ථ වර්ධනය යෙදවෙන විට සමාජ ක්‍රමයක් ලෙය සමාජවාදය අත්‍යවශ්‍ය වනු ඇත.

එමෙන්ම මානව සමානාත්මතා ව ඇතිවූ සමාජයන පවරාගෙ සැ බෑ අර්ථයෙන් පරිසරය වෙනද සමානාත්මභාවය ඵලනල හැතිවනු ඇත. එසේවන් පරපුර අතර සමානාත්මතාව ඇත්නම් පවරාගේ අනාගත

.....

අනාගත පරපුර වෙනුවෙන් සමාන්තීමකට එලනල හැකිවනු ඇත.

පීවවාදී සමාජවාදය දුටු මානවයාගේ රංචුවය පීව පැවැත්වෙන වේ අනුව ස්ථාපිත වනු ඇත.

මෙලෙස විරස්ථායී සංවර්ධනයක පාදිසරික අර්ථයෙන්ද තාත්ත්වික අර්ථයෙන්ද සමාජවාදී සමාජයට නව අගයන් ලැබෙන්නේය.

සමාජවාදය ආර්ථිකමය ලෙසද අතිශයින් වැදගත්වේ. නිෂ්පාදනයේදී හා නිෂ්පාදන බලවේග වල ප්‍රියකාරීත්වයේදී ආර්ථික ලෙසද යහුමින නිර්මාණ හා සාමුහික ශ්‍රමය අත්‍යවශ්‍යවේ. විරස්ථායී සංවර්ධනයකදී ආර්ථික නිෂ්පාදනය සඳහා එහෙයින් සාමුහිකත්වය අවශ්‍යවේ. එමෙන්ම අලෙවිය සඳහා වන වෙළඳ පොළ සඳහාද සමාජවාදය අත්‍යවශ්‍යය. බොහෝ විට අසන ප්‍රශ්නය. නම් පුද්ගල වර්ධනය සඳහා හාර්ඩ හා සේවා හඹායෑම සමාජයක පාලනය තල හැකිද යන්නය. ධනවාදී වෙළඳ පොළ තුල එසේ තල නොහැකිවන්නේ අසමාන පරිභෝජන තත්ත්ව විසින් නිකරම අධිපරිභෝජනය දෙසට ද්විතීයක හාර්ඩ පරිභෝජනය දෙසට යොමුවන් ඇතිවන නිසාය. සමාජවාදී වෙළඳපොල තුල මෙයට එරෙහි යාන්ත්‍රනයන් ස්වයංවම පවතී. එන් අතකින් ආදා යම් සමව ලැබීම විසින් ද්විතීයක හාර්ඩ සඳහා ඉල්ලුම අභෝසිවන අතර පරිභෝජන විෂමතා අවවර්ධම විසින් ඉල්ලුම් ප්‍රත්‍යස්ථාවද අවම වේ. එහෙයින් සම්පත් කාර්යක්ෂම ලෙස ආයෝජනය වේ. පැවැත්වේ නියමය ආරක්ෂා වේ.

එමෙන්ම සමාජවාදය තුල සූරාකෑමක් නොවන හෙයින් (හරිත සමාජවාදය තුල වස්මන් මෙන්ම අනාගත පරපුරද සූරාකෑම අභෝසි වේ.) වර්ධනය සඳහා අතිරික්තයක් ඉතිරි නොවේ. වර්ධනය සඳහා අතිරික්තයක් ලබාගන්නේ සමස්ථය වර්ධනය තුල මිස සූරාකෑම තුල නොවේ. මෙසේ හෙයින් ලාභ සිඟුන විසින් වේගයෙන් වර්ධනය වන ප්‍රාග්ධන සමුච්ඡතරාශය අභෝසිවේ. හරිත සමාජවාදය තුල සිදුවන මේ කාරක ප්‍රාග්ධනය අභෝසිවීම විරස්ථායී සංවර්ධනයක එක් තීරණාත්මක ආර්ථික පදනමක් වේ.

මෙලෙස නිෂ්පාදනයේදී – ගුවමාරුවේදී – බෙදුම පොල යාන්ත්‍රණයේදී – පරිභෝජනයේදී හා අයෝජනයේදී, සමස්ථ නිෂ්පාදන චක්‍රයේදී සමාජවාදය තුල විරස්ථායී සංවර්ධනය දෙසට යොමුවූ ස්වයං යාන්ත්‍රනයන් පවතී.

හරිත සමාජවාදයේදී සංස්කෘතිය ආර්ථිකයෙන් වියෝවූවක් නොවේ. ආර්ථික හා තාත්ත්වික නටයුතු නිර්මාණාරනය – ආර්ථික පරිභෝජනය පාලනය– පරිභෝජන විවිධත්වයන් පෝෂණය කෙරුම්– යුදු සංස්කෘතිකමය වූ අධ්‍යාත්මික හා මානසික විඥානයක් පවත්වා ගැනීම සංස්කෘතියේ අරමුණය.

සංස්කෘතිය යනු සාමුහික මානසිකත්වයකි. එම සාමුහික මානසිකත්වය ප්‍රබෝධනය වන්නේත් එය ආර්ථික සාමුහිකත්වය සමඟ සිය සජීවී ප්‍රතිබද්ධතාව වූ චතුර්විධ සබඳතා ඵේෂනය කරගන්නේත් සමාජවාදය තුල පමණි. ධනවාදය තුල අධිපති සංස්කෘතිය පීඩනයට හසුව පීඩාවිඳී සියළු සංස්කෘතීන් නිදහස ලබන්නේත්, පුද්ගලික කරුණු බවට පහත හෙලනු ලැබූ, ගුවමාරු වටිනාකම් බවට බිඳ දමනු ලැබූ සියළු සංස්කෘතික වටිනාකම් ඒවායේ නිසි ස්වරූපයෙන් පෙනී සිටින්නේත් සමාජවාදය තුල පමණි. මා නවවාදී සමාජවාදීන් හා ජාතිකවාදී සමාජවාදීන් විසින් සිය න්‍යායධර්ම වූල පදනමක් කරගනු ලැබුවේද සමාජවාදය හා සාමුහික මානසිකත්වය වන සංස්කෘතිය අතර පවතින මේ අවියෝජනීය සබැඳියාව නිසාය. ප්‍රායෝගික මධ්‍යගත සමාජවාදය තුල ආර්ථිකය ප්‍රාථමික ලෙස ගැනීම නිසා මේ සබැඳියාව බිඳ වැටින. එහෙත් එය පීවමය සබැඳියාවක් බවට නැවැත පත්කල හැකිවනු ඇත. ධනවාදය විසින් බිඳලනු ලැබූ විඥානය් බව නැවැත ඔහුට ලැබෙනු ඇත.

දේශපාලනයේ අත්‍යවශ්‍ය කොන්දේසිය වනුයේ සමස්ථය ගැන සැලකිලිමත්වූ බහුකරයාගේ හෝ අවසාන වශයෙන් සමස්ථ මානවයාගේ නැ මැත්ත මත පදනම් වූ ප්‍රාලනයක් රැගෙන යාමය. විමධ්‍යගතවාදය තුල මුදා හරින ප්‍රජාතන්ත්‍රවාදය එහි ඇබ්බැහි සැබෑ අර්ථයෙන් පිටතර දමන්නේ හා අර්ථවත් වන්නේ සමාජවාදය තුලය. ස්වයංපාලිත මානවයාගේ සමාජයක් දක්නා ඡේතිය බැමිවලින් වියුත්තව මානවයාට ගමන්කල හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදය සමඟ යෙදීමෙනි. ජනතාව විසින්. තමන්ගේ සංවර්ධනයේ මග පිළිබඳ තීන්දු ගැනීමේ ප්‍රාථමික අධිනිය මේ මගින් ජනතාවට ලැබෙන්නේය. ධනවාදී ප්‍රාග්ධනය විසින් පරාරෝපරාය තල අනෙක් අතින් වානග තල මානව නිදහස නැවැත මානවයාට ලැබෙන්නේය. එමෙන්ම බලය ඇත්තා විඳීමද සීමිත පිරිසකට සිමානොවී සමස්ථයට ලැබීම විසින් එතෙක්

.....

බලය ලැබූවන්ගේ පීඩනය මෙන්ම බලය අයිති නැවුන්ගේ පීඩනයද අයෝජි වී යන්නේය. සැ මට ස ම හැනියවන් අනුව සමාජයට හා තමාටම සේවය කල හැකිවනු ඇත.

විකල්ප ආර්ථිකය

මෙතෙක් ධනවාදී සංවර්ධන සංස්කෘතිය තුල ආර්ථිකය හා ආර්ථික විද්‍යාව නමින් වෙනම දැනුම් පද්ධතියක් පැවතිනා. අර්බුදය ඉදිරියේ පරිසරය හා පරිසර විද්‍යාව නමින්ද කවත් දැනුම් පද්ධතියක් ගොඩනැගින. අර්බුදය කවත් උත්සන්න වෙතීම මේ වෙන වෙනම වූ දැනුම් පද්ධති දෙක සාත්ත්‍රිකව එක් කරන්නටද වෑයම් තෙරේ.

එහෙත් ධනවාදය තුල වේ ක්‍රියාවලිය ඉටුකරගත නොහැකි විසංවාදයක්ව පවතින බව අප විසින් පෙන්වා දී ඇත.

ඔදින ආර්ථික විද්‍යාව යනු ධනවාදය තුල බිහිවූ පරිසර විද්‍යාවේ හා දේශපාලන ආර්ථික විද්‍යාවන්ගේ සරල එකතුවක් නොවේ. එය නව විකල්පයන දේශපාලන ආර්ථික විද්‍යාත්මක සිද්ධාන්ත පෙලයි. මේ අනුව එය ධනවාදී ආර්ථිකය විවේචනය කරන අතර එහි අර්බුදයද පෙන්වා දෙයි. එනැහින් නොනවතින එය ගොඩනගන සමාජයේ පැහැනඩන් බවට පත්වේ.

ඔදින ආර්ථික විද්‍යාවේ සිද්ධාන්තික පදනම් සංක්ෂිප්තව විස්තර කර ඇත.

මේ අනුව ඔදින ආර්ථික විද්‍යාව සිය වටිනාකම් නිරූපණ කරලීමේදී ප්‍රාරම්භික කරගන්නේ පිට-අපිට පරිසර වස්තුයි. එහි ගතික සමතුලිතතාවයයි. ඒ අනුව එය නිෂ්පාදනය හා එහි ආහාර දෙන (ප්‍රාථමික - ද්විතියික) හා ඒවා අතර චතුර්විධ සබඳතා දනී. පෙරලා පරිභෝජනය හා එහි ආහාර දෙන (ප්‍රාථමික-ද්විතියික) හා ඒවා අතර චතුර්විධ සබඳතා මෙන්ම පැවැත්මේ නියාමයද පැහැදිලි කරයි. එමෙන්ම නිෂ්පාදන ආහාර හා පරිභෝජන ආහාර අතර චතුර්විධ සබඳතා ද එලෙසම දනී.

සවිස්ථ වටිනාකම

ධනවාදය වටිනාකම් දෙනුයේ නිෂ්පාදනයට නොව භුවමාරුව සඳහා වන නිෂ්පාදනයටය. එමෙන්ම එය වටිනාකම් දෙනුයේ අතීත - වර්තමාන - අනාගත ලෙස නොව වත්මන් ශෝධිතත්වයට පමණි.

මෙයට ප්‍රතිපක්ෂව ඔදින ආර්ථික විද්‍යාව සමස්ථයට වටිනාකම් දෙයි. එය භාණ්ඩයක සාධිත අගය මෙන්ම එහි පරිවර්තන අගයද ඒවායේ සමස්ථයද යලහ බලමින් සමස්ථ වටිනාකම් පද්ධතියක් නිහිකරයි.

එමෙන්ම ඔදින ආර්ථික විද්‍යාව භාණ්ඩයක හෝ සේවාවක මැනිය හැකි අගය (අන්තර්ගත ද්‍රව්‍යමය ප්‍රමාණය - එය පරිවර්තනය කල හැකිද - අන්තර්ගත බලශක්තිය හා අඩංගු පුනර්ජනීය නොවන බලශක්ති ප්‍රමාණය - අන්තර්ගත ශ්‍රම ශ්‍රමය හා ප්‍රවීන ශ්‍රමය - පරිභරනයේදී වැයවන ශක්තිය හා අමුද්‍රව්‍ය - පරිසර දූෂණ අගය - අපද්‍රව්‍ය අගය හා සමාජමය අගය - ප්‍රාථමික ද්විතියකතාව ආදී....) මෙන්ම මැනිය නොහැකි සංස්කෘතිකමය අගයන්ද පවතින බව පිළිගනී. ඔහෝ මැනිය හැකි වටිනාකම් පවා අවශ්‍යතාවී සංස්කෘතිය තුල වටිනාකම් ලබාදිය යුතු. මේ අනුව සවිස්ථ වටිනාකම් නම් මැනිය හැකි මැනිය නොහැකි වටිනාකම් වල සමස්ථයය.

භුවමාරු වටිනාකම් විවිධත්වය :

ධනවාදී ආර්ථිකය තුල භුවමාරුව සඳහා එකම පදනම් ලෙස යොදාගන්නේ මුදලය. එහෙත් මුදල්වලටම ඌනනය කල නොහැකි තවත් වැදගත් භුවමාරු අගයන් පවතී. ඒවානම් ශක්ති ප්‍රභවය තුල පවතින බලශක්තිය හා මානව ශ්‍රමයයි.

සාමාන්‍යයෙන් පරිසර පද්ධතිය තුල පවතින අපිටමය පදනම් ප්‍රමාණාත්මකව සිමිත වන අතර තවද පරිවර්තනයකදී වුව මේ ප්‍රමාණාත්මක අගය විනාශ නොවේ. එහෙත් මානවයාට සාපේක්ෂව එහි ගුණාත්මක අගය - අසංවිධානාත්මව - පරිභරනයට අප්‍රයුක්තිමේ ගුනය - පිරිහී යා හැක. සවිස්ථ යන් ලෙස ද්‍රව්‍යමය පදනම් ප්‍රමාණාත්මකව වෙනස් නොවන මුත් එය සතුව ඉහත අර්බුදය ඇත. ධනවාදය භුවමාරුවේදී මේය සහමුලින් අවතක්සේරු කරයි.

..../

පෙරලා අපිවමය පදනම් පිවමය හා එසේ නොවෑහ පදනම් බවට පෙරලන්නේ ශක්ති ප්‍රභවය මගිනි. බලශක්තිය හා කාලය ශ්‍රමය මගිනි.

ශක්ති ප්‍රභවය පිළිබඳවද ගුරුත්වජ අගය පිහිටියේ නියාමය බලපවත්වයි. එනම් එක් පරිවර්තනයක් සිදුනල පසු එය පූර්ණ ලෙස ප්‍රතිවර්ත්‍ය වෙරුවට මුල් පරිවර්තනයට වඩා වැඩි ශක්තියක් අවශ්‍යවීමය. (කාපශක්ති දෙවන නියාමය) වෙය පෙරලා අපිවමය පදනම්වල ගුරුත්වජ අගය පිරිසිදු සමඟ යාවූ බැදී ඇත.

ධනවාදය ශක්ති ප්‍රභවයේ අගය මුදලට උනහය තර ඇත

භෞතික ආර්ථික විද්‍යාව මේ කරුණ විගහැර ගැනීම සඳහා යුවමහරු ඒහා වල විවිධත්වයන් යෝජනා කරන අතර ඒවා එහිනෙහාට පරිවර්තනය කරගත හැකි පරිවර්තන හැකියාවක්ද පෙන්විය යුතුය. එනම් මුදල්වලට අමතරව යාවූ ශ්‍රමය හා බලශක්තිය ද ඒහා වශයෙන් සොදාගැනීවය.

ඉංජිනේරුමය කාර්යයන් සඳහා පරිවර්තන හැකියාව ලෙස බලශක්තියට සියල්ල උනහය කරගැනීම වැදගත්වේ. එසේම එය පරිසර පදනම් වලින් අරඹා නැවත පරිසර පදනම් දක්වා වූ පූර්ණ නිෂ්පාදන චක්‍රය තුල වැය වූ සම්පූර්ණ බලශක්තිය නිරූපනය කල යුතුය. එනම් සමස්ථ බලශක්තියය.

බොහෝ ක්‍රියාවල ප්‍රතිඵලය බලශක්තියට උනහය කල නොහැකි නිසා මෙය බලශක්ති ප්‍රභව හා ඉංජිනේරුමය තටයුතු සඳහා සොදාගත හැක.

සමාජීය අර්ථයෙන්ද, නිෂ්පාදනීයත්ව ආදිය තුලද වැදගත් වන්නේ ශ්‍රමයයි. එනම් නිෂ්පාදන චක්‍රය තුල වැයවන සමස්ථ ශ්‍රමයයි. සමන ශ්‍රම ඒකක වල සුවහරුවයි. ප්‍රවීන ශ්‍රමය තුලද ගැබ්ව ඇති යාවූ ශ්‍රමය මේ අනුව සොයා ගත හැක.

සැමදෙනා වැඩෙහි නියලිවත්, සැමදෙනාට වැඩ අනුව ගෙවීමත් සඳහා සමස්ථ ශ්‍රම අගය දැනගැනීම අතිශයින් වැදගත්වේ.

මුදල් ඉතිහාසය තුල බිහිවුයේ සුනමය සරල අනාගතය සඳහාද වටිනාකම් රැගෙන යන ගුනයන් සැටිකරගත් හුවමාරු මාධ්‍යයන් ලෙසය. ධනවාදය මුදල්වලට සියල්ල උනහය කලේය. කාරක වටිනාකම් පෙන්වන්න වූයේද මුදල්ය.

මෙයට ප්‍රතිපක්ෂව භෞතික ආර්ථික විද්‍යාව මුදල්වල පවතින සාධනීය අංග රැහගනිමින්ම එය වෙනත් තලයකට රැගෙනයයි. එනම් සමස්ථ වටිනාකම් නිරූපනයන් ලෙසය.

මේ අනුව ප්‍රාග්ධනය නමින් වූ කාරක අගය ගොඩගැසීම භකර වේ. ඒ වෙනුවට සමස්ථ ප්‍රාග්ධනයන් බිහිවේ. එය පුද්ගල සන්තක නොවන අතර සමාජ සන්තක වේ. මේ සමස්ථ ප්‍රාග්ධනය භැසිරවීම සැලසුම්කරණය සමඟද බැඳෙන්නේය. එහෙයින් නව ජනකායාදි බැංකු ක්‍රමයන් බිහිවේ.

මුදල් සෙසු ඒහා වන ශ්‍රමය හා බලශක්තියට පරිවර්තනය කල හැකි අතර සංස්කෘතිකමය වටිනාකම් වෙනම පවත්වා ගනු ඇත.

විභල්ප ආර්ථිකයන් තුල පවතින සුවිශේෂතාද වටහාගත යුතුය. සමස්ථයන් ලෙස එය සමස්ථ වටිනාකම් නියම කරලීම සඳහා පදනම් සිද්ධාන්ත ගොඩනගයි. එමෙන්ම එය ධනවාදයට ප්‍රතිපක්ෂව නව කාර්මික පද්ධතියන්, කෘෂිකාර්මික පද්ධතියන් බිහිකරයි.

විභල්ප කාර්මික පද්ධතිය – භෞතික කාක්ෂරාය

භෞතික කාක්ෂරාය නව සිද්ධාන්ත හා පදනම් මත සිටගනී. යාන්ත්‍රික ක්‍රියාවලියක් ඵලදායකත්ව ය මනිනු ලබන්නේ නිෂ්පාදන චක්‍රයෙහි සමස්ථය හා ගණික සමතුලිතතාවට අනුවය. මේ අනුව පරිසර පද්ධති වලින් උනහ ගෙන පරිසර පද්ධතිවලට අපහරනය වනතෙක් සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලියම, සමස්ථ ආයුකාලයම සලකා වටිනාකම් නියම කෙරේ. සමස්ථ වැයවූ ශක්තිය සහ ඵලය සලකා සමස්ථ කාර්යක්ෂමතාව මනිනු ලැබේ. සමස්ථ වැයවූ ශ්‍රමය හා ඵලය සලකා සමස්ථ නිෂ්පාදනීයත්ව මනිනු ලැබේ. මේ අනුව කාර්මික පද්ධතිවල යථෝක්තව පිලිබඳ මෙතෙක් මානව ඉතිහාසය තෙපෙරලන ලද නව පරිවර්තේදයක් විටහන වනු ඇත. භෞතික කාක්ෂරායේ පදනම් ගොඩනැගෙනුයේ මේ නව්‍යත්වය තුලිනි.

..../

ප්‍රායෝගික ලෙස පවතින සල්පැනගිය සාප්ෂරය සමඟ වුහුදාව මුහුණ දිනල්ප සහිත සාප්ෂරය යෙදවිය යුතු ආකාර සහ ඒවායේ ගුණාත්මක වෙනස්කම් සලකා බලමු.

1. පරිසර සහජීවනය

පවතින සාප්ෂරයේ ඉලක්කය පරිසරය ජයගැනීමය. එනම් එය අවධාරණය කරන්නේ පරිසර පද්ධති වලින් වැඩි වැඩියෙන් උකහාගැනීම පිළිබඳවය.

විනල්ප සහිත සාප්ෂරය මෙයට පටහැනිය. එය මූලිකව පරිසරය සමඟ මානවයාගේ ඇති අවියෝජනීය සබඳතාවයක් වෙන්කල නොහැකි සමස්ථයක් දකී. සමස්ථයේ කොටසකට විඥාණයෙන් තොරව සමස්ථය ජයග්‍රහණය කල නොහැකි යන සහිත සිද්ධාන්තය අනුව එය පරිසරය සමඟ සහජීවනය පතයි.

එමෙන්ම පරිසර පද්ධතිවලින් උකහාගැනීම - පරිභෝජනය - අපද්‍රව්‍ය කරනය යන නිෂ්පාදන ව්‍යුහයේ සමස්ථයම සැලකිල්ලට ගනිමින් සිදුකරන සමස්ථ උකහාගැනීමක් සිදුකරයි.

